# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,853 — 1969 මැයි 9 වැනි සිකුරාද — 1969.5.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 691 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 713 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 724 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 736 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 737 | විවිධ දැන්වීම් ... ... | 740 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

අංකය : ඒබී. 47/එක්ස්. 2080/68.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම නිලධාරි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් එවනු ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්‍යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 24 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 30 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දා වූද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්‍යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්‍යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම පත්වීම ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක ආධුනික කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : අවුරුද්දකට රුපියල් 4,080න් පටන්ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12කින් හා රු. 480 වැඩිවීම් 10 කින්ද යුක්තව රුපියල් 13,200 දක්වා වැඩිවී යයි. (රු. 8,400 සහ රු. 11,760 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කාර්‍යක්ෂමතා කඩඉම් ඇති අතර රු. 11,280 වැටුප් තලයේ මත දෙවර්ෂයක රැඳීමක් ද වේ.)

**සටහන :** රු. 8,400 පෙර නියමිත කාර්‍යක්ෂමතා කඩඉමෙන් උසස් කරනු ලැබීමට සුදුසුවීම සඳහා සියලුම නිලධාරීන් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත්විය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1969 මැයි මස 24 වැනි දිනට අවුරුදු 22ට වැඩි සහ අවුරුදු 27ට අඩු බව.

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ 1 වන හෝ 2 වන පෙළ ගෞරව උපාධිධරයකු බව.

සැ. යු.—ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන්ද අයදුම් පත් භාරගනු ලැබේ. එහෙත් විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිඵල නිකුත් කළ වහාම එම පරීක්ෂණයෙන් තමා සමත් වී තිබේද යන වග ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම්, ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොඑලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහා චාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

10. අංක 14,801 හා 1968 මැයි 10 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට පිළිතුරු වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ අය නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේදීය,
තැ. පෙ. 500.

5-95/2—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

අංක : ඒඒ. 27/එක්ස්. 2082/69.

## තැපැල් සහ විදුලිසන්දේශ දෙපාර්තමේන්තුව

### ඉංජිනේරු තනතුර

### විදේශ විදුලිසන්දේශ සේවය

තැපැල් සහ විදුලිසන්දේශ දෙපාර්තමේන්තුවේ විදේශ විදුලි සන්දේශ සේවයේ ඉංජිනේරු තනතුරක් සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායාීලයයෙන් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රවල වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනවල හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 24 වැනිදා.

(ආ) පිටරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 30 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ආකෘතිපත් තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට, අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකු ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නො ගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර, විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කායාීලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කායාීලයයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වේ. රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරාගනු ලැබුවහොත්, නියමිත කාලයකට තනතුරේ වැඩ බැලීම සඳහා පත්කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය වර්‍ෂයකට රු. 5,160—3×360—6,240/6,960—4×360, 10×480—රු. 13,200 වේ. වාර්ෂික වැටුප රු. 11,280 දී දෙවර්‍ෂයක නැවතීමක් සහිතයි. (වර්‍ෂයකට රු. 6,960 දී හා රු. 11,280 දී කායාීක්ෂමතා කඩඉම් වේ.)

**සටහන :**

(i) කායාීක්ෂමතා කඩඉමක් සේ සැලකෙන වර්‍ෂයකට රු. 10,800 වැටුප් තලය පසුකර යාමට පළමු සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් අවශ්‍යය.

(ii) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු දෙපාර්ත මේන්තුවට බැඳෙන නිලධාරියකු වර්‍ෂයකට රු. 7,320කට නොඅඩු වැටුපක තැබීම සඳහා සුදුසු වේ.

(iii) රු. 7,320 වාර්ෂික වැටුපට එළඹීමට පෙර සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගන්නා නිලධාරියකු එම සුදුසුකම් ලත් වහාම එම වැටුප් තලයේ තැබීම සඳහා සුදුසු වේ. කෙසේ වතුදු, වැටුපෙහි කරනු ලබන එබඳු හරිගැස්සීම් නිලධාරියාගේ ශ්‍රේණියේ අදාළ ජ්‍යෙෂ්ඨතාවය කෙරේ බල නොපානු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1969.5.24 දිනට තම වයස අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 26කට නොවැඩි බව. (පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත් ඉංජිනේරුවන් සඳහා උපරිම වයස් සීමාව ලිහිල් කරනු ලැබේ.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු උපාධියක් ඇති බව. අවසාන වර්‍ෂයේ විෂයයන් වශයෙන් ඉලෙක්ට්‍රොනික්ස් හා ටෙලිකොමියුනිකේෂන්ස් හැදෑරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

**හෝ**

(ii) විදුලි ඉංජිනේරුවන්ගේ (ලංඩන්) ආයතනයේ පරීක්ෂණයේ I, II, III යන කොටස්වලින් සාමාර්ථයක් ඇති බව. ඉලෙක්ට්‍රොනික්ස්, ලයින් කොමියුනිකේෂන්ස් සහ රේඩියෝ කොමියුනිකේෂන් යන විෂයයන් හැදෑරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) අයදුම්කරුවන්ට සෑහෙන කාර්මික ක්‍ෂමතාවක් තිබිය යුතුය. මේ බව නිගමනය කිරීම සඳහා තේරීමේ මණ්ඩලය විසින් පරීක්‍ෂණයක් පැවැත්වීමට විධිවිධාන යොදනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට හැම අපේක්‍ෂකයකුම සූදානම්ව සිටිය යුතුයි :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්‍ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචායාීවරයාගෙන් හෝ මහාචායාීවරයාගෙන් ලත් එකක් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික් සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන :**

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. **විදේශ පුහුණුව.**—(i) පත්කර ගනු ලබන්නා, එක්සත් රාජධානියේ හෝ වෙනත් සුදුසු විදේශ රටක පිළියෙල කර දෙනු ලබන විශේෂ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කළ යුතු වන්නේය.

(ii) විදේශ පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළදී, එවකට බල පැවැත්වෙන රජයේ රෙගුලාසි අනුව පඩිනඩි ගෙවනු ලැබේ.

(iii) **ගිවිසුම.**—තෝරාගනු ලබන සෑම අයදුම්කරුවකුම, අනිකුත් කරුණු අතර, නියමිත අභ්‍යාස පාඨමාලාව විශ්වාසවන්ත ලෙස හා උද්‍යොගිමත් ලෙස හැදෑරීමටත්, සතුටුදායක අන්දමින් සම්පූර්ණ කිරීමටත්, පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් පසු දිවයිනට ආපසු පැමිණීමෙන් පසු, නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් (මෙය රජය විසින් නිගමනය කරනු ඇත) ලංකාණ්ඩුවට සේවය කරනු ලබන බවටත්, ගිවිසුමේ කොන්දේසි හා වගන්ති පිළිපැදීමට අපොහොසත් වුවහොත්, අභ්‍යාස පාඨමාලාවේ වටිනාකම (එනම්, වැටුප, දීමනා හා යානපත්‍රවල වටිනාකම ආදී වශයෙන් ලංකාණ්ඩුවේ අරමුදලින් හෝ/හා වෙනත් ඕනෑම විදේශ රාජ්‍යයකින් හෝ සංවිධානයක අරමුදලින් දරනු ලබන) ආපසු ගෙවනු ලබන බවටත් පොරොන්දු වෙමින් ලංකාණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

7. ඉංජිනේරුවකු සිය ආධුනික කාලය තුළ, සවකීය යහපත් පැවැත්ම, පුහුණුවීමේ ප්‍රගතිය, රාජකාරීවල ව්‍යාවෘතවීම හා මෙහි දක්වා ඇති කොන්දේසි සපුරාලීම යන මේ කරුණු සම්බන්ධයෙන් පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂගේ සතුටට හේතුවන පරිදි කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, ඕනෑම අවස්ථාවක සේවයෙන් අස් කළ හැකි වන්නේය.

8. **පෙරළා ලංකාවට පැමිණි පසු.**—ඉංජිනේරු ශ්‍රේණියේ ස්ථිර කිරීම රඳා පවත්නේ, අනිකුත් කරුණු අතර, සළසා දෙනු ලබන පුහුණුවට අයත් නියමිත පරීක්ෂණවලින් සමත්වීම, පුහුණුව ලබන කාලය තුළ හා ඉන් පසුවත් ඔහුගේ හැසිරීම හා කායාීක්ෂමතාවය යන කරුණු මතය.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත්‍ර, සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත කාල පරිච්ඡේදයෙන් පසු මෙම කායාීලයයට ලැබෙන අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඉදින් ඒවා නියමිත දින හෝ ඊට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ප්‍රමාදය සම්බන්ධයෙන් සෑහෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් පමණකි.

10. අයදුම්පත් හා ඒ හා සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

11. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කායාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධිවිධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් 28 වැනි දින,
කොළඹ, ගාලු මුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායාලයේ දීය.
තැ. පෙ. 500.

5–95/4—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 36/එක්ස්. 2083/69

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### පර්යේෂණ ආයතනයේ ඉංජිනේරු හු විද්‍යාඥ තනතුර

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු හු විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙනසේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 24 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 30 වැනිද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දවූ ද මුද්දර නොගැසූවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කායාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි.**—මේ තනතුර, ස්ථිර, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම අවුරුදු 3 ක කාලයකට පරීක්ෂණයට යටත් වය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : වර්ෂයකට රු. 4,080—360×12, 480×10—13,200 (රු. 11,280 දී දෙවර්ෂයක නැවතීමක් දී රු. 8,400 හා රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද වෙයි).

(ii) පත් කරනු ලබන නිලධාරියා පිළිගත් විශ්ව විද්‍යාලයක භූ විද්‍යාව පිළිබඳ එම්.එස්.සී. උපාධිය ලබා තිබේ නම්, ඔහුට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 5,160 ක ආරම්භක වාර්ෂික වැටුපේ තබනු ඇත.

**සටහන.**—පත් කරනු ලබන නිලධාරියා ලංකාවේදී සහ/හෝ පිටරට දී තමාගේ විද්‍යා අංශයේ, නියමිත පශ්චාත් උපාධියක් හෝ උසස් තත්ත්වයේ ඩිප්ලෝමාවක් හෝ සඳහා ඉගෙනගෙන, ඉන් සමත්වන තෙක් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 8,400 වැටුප ඉක්මවා ගිය නොහැක.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.5.24 වැනි දිනට අවුරුදු 20 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක භූ විද්‍යාව පිළිබඳ පළමුවන හෝ දෙවන පන්තියේ බී.එස්.සී. (ගෞරව) විශේෂ උපාධියක් ලබා තිබීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කායාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය.
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායාලයේදීය.
තැ. පෙ. 500.

5–95/5—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

අංකය : ඒබී. 64/එක්ස්. 2084/68

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුර

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 24 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 මැයි මස 30 වැනිද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දවූ ද මුද්දර නොගැසූවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : රු. 8,880—480×5—රු. 11,280.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) (i) විධායක තනතුරක අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව, හෝ

(ii) අඩු වශයෙන් පිළිවෙලින් අවුරුදු 3 ක හා අවුරුදු 6 ක පළපුරුද්දක් ඇති සුප්‍රීම් උසාවියේ අද්වකාත්වරයෙකු හෝ පෙරකදෝරුවකු නැතහොත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් ඇති අයෙකු බව,

(සී) 1969 මැයි මස 24 වැනි දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව.

**සටහන.**—රජයේ සේවකයින් කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඩී) අයදුම්කරුවන්ගේ උස අඩි 5 අඟල් 6 ට (සපත්තු මෙස් නොමැතිව) නොඅඩු විය යුතු අතර, පපුවේ ප්‍රමාණය (ප්‍රාශ්වාස) අඟල් 34 ක් විය යුතුය. ඔවුහු මනා ශරීර සෞඛ්‍යයෙන්ද, පෞරුෂත්වයෙන් ද, යුක්ත විය යුතුය.

(ඊ) ඔවුහු (ඇස් කණ්ණාඩි නොපැළඳ) "ඒ. 2" සම්මත අක්ෂි දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

**සටහන :**

(i) (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වූද, ආරක්ෂක රාජකාරි පිළිබඳ විධායක තනතුරක අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇත්තාවූ,

හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වූද, ආරක්ෂක රාජකාරි පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්දකින් අඩු ගණනේ අවුරුදු 5 ක්වත් විධායක ශ්‍රේණියක සේවය කර ඇත්තාවූ,

හෝ

(ඇ) ආරක්ෂක රාජකාරි පිළිබඳ අවුරුදු 15 ක පළපුරුද්දකින් අඩු වශයෙන් අවුරුදු 10 ක්වත් විධායක ශ්‍රේණියක සේවය කර තිබෙන්නා වූ,

දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන්, සහකාර ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරෙහි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී ඇත්නම්, මේ තනතුර සඳහා සළකා බැලීම සුදුසු වේ.

(ii) ක්‍රීඩා පිළිබඳ දක්ෂතාවයක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

(iii) දෙපාර්තමේන්තු සේවකයින්ගෙන් බලාපොරොත්තු වන ඇස් පෙනීමේ ප්‍රමාණය "ඒ. 4" වේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් වියයුතුයි :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහා චාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් විසින් තමතමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිළධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවක් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමතමන්ට නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධ යෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

5- 95/6—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

සැදැහුම : සාප/3/208.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුරු සඳහා පහත දක්වා ඇත් සුදුසුකම් ඇත් ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ අයදුම් පත් 1969 මැයි 30 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ '' සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර '' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි. (මෙම ඇබෑර්තු ඇත්තේ අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේය.)

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇත් බවට පළගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(i) 1969.5.30 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40 ට නොවැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ; හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව ; සහ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යා උපාධියක් ලබා තිබීම (ගෞරව සහිතව වඩා හොඳයි) ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ ; හෝ

(v) සිවිල් ඉංජිනේරු ආයතනයේ සහවර සාමාජිකත්ව විභාගයේ 1 වැනි සහ 2 වැනි කොටස් වලින් සාමාර්ථයක් ලබා තිබීම. (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත් අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) ; හෝ

(vi) සිවිල් ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව. (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්ද ඇති අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) ; හෝ

(vii) ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු විද්‍යාව සඳහා සන්ධ්‍යා සහතිකය සහ 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද (පහත II වැනි සටහන බලන්න.) ; හෝ

(viii) ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සවල්) සහතිකය හා 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද (පහත II වැනි සටහන බලන්න) ; හෝ

(ix) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය හා 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද (පහත II වැනි සටහන බලන්න) ; හෝ

(x) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන I.**—සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. නැත හොත් පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුලත දී සිංහලෙන් ඉගැන්වීමේ පුළුවන් කමක් ලබාගත යුතුය.

**සටහන II.**—පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසරකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ඇත.

4. මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 සහ 180 × 8—5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින් සමත් විය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානයාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්.

(**සැලකිය යුතුය.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම හුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරි යොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ඉල්ලුම් පත්‍රය

(අගල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසිවල සකස් කළ යුතුයි)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

### සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර

සැදැහුම—සාප/3/208

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————. (මහතා/මහත්මිය/මෙනවිය)

2. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

3. ජාතිය :————.

(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන් ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස —
අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය —
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ/ඇගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

(ආ) විවාහක නම්, (අ) විවාහ වූ දිනය :————.
(ආ) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසැලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ —

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර —

(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ? —

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.

(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණ ද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා —

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි දින වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.

(ii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.

(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

5–197/1—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

සැදහුම : සාප/3/212

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### විදුලි ශිල්පය පිළිබඳ උපදේශක තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි විදුලි ශිල්පය පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ අයදුම්පත් 1969 මැයි 30 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ "විදුලි ශිල්පය පිළිබඳ උපදේශක තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙක්ම පහත දක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1969.5.30 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදාල නොවේ) ;

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මහා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් ; හෝ

(ඇ) ඊට සමාන හෝ විභාගයකින් සමත්ව සිටින බව ; සහ

(iv) විදුලි ශිල්පීන්ගේ වැඩ හෝ ගුවන් විදුලි යන්ත්‍ර සේවා වැඩ පිළිබඳ ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ සහතික ලබා ඇති බව ; හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විද්‍යුත් හා යාන්ත්‍රික) සහතිකය ලබා ඇති බව ; හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ විද්‍යුත් ඉංජිනේරු (සන්ධ්‍යා) සහතිකය ලබා ඇති බව ; හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා ඇති බව ; සහ

(viii) අපේක්ෂකයින්ට සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීමේ දින සිට අවුරුදු 3 ක් ඇතුලත සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබාගත යුතුය.

4. (i) මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 සහ 180 × 8—5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින් සමත් විය යුතුය.

(ii) පත් කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පලපුරුද්දක් ඇති අයකු තෝරාගනු ලැබුවහොත්, ඔහු විසින් අවශ්‍ය පලපුරුද්ද ලබාගන්නා තෙක් වාර්ෂිකව රු. 3,420 ක නියමිත වැටුපක් සහිත වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ඇත.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම්පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීමට සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්.

(**සැළකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1969 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල සකස් කළ යුතුයි)

### විදුලි ශිල්පය පිළිබඳ උපදේශක තනතුර සඳහා අයදුම් පත්‍රය

සැදැහුම :—සාප/3/212

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————. මහතා/මහත්මිය/මෙනවිය

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (i) විවාහකද ? අවිවාහකද? වැන්දඹුද ? :————.
(ii) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමග :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද ? :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානුව සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණ ද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද ? :————
(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

5–197/2—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

සැදහුම : සාප/3/211.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ගණිතය පිළිබඳ උපදේශක තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි ගණිතය පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ අයදුම් පත් 1969 මැයි 30 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ ඉහළ වම් කෙළවරේ '' ගණිතය පිළිබඳ උපදේශක තනතුර '' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි. (මෙම ඇබෑර්තුව ඇත්තේ අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—
(i) 1969.5.30 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදාල නොවේ).
(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව, සහ
(iii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය හා ව්‍යවහාරික ගණිතය සහිත විද්‍යා උපාධියක්, සහ
(iv) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබිය යුතුය. නැතහොත් පත්වීමේ දින සිට අවුරුදු 3ක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමට හැකියාව ලබා ගත යුතුය.

සටහන.—ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුදුකම් තිබීම අතිරේක සුදුසු කමක් වේ.

4. මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 සහ 180 × 8—5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යැමට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමත් විය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙලින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ). ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුළත්වීම සඳහා උපකාක පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය, හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3ක්,

(සැළකිය යුතුය.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡෙදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය).

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡෙදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අප්‍රේල් 30 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අගල් 8½ × 13½ ප්‍රමාණය ෆුල්ස්කැප් කඩදසි වල සකස් කළ යුතුයි)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

### ගණිතය පිළිබඳ උපදේශක තනතුර සඳහා අයදුම් පත්‍රය.

සැඳහුම : සාප/3/211

1. සම්පූර්ණ නම (පැහැදිළි ලෙස ලියන්න) :————. මහතා/මහත්මිය/මෙනෙවිය

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න).

5. උපන් ස්ථානය : —
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහක ද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, (අ) විවාහ වූ දිනය :————.
(ආ) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න : ————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද ?
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුය් වල ප්‍රමාණය කොපමණ ද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත හටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
(i) දරණ ලද තනතුරු:————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න : ————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? : ————.
(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය: ————.
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුව හොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–197/3—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### සහකාර ෆෝර්මන් තනතුර

පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය පරිදි සකස්කොට කොළඹ 5, නාරාහේන්පිටිය, ප්‍රවාහන පොලිස් කාර්‍යාලය, ප්‍රවාහන පොලිස් අධිකාරී වෙත 69. 6 .1 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි කල තැපෑලෙන් එවිය යුතුය.

3. **වැටුප් ක්‍රමය :**—වර්ෂයකට රු. 1860/- කින් පටන් ගෙන රු. 120/- බැගින් වාර්ෂික වැටුප් වර්ධකයකින් යුතුව රු. 3,780/- තෙක් වැඩිවේ. රු. 2,820/- සහ රු. 3,630/- ට පෙර කාර්‍යක්ෂමතා කඩ ඉමක් ඇත. රජයේ රෙගුලාසි අනුව ගෙවල් කුලී දීමනා, ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා ගෙවනු ලැබේ.

4. **වයස් සීමාව :**—1969.6.1 වෙනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**සැ. යු. :**—මෙම තනතුර සඳහා අවශ්‍ය අන්‍ය සුදුසුකම් ඇති සේවා මුක්ත භටයන්ට සහ බ්‍රිතාන්‍ය කඳවුරු සේවයේ හිටපු නිලධාරීන්ටද සාමාන්‍ය අනුග්‍රහයන් භුක්ති විඳීමට ඉඩදෙනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම් :**—(අ) අයදුම්කරුවන්—

(i) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයෙකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී සිටීම සහ

(ii) පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ අඩුම වශයෙන් අවුරුදු 10ක පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් අඩුම වශයෙන් අවුරුදු 3ක පරිපාලක තත්ත්වයක්

(iii) පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ අඩුම වශයෙන් අවුරුදු 5 ක වැඩහුරුවීමේ කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණකොට තිබිය යුතු අතර ඉන් අඩුම වශයෙන් අවුරුදු 2 ක පරිපාලක තත්ත්වයක් තිබිය යුතුය.

(vi) වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**සැ. යු.**—ලංකා කාර්මික විද්‍යාලයේ තුන් අවුරුදු යාන්ත්‍රික ඉංජිනේරු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

(ආ) ඉහත 5 (අ) (II) වෙනි ඡේදයේ නියමකර ඇති සුදුසුකම් දරණ, පොලිස් මධ්‍යම රියගළේ යාන්ත්‍රික රාජකාරී කරන ලද පොලිස් සැරයින්වද මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

6. **සේවා කොන්දේසි** (i) :—

(අ) තෝරාගනු ලබන අයදුම්කරු තුන් අවුරුදු කාලයක ආධුනිකත්වයකට යටත්විය යුතුය.

(ආ) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුයයි තෝරා ගනු ලබන නිලධාරියාට නියම කරනු ලැබේ.

(ඇ) ආධුනික කාල සීමාව තුළදී ඔහු විසින් සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඈ) ආධුනික කාලය අවසන්වූ විට සේවයෙහි ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔහු නියමිත කාල සීමාව ඇතුළත සමත් වීම මතය. නියමිත කාල සීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත්වීම, වැටුප් වැඩිවීම් අත්හිටුවීමට හේතුවන අතර නියමිත කාල සීමාව ඉක්මවා තවදුරටත් සමසක කාලයක් තුළදී මෙම පරීක්ෂණයකින් සමත්වීමට අපොහොසත් වුවහොත් පරීක්ෂණයකින් සමත්වන තෙක්ම ක්‍රියාත්මක වන පරිදි එම අත්හිටුවීම නතර කිරීමට පරිවර්තනය කරනු ලැබේ.

(ඉ) ආධුනික කාලය අවසානයේදී, නියමිත ප්‍රවීණතා තත්ත්වය නොලබා සිටියහොත් 120 සහ 121 මෙහි පාලන රෙගුලාසිවල විධි විධාන බලපවත්වනු ඇත.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන අයදුම්කරු, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි කාර්‍යාල කාර්‍ය සංවිධාන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය (මෙම සංග්‍රහයේ කාර්‍යයන් සඳහා පමණක් අයදුම්කරු පොලිස් නිලධාරියෙකු ලෙස සලකනු ලැබේ.) සහ පොලිස් පති සහ රජය මගින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවලටද යටත්විය යුතුය.

7. **බඳවා ගැනීමේ කොන්දේසි :**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැ.අ.වි. අරමුදලට දායකවිය යුතුය.

8. අයදුම්පත් සමග අමුණා එවිය යුත්තේ සහතිකවල පිටපත් පමණක් බව අයදුම්කරුවන් සැලකිල්ලට ගත යුතුයි.

9. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ මුලින්ම දැක්වෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කර ගැනීම පිළිබඳ පොදු කොන්දේසිද බලන්න.

10. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 7ක් ඇතුලතදී තම අයදුම්පත ලැබුණ බවට දැනුම්දීමක් නොලත් කිසියම් අයදුම්කරුවෙකු වෙතොත්, ඔහු විසින් ඒ පිළිබඳව කොළඹ 5, නාරාහේන්පිටිය, පොලිස් ප්‍රවාහණ කාර්‍යාලයේ පොලිස් අධිකාරිට දැනුම්දිය යුතුය. මෙම නියමය පිළිපැදීමට අපොහොසත්වීමෙන් අයදුම්කරු සතු කවර හිමිකම් වුවද ඔහුට අහිමිවේ.

ඊ. ඇල්. අබේගුණවර්ධන,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ,
1969 අප්‍රේල් මස 28 දින.

## ඉල්ලුම් පත්‍ර ආකෘතිය

### සහකාර ෆෝර්මන් තනතුර

අයදුම් කරන තනතුර :—

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :—

3. උපන් දිනය හා වයස :————.

4. ජාතිය :————.

(i) ලියා පදිංචිවීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලාංකික පුරවැසියෙක්ද යන බව :————.

(ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙක් වී සිටී නම් ලියා පදිංචිවූ අංකය සඳහන් කරන්න)

(ii) පරම්පරාවෙන් ලාංකික පුරවැසියෙක් වී සිටී නම් මතු දැක්වෙන අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න :——.

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ මුත්තා :————.

(ඈ) අයදුම්කරුගේ මී මුත්තා :————.

5. ගැසට් නිවේදනයේ ඉල්ලා ඇති පරිදි අධ්‍යාපනික හා පළපුරුදුකම් පිළිබඳ සුදුසුකම් සඳහන් කරන්න. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.

6. දැනට කරන රක්ෂාව සහ එහි වැටුප :————.

7. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

8. දැන අඳුනන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.
(චරිත සහතික දෙකක පිටපත් ඇමිණිය යුතුයි.)

9. ඔබ රජය යටතේ සේවය කර තිබේද ? :————.
(එසේ නම්, කාල සීමාවන් සමග විස්තර දෙපාර්තමේන්තු සහ දරණ ලද තනතුරු සහ එම දෙපාර්තමේන්තුවලින් අස්වූයේ කවර හේතූන් යටතේදැයි සඳහන් කරන්න.)

මා විසින් අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වීමට පැමිණෙනවාත් හැර, තේරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5-106—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## කම්කරු දෙපාර්තමේන්තුව

### මේසන් වැඩ පිළිබඳ උපදේශක තනතුරු

කම්කරු දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යන්නා වූ මේසන්වරුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල උපදේශකයින් වශයෙන් පත්කර ගැනීම සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිටපත්කර ගත් ඉල්ලුම්පත් 1969 මැයි මස 22 වන දිනට හෝ ඊට පෙර ලැබෙනසේ කොළඹ, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ, 3 වන මහලේ, කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය.

1. **දීමනාව.**—සියල්ල ඇතුලත් රු. 400 සිට රු. 450 දක්වා වූ මාසික දීමනාවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පළපුරුද්ද හා ප්‍රවීනත්වය , අනුව තීරණය කෙරේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—

(අ) පත්වීම, කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි, පළමුවෙන්ම එක් අවුරුද්දකට කොන්ත්‍රාත්තු පදනමක් මත වේ.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර පළාතකට හෝ පත් කරන්නට යෙදෙනවා ඇත.

3. **වයස් සීමාව.**—වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

4. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(1) අධ්‍යාපනික—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 6කින් වත් ලබාගන්නා ලද අධ්‍යායන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ), හෝ

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක් සමග.

(2) කාර්මික—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකයින්ගේ සහතිකය, හෝ

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ (සන්ධ්‍යාකාල පාඨමාලාව හැදෑරීම පිළිබඳ) සහතිකය, හෝ

(ඊ) එයට සමාන හෝ උසස් සහතිකයක් ලැබීමෙන් පසුව ගොඩනැගිලි තැනීමේ වැඩ පරිපාලනය කිරීම සම්බන්ධ පස් අවුරුද්දක පලපුරුද්දක්.

**සටහන.**—(ආධුනික කාලයක් ඇත්නම් එයත් සමඟ) මේ වෘත්තිය පිළිබඳව 15 අවුරුද්දක පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් 7 වැනි ප්‍රමාණයෙන් වත් සමත් අයදුම්කරුවන්ට ද මේ තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක.

5. අයදුම්කරුවන්ට වෘත්තිය පරීක්ෂණයකින් සමත්වීමට සිදුවේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය. යම්කිසි විටකදී අයදුම්කරුවන්ව තෝරාගැනීමට ලැබුනහොත ඔහුව සේවයෙන් මුදාහැරීමට හැකිද නොහැකිද යනවග එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළයුතුය.

7. ඉල්ලුම්පත් ලත්බව දන්වනු නොලැබේ.

ඊ. ආර්. ආර්. විජේවික්‍රම,
කම්කරු කොමසාරිස්.

### ඉහත සඳහන් කරන ලද ආකෘතිපත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

4.. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

5. ජාතික තත්ත්වය :————.

6. ඉහළම අධ්‍යාපන සුදුකම (සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය :————

7. උපදෙස් දීමට හැක්කේ :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඉ) ඉංග්‍රීසි :————.

8. අවුරුදු කීයක පළපුරුද්දක් තිබේද ? (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි): ————.

9. චරිත සහතික ලබාගත් අයගේ නම් (පිටපත් ඇමිණිය යුතුය :————

1. ————.
2. ————.
3. ————.

10. වැඩිමනත් විස්තර :————.

මා විසින් මෙම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින්, අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වීමට පැමිණෙනවත් හැර, තේරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට සිදුවන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–189—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කම්කරු දෙපාතීමේන්තුවේ, වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුරු

පහත දැක්වෙන වෘත්තීන් සම්බන්ධයෙන් උපදේශක තනතුරු සඳහා මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම් පත් 1969 මැයි 22 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිද්දෙන් කොළඹ, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 3 මහලේ, කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය :—

1. යන්ත්‍ර ශිල්පය
2. වෑද්දීම
3. පෑස්සීම

2. **වේතනය.**—සියලු දීමනාවන් ඇතුලුව මසකට රු. 400 සිට රු. 450 දක්වා වූ ගාස්තුවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය, තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පලපුරුද්ද හා ප්‍රවීණත්වය අනුව තීරණය කෙරේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—පත්වීම, කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි පළමුවෙන්ම නියමිත කාල පරිච්ඡේදයකට කොන්ත්‍රාත්තු පදනමක් මත වේ. පසුව අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත.

4. **සේවා කොන්දේසි.**—(1) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානයන් ක්‍රියාවට නැගිම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(2) තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් මුදලින් රු. 1,000 ක් බැගින් ඇප තැබිය යුතුය.

5. **වයස් සීමාව.**—වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

6. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අධ්‍යාපනික—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් හයකින් වත් ලබා ගන්නා ලද අධ්‍යාපන පොදු සහතිකය (සාමාන්‍ය පෙල), හෝ,

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක්, හා

(ii) කාර්මික—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තිය පුහුණු ගුරුවරුන්ගේ අවසාන සහතිකය, හෝ

(ඊ) ඊට සමාන හෝ උසස් සහතිකයක් සමග අදාල වෘත්තිය සම්බන්ධයෙන් පස් අවුරුදු ප්‍රායෝගික පලපුරුද්දක්.

**සටහන.**—අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ වෘත්තිය පරීක්ෂණයකින් හා ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුවය.

7. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය. අයදුම්කරුවන් මේ තනතුරු සඳහා තෝරා ගනු ලැබුව හොත් කම්කරු දෙපාතීමේන්තුවේ සේවය සඳහා මුදා හරින බවට දෙපැතීමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කරනු ලබන අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට භාජන වේ.

8. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොව) යාකොට එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බව්තීස්ම සහතිකය භාර ගනු නොලැබේ.)

(ආ) (i) ලබා ඇති උසස්ම අධ්‍යාපන පිළිබඳ සහතික.
(ii) කාර්මික අධ්‍යාපන පිළිබඳ සහතික.

(ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව පසුව දන්වනු ලැබේ.

ඊ. ආර්. ආර්. විජේවික්‍රම,
කම්කරු කොමසාරිස්.

**ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය**

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල උපදේශක තනතුරු, යන්ත්‍රශිල්පය/වැද්දීම/පැස්සීම

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. 1969.5.22 දිනට නිවැරදි වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.
උපන් දිනය :————.

4. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

5. ජාතිය :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

7. උපදෙස් දීමට හැකිද යන වග :—
(අ) සිංහලෙන් :————.
(ආ) දෙමළෙන් :————.
(ඇ) ඉංග්‍රීසියෙන් :————.

8. කාර්මික සුදුසුකම් :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

9. වෘත්තිය පිළිබඳව ඇති පුරුද්ද විස්තර සහිතව :————.
(සහතිකවල පිටපත් සමඟ අමුණා එවිය යුතුයි.)

10. සහතික දෙනු ලැබූ අයගේ නම් :————.

11. තව තොරතුරු කිසිත් වේ නම් එය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු එක් වෘත්තියට වඩා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් ඒ එක් එක් වෘත්තීන් සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.) (නොගැලපෙන වචන කපා හරින්න).

5–190—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර (තාවකාලික)

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ (තාවකාලික) ප්‍රවාහන නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව සම්පූර්ණ කොට 1969 මැයි 25 වැනි දිනට හෝ ඊට ප්‍රථම කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රය, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුයි. (නිලධාරීන්ගේ පෞද්ගලික නමට එවනු ලබන අයදුම් පත් භාරගනු නො ලැබේ.)

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අදාල වැටුප වර්ෂයකට රු. 1,620න් පටන්ගෙන රු. 120 ක් බැගින් වූ වාර්ෂික වැඩිවීම් 9 කින් පසු රු. 2,700 දක්වා වැඩි වේ.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලැබූ අය රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන් 1969 මැයි මස 25 දිනට—

(අ) තමන්ගේ වයස අවුරුදු 25ට නොඅඩු වූද, අවුරුදු 40ට නොවැඩි වූ ද අය විය යුතුයි. රජයේ සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාල නො වේ.

(ආ) විෂයයන් තුනකින් සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නො වැඩි වාර ගණනක දී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් යුතු අධ්‍යයන පොදු සහතිකය හෝ එයට සමාන උසස් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුයි.

**සංලක්ෂ්‍යය.**—යටත් පිරිසෙයින් අවුරුදු 10ක සේවය ඇත්තාවූ ද, කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට උසස් අධ්‍යාපන සුදුසුකම් ඇත්තාවූ ද, දෙපාර්තමේන්තු සේවකයින්ට ද අයදුම් කළ හැකිය.

(ආ) විදුලි මෝටර් ජනකයන්, සුවිච්චු ගියර සහ නිවාස විදුලි ආලෝක ක්‍රියා කරවීම, අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ව වැඩපළක හෝ පිළිගත් ගරාජයක හෝ අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය. ඔහු වැඩ පිළිබඳ නිවැරදි වියදම් තබා ගැනීමට සමත් විය යුත්තෝය. මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ පිළිගත් ආයතනයක ස්ථානභාර පරිපාලක නිලධාරියා වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 2ක් මනා ලෙස සේවය කර ඇති බවට සහතිකයක් තිබිය යුතුයි.

(ඇ) බර වාහන පැදවීම සඳහා බලපත්‍රයක් තිබිය යුතුයි.

5. පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (බව්තීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහා නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතික හෝ භාර ගනු නොලැබේ.)

(ආ) උසස් ම අධ්‍යාපන වෘත්තිය නොහොත් කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික වේ නම් ඒ ද,

(ඇ) අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්, චරිතය සහ තනතුරට පත් කරනු ලැබීමට සුදුසු බව පිළිබඳව වූ ළඟදී ලබාගත් සහතික තුනක් ද (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ.) පිටපත් (සහතික ම නොවේ) ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුයි.

සැ. යු.—චරිතාදී සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයෙහි පළ කර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1969 අප්‍රේල් මස 25 දින,
කොළඹ 7,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ප්‍රවාහන නිලධාරි තනතුර (තාවකාලික)

1. සම්පූර්ණ නම (අගට යෙදෙන නම මුලට) :————.

2. ලියුම් යොමුව :————.

3. ජාතිය සහ එය හිමි වූ අයුරු :————.

4. (අ) උපන් දිනය සහ 1969.5.25 දිනට වයස :————.
   (ආ) විවාහක ද අවිවාහක ද යන බව :————.

5. උපන් තැන—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ආ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ : ————.

6. අධ්‍යාපනික සුදුසුකම්.—ලබාගත් දින ඒවායේ පන්ති ද ඒ සඳහා හදාල විෂයයන් ද සඳහන් කළ යුතුය. (ලබාගත් උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකයෙහි පිටපතක් ද ඇමිණිය යුතුයි.) :————.

7. කාර්මික නොහොත් වෘත්තීය සුදුසුකම් වේ නම් එය :————.

8. උගත් පාසල් සහ ඉන් අස් වූ දින :————.

9. පාසලෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ සම්පූර්ණ විස්තර සහ ඒවාට පත් වූ හා ඉන් අස්වූ දින :————.

10. කියවීම, ලිවීම, කථාව සහ භාෂා පරිවර්තනය නිපුනත්වය : ————.
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

11. විශේෂ සුදුසුකම් වේ නම්, ඒ පිළිබඳ විස්තර (වෘත්තීය හා කාර්මික) :————.

12. චරිතාදි සහතික පත් ලබාගත් අයගේ නම් සහ තොරතුරු (මේ සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.) :————.

13. අයදුම්කරු පෞද්ගලිකව දන්වා, ඔහු සම්බන්ධයෙන් වගකිය හැකි දෙදෙනෙකුගේ නම් සහ තනතුරු :—
   1. ........................................
   2. ........................................

14. වෙනත් සුදුසුකම් :————.

මේ ඉල්ලුම් පතයෙහි මා සඳහන් කොට තිබෙන සියලු විස්තර සත්‍ය වූ ද, නිවැරදි වූ ද කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත්, තෝරා ගැනීමට පෙර නම්, තනතුරට නුසුදුස්සකු වීමටද තෝරා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම්, කිසි වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටද මා යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
අධ්‍යක්ෂතැන වෙතය.

5-89—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## අයි. ඇම්. ඇම්. ටී. ඇස්. "ඩෆ්රින්" නෞකාවේ ආධුනිකත්වය සඳහා ඇබෑර්තු

1969.4.3 වැනි දිනය සහ අංක 14,848 දරණ රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ පළවූ නිවේදනයට අමතරව, ඉල්ලුම්පත් බාර ගැනීමේ අවසාන දිනය 69.5.17 වැනි දින දක්වා දීර්ඝ කර ඇත. 1969 අප්‍රේල් මාසයේ අ. පො. ස. (සාමාන්‍ය) විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවන අපේක්ෂකයන්ගෙන්ද ඉල්ලුම්පත් බාරගනු ලැබේ. ප්‍රතිඵල ප්‍රසිද්ධ කරනු ලැබ, සතියක් ඇතුළත එම අපේක්ෂකයන් විසින් ඔවුන්ගේ විභාග ප්‍රතිඵල පිටපතක් මා වෙත එවිය යුතුය. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිඵල නිකුත් නොකිරීමත් ඇතුළුව කවර හේතුවක් නිසා හෝ, එසේ ප්‍රතිඵල පිටපතක් මා වෙත එවීමට ඔවුන් අපොහොසත් වුවහොත්, තරඟ විභාගයෙන් සාමාර්ථය ලත් අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාවේදී, ඔවුන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ස්ථිර ලේකම්,
ජනසතු සේවා අමාත්‍යාංශය.

ජනසතු සේවා අමාත්‍යාංශය,
තැ. පෙ. 500,
මහලේකම් ගොඩනැගිල්ල,
1969 අප්‍රේල් මස 28 දින.

5-100—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආධුනික සැළසුම්කරු තනතුරු (තාවකාලික)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරු තනතුරු (තාවකාලික) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පළකොට ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කළ අයදුම්පත්, 1969 මැයි මස 25 දින හෝ ඊට පෙර හෝ කොළඹ 7, තැ. පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත ලැබිය යුතුයි. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

2. **වැටුප් සහ සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—ආධුනික සැළසුම්කරු තනතුර තාවකාලිකය. එම තනතුරට අදාල වැටුප් ක්‍රමය වසකට රු. 960—72 බැගින් 2—රු. 1,104 වේ. මෙම පත්වීම් නිත්‍ය වශයෙන්ම තාවකාලික පදනමක් උඩ වන අතර රජයෙන් හෝ නිලධාරීන් විසින් හෝ එක් මසක දැන්වීමකින් පසු සේවය නතර කළ හැකිය.

**සටහන :** කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික අභ්‍යාසායතනයේ හෝ රජය විසින් අනුමතකොට ඇති වෙනත් ඒ හා සමාන ආයතනයක හෝ සැළසුම් ශිල්පය පිළිබඳ පූර්ණ කාලීන පාඨමාලාව, සේවයට බඳවාගනු ලබන අවස්ථාවේදී සාර්ථක ලෙස සම්පූර්ණකොට ඇති ආධුනික සැළසුම්කරුවන්ට වර්ෂයකට රු. 1,032 ක්වූ වැටුප් පියවරෙහි තබනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(අ) ලාංකිකයෙකු බවටද, (පෙළපතින් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලක්දිව පුරවැසියා ලාංකිකයෙකි).

(ආ) 1969 මැයි මස 9 දින දී වයස අවුරුදු 18 හා 30 අතර බවටද (අනෙකුත් සුදුසුකම් ඇත්නම් උපරිම වයස් සීමාව වාරිමාර්ග දෙපාර්තමේන්තුමය අයදුම්කරුවන් කෙරෙහි බලපානු නොලැබේ.)

(ඇ) ඉතා යහපත් චරිතයකින් යුක්ත බවට ද;

(ඈ) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මිකාභ්‍යාසායතනයේ හෝ රජය විසින් අනුමත කර ඇති වෙනත් ඒ හා සමාන ආයතනයක හෝ සැළසුම් ශිල්පය පිළිබඳව වූ පූර්ණකාලීන පාඨමාලාව සම්පූර්ණකර ඇති බවටද සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත් සමග පහත දක්වා ඇති සහතික පත්වල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා ශිල්පමය සුදුසුකම් පිළිබඳ සහතික;

(ආ) උප්පැන්න සහතිකය (අධ්‍යාපනික අභිප්‍රායයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාරගනු නොලැබේ);

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක් (මෙයින් එකක් අයදුම්කරු අවසාන වශයෙන් උගත් පාසැලේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතුය).

**සැළකිය යුතුයි.**—මෙම සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

5. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරුවන් ස්වකීය වියදමින්ම කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුය.

7. අයදුම්පතේ දී ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරාගනු ලැබීමට ප්‍රථම සොයාගතහොත් අයදුම්කරු නුසුදුස්සකු කිරීමට ද

තෝරාගනු ලැබීමෙන් පසු සොයාගතහොත් සේවයෙන් පහ කිරීමටද සිදුවනු ඇත.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාලවන පොදු කොන්දේසිවලට මෙයින් අවධානය යොමු කරවමි.

වී. පත්මනාදන්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1969 අප්‍රේල් මස 28 දින,
කොළඹ,
තැ. පෙ. 1138 හි,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

---

### ආධුනික සැළසුම්කරු තනතුරු සඳහා අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   - (අ) පෙළපත් නම :————.
   - (ආ) අනිකුත් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
   (ආ) මොවුන් උපන් ස්ථානය :—
   - (i) අයදුම්කරුගේ පියා :————.
   - (ii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයා :————.
   - (iii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයාගේ පියා :————.

   (අයදුම්කරු ලක්දිවහි ඉපදුනි නම් (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය. අයදුම්කරු ඉපදුනේ ලක්දිවහි නොවේ නම් (ආ) (i) හා (ii) හෝ (iii) පිරවිය යුතුය).
5. ලබාගත් අධ්‍යාපනික සුදුසුකම්.—පරීක්ෂණයේ වසර සහ මාසයද සමත්වී ඇති විෂයයන් හා එක් එක් විෂයයෙන් ලත් තත්ත්වය සඳහන් කළ යුතුය) :————.
6. ලබාගත් ශිල්පමය සුදුසුකම් :————.
7. අයදුම්කරු විවාහක හෝ අවිවාහක බව :————.
8. පාසැලෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් :————.
9. දැනට තනතුරක් දරන්නේ නම් එය :————.
10. අමුණා ඇති චරිත සහතික කාගෙන්ද :————.

මේ අයදුම්පතේ මවිසින් සපයා ඇති විස්තර අව්‍යාජ බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————,
දිනය :————.

5–93—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තෑ. කඩ්ඩුකුලම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ තෑ. කඩ්ඩුකුලම් පත්තු කොට්ඨාශයේ සාමාන්‍ය විවාහ ලේකම් ධුරය

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ තෑ. කඩ්ඩුකුලම් කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායඞාලයයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායඞාල, ග්‍රාම සේවක කායඞාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඞාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කායඞාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1969 ජූනි 5 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය.

සෝමපාල ගුණධීර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 අප්‍රේල් මස 22 වෙනි දින,
ත්‍රිකුණාමලයේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායඞාලයේදිය.

5–103—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

### රජයේ විදුලි කම්මාන්ත දෙපාතීමේන්තුව

#### වෘත්තීය ආධුනිකයින් බඳවා ගැනීම සහ පුහුණුකිරීම—කාසල්රී කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය

කොතලාවලපුර මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ, අම්පාරේ හාඩි කාර්මික අභ්‍යාස ආයතනයේ, කණිෂ්ඨ කාර්මික පාසල්වල හෝ ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ අනෙකුත් පුහුණුවීමේ අංශයන්හී සතුටුදායක පුහුණුවක් අවසන් කර ඇති ආධුනිකයන්ගෙන්, කාසල්රී කාර්මික අභ්‍යාස ආයතනයේ වෘත්තීය ආධුනිකයන්ගේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ පෝර්මයේ වූ අයදුම්පත් 1969 මැයි 30 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුයි.

2. **අභ්‍යාස මධ්‍යස්ථානයේ පුහුණුවීමේ කොන්දේසි හා ගෙවන දීමනා.**—ආධුනිකයන් සඳහා කාසල්රී කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ එක් අවුරුදු පුහුණුවීමක් සංවිධානය කෙරේ. මෙම කාලය තුළ ආධුනිකයන් අධ්‍යාස මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති නේවාසිකාගාරයෙහි නැවතී සිටිය යුතු අතර තමන්ගේ සියලුම ආහාරපානාදිය එහිදී ගත යුතුවේ. වි. කර්. ප්‍ර. ක. විසින් අනුමත කරන ලද ආහාරපානාදිය කසල්රීහී ආපන ශාලාවෙන් ඔවුනට සපයනවා ඇත.

මෙම පුහුණුවීමේ කාලය තුළදී ආධුනිකයෝ, එක් ආධුනිකයෙකුට දිනකට රු. 1.20 ක දීමනාවක්, ජීවන වියදම් හා විශේෂ වියදම්ද ලැබීමට සුදුස්සෝ වෙති. කෙසේ වෙතත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වැය වන මුදල් ඉහත සඳහන් දීමනාවලින් අය කර ඉතිරි මුදල පමණක් ආධුනිකයන්ට ගෙවනු ලැබේ :—

- (අ) සපයන ලද ආහාරපානාදියේ වියදම්.
- (ආ) කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ ප්‍රධානචායඞ විසින් අවශ්‍ය යයි සිතන අභ්‍යාස මධ්‍යස්ථානයේදී සපයන පොත් ගැනීම, ගමනාගමන, ඇඳුම් හා අනිකුත් කාරණා සඳහා ගෙවීම්,
- (ඇ) කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති කඩකිරීම සම්බන්ධයෙන් ආධුනිකයන් හට ප්‍රධානාචායඞ විසින් කරනු ලබන දඩ ගැසීම් (ආධුනිකයින්ගේ සුළු වරදවල් සඳහා දඩ ගැසීමද, බරපතල වැරදි සඳහා නෙරපීමටද ඔවුන් යටත් වන බව සැලකිය යුතුය.)

ආධුනිකයාට පත්තිවලට යාමට උවමනා කරන ඇඳුම් හා වි. කර්. ප්‍ර. ක. විසින් නේවාසිකාගාරයේ භාවිතය සඳහා උවමනා යයි නියම කරන හා අනුමත කරන අනිකුත් දෑ ආධුනිකයන් විසින් තමන්ම සපයා ගත යුතුයි.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම, තමා—

- (i) 1969 ජූනි මස 1 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු බවටද, අවුරුදු 20ට නොවැඩි බවටද,
- (ii) 7 වැනි පංතිය සමත් බවටද,
- (iii) ශාරීරික වශයෙන් නිරෝගී බවටත්, සතුටුදායක සාධක ඉදිරිපත් කළ යුතුය.
- (iv) උප්පත්තියෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු විය යුතුය.

4. **බඳවා ගැනීමේ කොන්දේසි.**—ආධුනිකයන් උදෙස්ගිමත්ව සහ විශ්වාසීව නිර්දේශිත පාඨමාලාව හැදෑරීමටත්, පත්වීම් ලත් දින සිට අවුරුදු 5 ක් රජයට සේවය කිරීමටත් ගිවිසුමකට හා දෙම්ව්පියන් හෝ භාරකාරයා මූලිකයා ලෙස ඇපකරුවන් දෙදෙනෙකුද ඇතිව රු. 2,000 ක බැඳුම්කරයකට බැඳිය යුතුයි. පුහුණුව සතුටුදායකව අවසන් වීමෙන් පසු 1962 V වැනි සැසිවාර්තාවේ තත්ත්වය උපලේඛනයේ දක්වා ඇති තත්ත්වයට පැමිණී කල්හි පුරප්පාඩු ඇති වීමට යටත්ව ඔවුන් III වැනි පංතියේ තනතුරුවලට පත්කරනු ලැබීම සඳහා සලකා බලනු ඇත. III වැනි පංතියේ අඩු වශයෙන් අවුරුදු

3 ක කාලයක් සේවය කිරීමෙන් පසු අනිත් අයගේ ඉල්ලීම සමග II වැනි පංතියට උසස් වීම් සඳහා ඔවුන්ගේ ඉල්ලීම් ද සලකා බලනවා ඇත.

(iii) පිරිනමන ලද පුහුණුවෙන් ප්‍රයෝජනය නොගන්නා ආධුනිකයින් නැතහොත් ප්‍රගතිය හෝ හැසිරීම සතුටුදායක නොවන්නන් ඕනෑම විටෙක අස් කරනවාත් හැර දෙපාර්තමේන්තුවේ තවදුරටත් පුහුණුව ලබන්නට අයිතිවාසිකමක් නොලැබෙනවා ඇත. අපේක්ෂකයන් සාමාන්‍ය වශයෙන් පාඨමාලාව එක් අවුරුද්දක් ඇතුළත අවසාන කළ යුතුය.

(iii) ආධුනිකයන් කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ සහ එකී නේවාසිකාගාරයේත්, වැඩපොළේත් සියළුම නීතිරීති පිළිපැදිය යුතුයි.

(iv) තෝරාගත් අයදුම්කරුවන් සේවය සඳහා සිය ශාරීරික සුදුසුකම් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට බැඳී සිටී.

(v) තෝරාගත් අයදුම්කරු ලියාපදිංචි කිරීම සඳහා තම උප්පැන්න සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

(vi) ආධුනිකයන්ගේ පුහුණුව සම්බන්ධයෙන් ඕනෑම කාරණයකදී ආණ්ඩුවේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැනගේ තීරණය අවසාන තීරණය වේ.

5. **සේවා කොන්දේසි.**—(i) අවුරුද්දක පුහුණුව සතුටුදායක ලෙස නිම කිරීමෙන් අනතුරුව හා 1962 V වැනි සැසි වාර්තාවේ තත්ත්වය උපලේඛනයෙහි දක්වා ඇති තත්ත්වයකට පැමිණි කල්හි ආධුනිකයන් පළමුවැනි 6 මස දිනකට රු. 1.80 බැගින් ද, ඊට පසු වර්ෂයකට රු. 540—8×30 1×24—රු. 804 වැටුප් පරිමාණය පිට කම්කරු ශ්‍රේණියේ III වැනි පන්තියේ තනතුරුවලට පත් කිරීම ගැන සලකා බලනු ලැබේ. එසේ කරන්නේ එම ශ්‍රේණියේ පුරප්පාඩු ඇතොත් පමණි. එබඳු පත්වීම් දෙන වග දෙපාර්තමේන්තුව සහතික නොකරන අතර, අයිතියක් ලෙස එම තනතුරු ඉල්ලා සිටීමට ආධුනිකයන්ට අයිතියක් නැත.

(ii) තෝරාගත් අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් ව්‍යවස්ථා, කායික සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ රජය මගින් විටින් විට නිකුත් කරන/කළ හැකි වෙනත් ශුරලාසි හෝ නියෝගවලට හෝ යටත් වන්නේ ය.

(iii) තෝරාගත් අපේක්ෂකයා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද, විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවට නැඟීම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

6. කොළඹදී පවත්වනු ලබන විභාගයකට සහ සම්මුඛ පරීක්ෂණයකට අපේක්ෂකයන් පෙනී සිටිය යුතුය. ගමන් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි ප්‍රසිද්ධ කර ඇති රජයේ තනතුරුවලට පත් කිරීම පිළිබඳ බලපාන සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලිපි, කොළඹ තැපැල් පෙට්ටිය අංක 540, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරුට එවනවා මිස පුද්ගලික වශයෙන් දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකුට එවිය යුතු නොවේ.

එම්. අයි. අසීස්,
වැ. බ. විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරු.

රජයේ විදුලි දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 540, කොළඹ,
1969 අප්‍රේල් මස 27 වැනි දින.

## අයදුම් පත්‍රය

**වෘත්තීය ආධුනිකයින්—කාසල්රී කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය**

1. සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරෙන්)
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) 1969.6.1 දිනට වයස : වර්‍ෂ ——, මාස :——, දින :——.
   (ආ) උපන් දිනය :————.

4. උත්පත්තියෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියෙකු ද යන වග :————.

5. පහත සඳහන් අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ : ————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ ————.

6. අයදුම්කරු විවාහක ද, අවිවාහක ද හෝ වැන්දඹු ද යන වග :————.

7. ඉගෙනීම ලත් පාසැල්, විද්‍යාල සහ කාර්මික ආයතන :—
   (ඒවාට ඇතුළත් වූ දිනයන් හා අස් වූ දිනයන් සමග.).
   (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.
   (ආ) කාර්මික අධ්‍යාපනය සඳහා :————.
   (පාසැල් සහ විද්‍යාලවලින් නිකුත් කරන ලද සහතිකවල පිටපත් ද, කාර්මික අධ්‍යාපනය අවසන් කළ කාර්මික අභ්‍යාස ආයතනවලින් නිකුත් කරන ලද සහතිකවල පිටපත් ද ඇමිණිය යුතුය.)

8. කාර්මික ආයතනයෙන් අස් වූ පසු රක්ෂාවක නියුක්තව සිටි නම්, ඒ පිළිබඳ විස්තර :————.

9. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

10. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (මෑතකදී ලබා ගත් සහතික පත් තුනක පිටපත් ඇමිණිය යුතුය. මුල් පිටපත් ඇමිණිය නොයුතුය.) :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැනගතහොත්, මෙම තනතුරු සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවාසින් පසු සොයාගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–110—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව

**තාවකාලික කාර්මික සහකාර තනතුරු**

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික කාර්මික සහකාර තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1969.5.22 වැනි දින හෝ ඊට පෙර මෙම දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධාන කළමනාකරු වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් හා සේවා කොන්දේසි.**—වර්ෂයකට රු. 1,860—120—රු. 3,780 යන වැටුප් ක්‍රමය මෙම තනතුරට අදාල වේ.

3. මෙම තනතුරු තාවකාලික සහ විශ්‍රාම වැටුප් රහිත වන අතර, මෙම තනතුරු දැරීම හේතුකොට ගෙන රජය යටතේ ස්ථිර සේවය ලැබීම සඳහා කිසිම අයිතිවාසිකමක් හෝ ස්ථිර තත්ත්වයේ පත්වීමක් ලැබීම සඳහා හෝ වැඩි සැලකිල්ලක් ලැබීමේ අයිතිවාසිකමක් ද නොලැබේ.

4. වැටුපෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. මීට අතිරේක වශයෙන් තම මනාපය පරිදි තවත් සියයට 5ක් ද ගෙවීමට ඉඩ ඇත. කුමණ ප්‍රමාණයක් ගෙව්වත් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1969.5.22 වැනි දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තු සේවකයින්ට වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයක් හා මනා දේහ ලක්ෂණයෙන් යුක්ත බව.

(iii) ලන්ඩන් හෝ ලංකාවේ බී.ඇස්සී. (ඉංජිනේරු) විභාගයේ I වැනි අවසාන කොටස හෝ ඒ.ඇම්.අයි.ඊ.ඊ. I වැනි කොටස හා II වැනි කොටස හෝ ආදි නීති යටතේ ඒ.ඇම්.අයි.ඊ.ඊ. විභාගයේ “ අ ” කොටස.

6. දැනට රාජ්‍ය සේවාවෙහි නියුක්ත අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුයි. එවැනි අයදුම්පත් නියමිත දිනට පසුව මෙම දෙපාර්තමේන්තුවට ලැබුණ හොත්, එම අයදුම්පත් ඒ ඒ අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබුණ බව සඳහන් කර එම අයදුම්පත් ප්‍රමාදවීමට සැහෙන හේතූන් දක්වමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එම අයදුම්පත් භාරගන්නා ලෙසට නිර්දේශ කළ හොත් පමණක් එසේ ප්‍රමාදව ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්කරුවන් සිය අයදුම්පත්වලට—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්,

(ආ) අයදුම්කරුවන්ගේ චරිත හා මෙම තනතුර සඳහා ඇති සුදුසුකම් පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත් තුනක (මෙම අනුඡේදය යටතේ දැනට රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය) පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුය.

8. අයදුම්පත් ගැන හෝ මේ සම්බන්ධ අන් හැම ලිපිගනුදෙනු වක්ම කළ යුත්තේ ප්‍රධාන කළමනාකරු සමඟ මිස, මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකු සමඟ පුද්ගලිකව නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළ කර තිබෙන රාජ්‍ය සේවා තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එම්. අයි. අසීස්,
වැඩ බලන ප්‍රධාන කළමනාකරු.

1969 අප්‍රේල් මස 27 වැනි දින,
රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 540, කොළඹ.

### අයදුම් කිරීමේ ආකෘති පත්‍රය

**තාවකාලික කාර්මික සහකාර තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) 1969 මැයි මස 22 වැනි දිනට නියමිත වයස :—
   අවුරුදු :————. මාස :————. දින :————.
   (ආ) උපන් දිනය :————.

4. පුරවැසි බව සහ එය ලබාගත් අන්දම :————.

5. පහත සඳහන් අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු භාවය (විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න) : ————.

7. (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.
   (ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.
   (ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමඟ)

8. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උපාධි සහ ඒවා ලබාගත් දින, පන්තිය, සහ ඉදිරිපත් වුණු විෂයයන් සඳහන් කරන්න. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

9. ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමඟ (පිළිගත් ආයතනවල සාමාජිකත්වය ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකමක් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. පාසැල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා, නියුක්තව සිට හා හැරගිය දින සමඟ ලද වැටුප් :————.

11. විශේෂ අභිරුචිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

12. ඔබ ගැන කරුණු දැනගැනීමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නම්, ලිපිනය හා නිලතල :————.

13. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතිකපත්වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

14. ඔබ ණය ගැතිකමින් නිදහස්ද? නොඑසේ නම් කොතෙක් දුරට ණය ගැතිද? :————.

15. ඔබ සතුව මෝටර් රියක් තිබේද? නැතහොත් මෝටර් බයිසිකලයක් පැදිය හැකිද? :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5-91—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්ති**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්නට යන සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්තිවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මේ පන්ති අවුරුද්දක පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණුවන්නන් 40 දෙනකුට පමණ ඉඩ ඇත.

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම—

(අ) ලාංකික විය යුතුය ("ලාංකිකයා" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වන කෙනෙකි).

(ඉ) (i) සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථ්‍යය සහිතව ලංකා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) එකම වාරයකදී අඩු ගණනේ විෂයයන් 5 කින් වත් සමර්ථ වෙමින් විෂයයන් 6 කින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රය ලබා තිබිය යුතුය. මෙකී විෂයයන් 6 අතුරෙන් සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් සම්මාන සාමාර්ථ්‍යය ලබා තිබිය යුතුය.

(iii) පූර්වෝක්ත (i) වැනි හෝ (ii) වැනි ඡේදයේ සඳහන් සහතික පත්‍රයකට සමාන හෝ ඊට උසස් විභාගයක සහතික පත්‍රයක් ලබා තිබිය යුතුය.

(උ) 1969.5.25 වැනි දිනට වයස 17 ට අඩු හෝ 22 ට වැඩි හෝ නොවිය යුතුය.

(එ) ඉතා හොඳ චරිතයෙන් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

3. කොළඹ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හෝ විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා ගමන් ගාස්තු හෝ අනෙකුත් වියදම් ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැනගත හොත් එයින්ම ඔහු/ඇ නුසුදුසු වීමට ද තෝරා ගනු ලැබීමෙන් පසුව දැනගත හොත් ඔහු/ඇ අස්කර දමනු ලැබීමට ද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළදී කිසිම ගෙවීමක් කරනු නොලැබේ. පුහුණුව අවසානයේදී විභාග කොමසාරිස් විසින් යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වා එම විභාගයෙන් සමර්ථවූවන්ට සහතික පත් දෙනු ලැබේ. පුහුණුව අවසානයේදී අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකීරක්ෂා දීම ගැන කිසිසේත් ඇප වන්නේ නැත.

5. පුහුණු වීමේ කාලයේදී වරින්වර පරීක්ෂණයන් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තව දුරටත් පුහුණු වීමට ඉඩ

දෙනු ලැබේ. යම් ආධුනිකයකුගේ/ආධුනිකාවකගේ ඇමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණුවීමේ කාලය අතරතුර කවර අවස්ථාවකදී වුවත් ඔහු/ඇ පන්තියෙන් වහාම අස්කර දමනු ලබන්නට පුළුවන. එසේ අස්කර දමනු ලැබුව හොත් පසුව පවත්වන පුහුණු කිරීමේ පන්තියකට ඇතුළත් වීමට නුසුදුසු වන්නේ ය. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින්ම නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. දැන දැනම වූ නොසැළකිල්ලක් හෝ තදබල අප්‍රවේසම්කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට හානියක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇපකාරයන් දෙදෙනෙකු ඇපයට තබා රුපියල් 100 ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් පන්තියට ඇතුළත් කරගනු ලැබූවිට අත්සන් කළ යුතුය.

7. අයදුම් පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි තැනගේ පුද්ගලික නාමයට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7" යන ලිපිනයට ය. අයදුම්පත්, මෙහි පහත පළවන ආදශී පිටපත අනුව තමාගේ අත් අකුරෙන්ම ලියා 1969.5.25 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පීටර්. පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969 අප්‍රේල් 27 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත, කොළඹ 7.

**සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්තියට ඇතුළත්වීම සඳහා අයදුම්පත**

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙලපතින්ද නැතහොත් ලියා පදිංචි වීමෙන්ද යන බව සඳහන් කරන්න) :————.

(4) 1969.5.25 වන දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. මුල් සහතික නොවේ) :————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහකද ?. අවිවාහකද ? :————.

(7) සමර්ථවූ උසස්ම විභාගය (විෂයයන් හා දිනය සමග) : ————.

(8) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අ. පො. ස. ප. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථ්‍යය සහ සම්මාන ලැබූ විෂයයන් :————.
(සහතික පිටපත් අමුණන්න. මුල් සහතික නොවේ. සහතික පත් ලැබී නැත්නම් ප්‍රධානාචාර්යවරයාගේ සහතිකයක් හෝ වෙනත් පිළිගත හැකි සහතිකයක් භාරගනු ලැබේ.)

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම පිළිබඳ විශේෂ සුදුසුකම් ඇතොත් ඒ බව : ————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳ දැනුමක් තිබේද ? :————.

(12) දැන් රක්ෂාවක යෙදී සිටී නම් ඒ බව :————.

(13) පියාගේ හෝ භාරකාරයාගේ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙල :————.

(14) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්, මේ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසලේ මුල් ගුරුතුමාගෙන් විය යුතුයි. (අවශ්‍ය මුළු සහතික පිටපත් ගණන 3 කි) :————.

(16) වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5-94—69.5.9 වන අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනා ගමන මණ්ඩලය

### ඇබෑර්තු

මණ්ඩලීය සේවාවේ III වෙනි ශ්‍රේණියේ තනතුරක් වන නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන මෙන් ලංකා පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය.**—මසකට (සියළු දීමනාවන් ඇතුළුව) රු. 1,100—රු. 50—රු. 1,700. රු. 1,350 දී කාර්යක්ෂමතා කඩඉම වේ.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව මෙම පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැක. කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීමට ප්‍රථමයෙන් ලංගමයට අදාළ ගිණුම් පිළිවෙත් සහ ව්‍යවස්ථා පිළිබඳ විභාගයකින් සමත් විය යුතුයි.

3. **සුදුසුකම් :**

(i) 1969 යේ අප්‍රියෙල් මස 1 වෙනි දින වන විට වයස අවුරුදු 55 වැඩි නොවිය යුතුය.

(ii) චාර්ටඩ් ගණකාධිකාරිය, සංස්ථාපිත ගණකාධිකාරී විභාගය, ලියා පදිංචි කළ ගණකාධිකාරී විභාගය යන මේ විභාගවල අවසාන විභාගයෙන් සමර්ථ වීමෙන් පසු යටත් පිරිසෙයින් ඇවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුයි.

4. (අ) රාජ්‍ය සේවාවෙහි හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජනය කරන්නේ ඔවුන් දැන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්ති තිය අනුව, මණ්ඩලය යටතේ සේවය කිරීමට ඔවුන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. නැතහොත් ඒ නිලධාරීන් ඔවුන් දැන් සිටින රාජ්‍ය සේවාවෙන් හෝ පළාත් පාලන සේවාවෙන් ඉල්ලා අස්වීමට කැමති වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද, නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැළකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තෝරුනහොත් තමූ සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත් සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි :**

තෝරුන අපේක්ෂකයා 1 වෙනි වතාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. තවද ඔහු පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුයි :—

(i) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

(ii) දැනට්මත් පනවා ඇත්තාවූද කලින් කළ පනවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

(iv) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක් දායක මුදල් ගෙවීම. ඔහු වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල සියයට 15 කි.

(v) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කළ යුතුයි.

පහත සඳහන් ආදර්ශ ෆෝර්මය අනුව සකස්කර ගත් ඉල්ලුම් පත්‍ර 1969 යේ මැයි 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාරතැන.

1969 යේ අප්‍රියෙල් මස 25 වෙනි දින,
කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ
200 වෙනි ස්ථානයේදී ය.

## ලංකා ගමනා ගමන මණ්ඩලය

**(ඉල්ලුම් පත්‍ර පෝරමය)**

1. ඉල්ලන තනතුර :————.
2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.
3. ලියුම් ලැබෙන පිළිවෙල :————.
4. උපන් දිනය (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න) :————.
5. 1969. 4. 1 දිනට වයස :— අවුරුදු :———, මාස :———, දවස් :———.
6. ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.
7. විවාහකද, අවිවාහකද යන බව (විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න) :————.
8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය (ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න):——.
9. උසස් අධ්‍යයනය (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.) (සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න) :————.
10. වෛධික සුදුසුකම් (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත් වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න (සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න) :————.
11. (පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම් දැරූ පදවිය හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.) :————
12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පලාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (දැරූ තනතුර, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.)
13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් (මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.) :————.
14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහලම ප්‍රමාණය :————.
15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද ? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද ? :————.
16. සෙසු විස්තර :————.
17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.
18. ඔබ ගැන තොරතුරු දැනගැණීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :—

    1. ————,
    ————,
    ————.

    2. ————,
    ————,
    ————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැණීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

5–120—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ඇබෑර්තු**

මෙම සංස්ථාවේ මෙහි පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන් ගෙන් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1969 මැයි මස 22 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ—

සේවක මණ්ඩල කළමනාකාර තැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක. 113, ගාලු පාර, කොළඹ 3.

යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැල් මගින් එවිය යුතුයි. අයදුම් පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි “ සහකාර ගණකාධිකාරි ” හෝ “ සහකාර අභ්‍යන්තර ගණන් පරීක්ෂක නිලධාරි ” යනුවෙන් සඳහන් කොට එවිය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයන් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණයන් ඒකාබද්ධ වැටුප් ක්‍රම වේ.

5. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක. 666 හා 1965.8.20 වෙනි දින දරන චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළහැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළයුතුය.

8. **සේවා කොන්දේසි.**—(1) තෝරාගනු ලබන අයදුම්කරුවන් :—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය ;

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය ;

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට අට (8%)ක් දායක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට දොළහ (12%)ක් දායක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම අවශ්‍යය.

(2) මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

| තනතුර සහ වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම |
| --- | --- |
| (1) සහකාර ගණකාධිකාරි ... රු. 600 × 1,000 / 10 × 40 | (1) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි මධ්‍යම පරීක්ෂණ සහතිකය හෝ ; |
| | (2) පිරිවැය ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි ගණකාධිකරණය පිළිබඳ පාඨමාලාවේ පළවන, දෙවන හා තුන්වන කොටසින් සාමාර්ථය ලබා සිටීම හෝ ; |
| | (3) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතික පාඨමාලාවේ මධ්‍යම පරීක්ෂණ සහතිකය සමග, අවුරුදු හතරක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබීම. |
| (2) සහකාර අභ්‍යන්තර ගණන් පරීක්ෂක නිලධාරි රු. 600—1,000 / 10 × 40 | (1) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි මධ්‍යම පරීක්ෂණ සහතිකය හෝ; |
| | (2) පිරිවැය ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි ගණකාධිකරණය පිළිබඳ පාඨමාලාවේ පළවන, දෙවන හා තුන්වන කොටසින් සාමාර්ථය ලබාසිටීම සහ ගණන් පරීක්ෂණ කටයුතු පිළිබඳව අවුරුදු තුනක පළපුරුද්දක් තිබීම ; නැතහොත් |
| | (3) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය සමග ගණන් පරීක්ෂණ කටයුතු පිළිබඳව අවුරුදු තුනක පළපුරුද්දක් තිබීම. |

1969 අප්‍රේල් මස 25 වැනි දින.
113, ගාලු පාර, කොළඹ 3.

සේවක මණ්ඩල කළමනාකාරතැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
   (පෙලපත් නාමය ප්‍රථමයෙන්)
3. මුල් අකුරු සමග නම :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).
6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස :—
   අවුරුදු———— මාස———— දින————
7. පුරවැසි භාවය :————.
   (උත්පත්තියෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග)
8. විවාහක/අවිවාහක බව :—
   අවිවාහක බව———— විවාහක බව———— දික්කසාද බව————
9. අධ්‍යාපනික පසුබිම :—

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේනම් :————.
11. මෙතෙක් කරනලද රැකීයාවන් පිළිබඳ විස්තර :—

| ආයතනයේ නම | තත්ත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. දූනට ලබන වැටුප :————.
13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.
    (ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න)
14. වෙනත් කරුණු :————.
15. මෙම දන්වීමේ තනතුරු සඳහා " අවශ්‍ය සුදුසුකම් " යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–119—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය—අනුරාධපුරය

### තනතුරු ඇබැර්තු

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකික, බෞද්ධ, පුරවැසියන්ගෙන් (පුරුෂ පක්ෂය පමණයි) ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1969 මැයි මස 20 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ලේකම්, බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි.

3. තනතුරු කීපයකට ඉල්ලුම් කරන අය එක් එක් තනතුර සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

4. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුදුකම් අනුව සුදුසු වැටුප් පියවරක පිහිටුවීමට ඉඩ ඇත.

5. මෙහි දක්වා ඇත්තේ ඒකාබද්ධ වැටුප් ක්‍රමයන් ය.

6. මෙම දන්වීමෙහි සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල නොවුණු ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම් පත් ලැබුණු බව දන්වා එවනු නො ලැබේ.

8. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ නීතිගත සංස්ථාවල හෝ සේවකයන් විසින් එවනු ලබන අයදුම්පත් එම ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

9. (1) **සේවා කොන්දේසි:**—තෝරා ගනු ලබන අයදුම්කරුවන්—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල විය යුතුයි.

(ඇ) බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ සේවක අර්ථසාධක අරමුදලට තම වැටුපෙන් 4%ක් දායක විය යුතුයි. ධර්ම පීඨයෙන් 6%ක් දායක වනු ඇත.

(ඈ) අනුරාධපුරයේ පදිංචි ව සිටීමට සූදානම් විය යුතුය.

(2) මෙම තනතුරු සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පළමුවරට අවුරුදු දෙකක ආධුනික කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

| තනතුරු හා වැටුප් ක්‍රමය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| 1. ගණකාධිකාරී | |
| රු. 650—30 × 9 හා 40 × 7—රු. 1,200... | (i) ගිණුම් පිළිබඳ පස්වසකට නො අඩු පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් විය යුතුයි ; නැතහොත් |
| | (ii) ගිණුම් පිළිබඳව පස් වසකට නො අඩු ලංකා කාර්මික විද්‍යාලයේ ගිණුම් පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට සමාන, හෝ උසස් හෝ සහතික දරන්නෙක් විය යුතුයි; නැතහොත් |
| | (iii) ගිණුම් පිළිබඳව පස්වසකට නොඅඩු පළපුරුද්දක් ඇති රජයේ දෙපාර්තමේන්තුවක හෝ නීතිගත සංස්ථාවක හෝ විශ්ව විද්‍යාලයක හෝ සේවයෙහි නියුක්ත ගණකාධිකාරිවරයෙක් විය යුතුය. |
| | (iv) වයස අවුරුදු 30 ටත් 40 ටත් අතර විය යුතුය. |
| | (v) තෝරාගනු ලබන අයදුම්කරුගේ ඇපය— මුදලින් රු. 1,000ක් සහ ඇප ඔප්පුවකින් රු. 5,000 (රජයේ සේවකයන්ට මුදල් ඇපය අදල නොවේ.) |

**2. පරිපාලක**

රු. 470—15 × 7—රු. 575 ...

(i) සිංහල පාඨශාල ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය සමග ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාවෙන් සහ අංක ගණිතයෙන්/ගණිතයෙන් සම්මාන සහිතව විෂයයන් හයකින් දෙවරකට වැඩිනොවන වාර ගණනකදී සමත් වී ලබා ගත් අ.පො.ස. (සා.පෙ.) සහතිකය (ඉංග්‍රීසි දැනීම සහ ශිෂ්‍ය නිවාස හෝ නේවාසිකාගාර පාලනය කිරීමේ පස් වසකට නො අඩු පළපුරුද්ද අතිරේක සුදුසුකම් ය.)

(ii) වයස අවුරුදු 30 ත් 55 ත් අතර විය යුතුය.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුගේ ඇපය—මුදලින් රු. 500ක් හා ඇප ඔප්පුවකින් රු. 1,000කි. (මුදල් ඇපය රජයේ සේවකයන්ට අදල නොවේ.)

**3. උප පරිපාලක**

රු. 225—15 × 15—රු. 450 ...

(i) සිංහල පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාව හෝ සාහිත්‍යය සමග ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාවෙන් හා අංක ගණිතයෙන්/ගණිතයෙන් සම්මාන සහිතව විෂයයන් සයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී ලබා ගත් අ.පො.ස. (සා.පෙ.) සහතිකය (ඉංග්‍රීසි දැනුම අතිරේක සුදුසුකමකි.)

(ii) වයස අවුරුදු 25 ත් 40 අතර විය යුතුයි.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුගේ ඇපය—රු. 1,000 ඇප ඔප්පුවකින්.

**4. ලිපිකරු—II ශ්‍රේණිය**

රු. 470—15 × 7—රු. 575 ...

(i) සිංහල පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය සමග ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාවෙන් හා අංක ගණිතයෙන්/ගණිතයෙන් සම්මාන සහිතව විෂයයන් සයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී ලබා ගත් අ.පො.ස. (සා.පෙ.) සහතිකය.

(ii) රජයේ දෙපාර්තමේන්තුවක හෝ නීතිගත සංස්ථාවක හෝ විශ්වවිද්‍යාලයක හෝ පෞද්ගලික වෙළඳ ආයතනයක හෝ ලිපිකරු වශයෙන් සත් වසකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි. (ඉංග්‍රීසි යතුර ලිවීම අතිරේක සුදුසුකමකි.)

(iii) වයස—අවුරුදු 25 ත් 40 අතර විය යුතුයි.

**5. ලිපිකරු—III ශ්‍රේණිය**

රු. 225—15 × 15—රු. 450 ...

(i) සිංහල පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය සමග ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාවෙන් හා අංක ගණිතයෙන්/ගණිතයෙන් සම්මාන සහිතව විෂයයන් සයකින් දෙවරකට වැඩි නොවන වාර ගණනකදී සමර්ථ වී ලබා ගත් අ.පො.ස. (සා.පෙ.) සහතිකය.

(ii) රජයේ දෙපාර්තමේන්තුවක හෝ නීතිගත සංස්ථාවක හෝ විශ්වවිද්‍යාලයක හෝ පෞද්ගලික වෙළඳ ආයතනයක හෝ ලිපිකරු වශයෙන් තුන් වසකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි. (ඉංග්‍රීසි යතුරු ලිවීම අතිරේක සුදුසුකමකි.)

(iii) වයස අවුරුදු 25 ත් 40 ත් අතර විය යුතුයි.

**6. ලඝු ලේඛක යතුරු ලියන්නා (සිංහල)**

රු. 305—15 × 18—රු. 575 ...

(i) සිංහල පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය සමග ඉංග්‍රීසි පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය **හෝ** සිංහල භාෂාවෙන් හා අංක ගණිතයෙන්/ගණිතයෙන් සම්මාන සහිතව විෂයයන් සයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමර්ථවී ලබාගත් අ.පො.ස. (සා.පෙ.) සහතිකය.

(ii) වේගය—ලඝු ලේඛනය—විනාඩියකට වචන 60 කි. යතුරු ලිවීම—විනාඩියකට වචන 30 කි. (ඉංග්‍රීසි අතිරේක සුදුසුකමකි.)

(iii) වයස අවුරුදු 25 ත් 40 ත් අතර විය යුතුයි.

ලේකම්,
බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය.

1969 අප්‍රේල් මස 25 වැනි දින දීය,

## බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය—අනුරාධපුර

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය ප්‍රථමයෙන්) :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
5. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස :— අවුරුදු :————. මාස :————. දින :————.
6. පුරවැසි භාවය (උත්පත්තියෙන් ද ලියා පදිංචියෙන්ද යන වග) :————.
7. විවාහක/අවිවාහක බව :— විවාහක ද :————. අවිවාහක ද :————. දික්කසාද වී ද :————.

8. අධ්‍යාපනික පසු බිම :—

| ඉගෙනීම ලැබූ පාසල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් හා වර්ෂයන් | සිංහල | ඉංග්‍රීසි |
|---|---|---|---|
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :————.

10. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :————.

| ආයතනයේ නම | තත්ත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |

11. දැනට ලබන වැටුප :————.

12. විශේෂ සුදුසුකම් (හදරා ඇති ඉගෙනුම්/පුහුණුව පිළිබඳ විස්තර) :————.

13. නිර්දේශකයන් දෙදෙනා ගේ නම් හා ලිපිනයන් :

(1) :————.

(2) :————.

14. වෙනත් කරුණු :————.

15. (මෙම දැන්වීමේ තනතුරු සඳහා '' අවශ්‍ය සුදුසුකම් '' යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් ඔප්පු කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් ද, විශිෂ්ඨ චරිත ශුද්ධියක් ඇත්තකු හා මෙවැනි ආයතනයක තනතුරක් දැරීමට සර්වප්‍රකාරයෙන්ම සුදුසු බවට ලබා ගත් සහතික දෙකක පිටපත් ද අමුණා එවිය යුතුයි.)

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත් කර ගැනීමට පෙර ඔප්පු වුනි නම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බව ද තෝරා ගැනීමෙන් පසුව ඔප්පුවුනි නම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහ කරනු ලබන බව ද මම දනිමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

5-71—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ඊ 2/69.

## ලංකා පරිපාලන සේවයේ V වැනි පංතියට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය—1969

ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 23 ඡෙදය අනුව සීමිත තරඟ විභාගයක් 1969 අගෝස්තු මාසයේ දී හෝ ඊට නුදුරු දිනයකදී හෝ පවත්වනු ලැබේ. විභාගය නියත වශයෙන්ම පැවැත්වෙන දිනයන් පසුව දැනුම් දෙනු ලැබේ. මෙම විභාගය පොදු යහපත තකා අවලංගු කළ යුතු වේයයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැඟී ගියහොත් එසේ අවලංගු කිරීමේ බලය එම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම විභාගය කල්දැමීම අවශ්‍ය වේයයි පෙනී ගිය විටෙක එසේ කල් දැමීමේ බලයද රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

2. **පුරප්පාඩු සංඛ්‍යාව.**—(අ) දැනට ගණන් බලා ඇති අන්දමට මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව 15 කි. තවද, පොදු යහපත උදෙසා එසේ කළ යුතු යයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සැලකෙතොත්, පුරප්පාඩු අතුරෙන් කිසිවක් හෝ සියල්ලම හෝ නොපුරවා හැරීමට ද ඉඩ තිබේ.

(ආ) පත්වීම පිරිනමන අවස්ථාවේ දී බල පවත්වන රාජ්‍ය භාෂා රෙගුලාසි යටතේ, අපේක්ෂකයින්, පත් කිරීම සඳහා සුදුසුකම් ලබා නැතැයි සලකනු ලැබුවහොත්, විභාගයෙන් සමත්වන අපේක්ෂකයින් එක්කෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට හෝ පත්වීම් නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3. **අයදුම් කිරීමේ පිළිවෙළ.**—(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ කාර්යාලයෙන් ලබාගත යුතු ආකෘති පත්‍රවල වියයුතු අයදුම් පත් කොළඹ 1, තැපැල් පෙට්ටිය අංක 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් යන ලිපිනයට 1969 ජූනි මස 9 වැනි දින හෝ ඊට පළමු එම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය. එම දිනයට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(ආ) අයදුම් පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සෑම අයදුම් පතක් ම සෑම අයුරකින් ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර, අයදුම්පතේ ඇති සහතිකය ද අත්සන් කළ යුතු ය.

(ඇ) විභාගය සඳහා ගාස්තුව රුපියල් 50.00 කි. මෙම මුදල ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට කලින් VI වැනි අය භාර ශීර්ෂයේ 3 වැනි උප ශීර්ෂයේ (IV) වැනි විෂයට බැර කොට ළඟම පිහිටි කච්චේරියට හෝ කොළඹ මහ භාණ්ඩාගාරයට හෝ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා කච්චේරියෙන් හෝ මහ භාණ්ඩාගාරයෙන් හෝ ලබාගත් කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට අලවා එවිය යුතු ය. කවර හේතුවක් නිසාවත්, විභාගයෙන් ඉල්ලා අස් වන හෝ විභාගයට නොසිටින අපේක්ෂකයින්ට තමන් ගෙවූ විභාග ගාස්තුව සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට අයිතියක් නොමැතිය.

(ඈ) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු වේ.

(ඉ) අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද (ඒ සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම් කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම්පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

4. සීමිත තරඟ විභාගය සඳහා කිසිම අපේක්ෂකයෙකුට පස් වතාවකට වඩා පෙනී සිටිය නොහැකිය.

5. **සුදුසුකම්.**—මෙම විභාගය පහත සඳහන් වර්ගවලට අයත් නිලධාරින්ට සීමා වනු ඇත—

(අ) 1969 අප්‍රේල් මස 1 වැනි දිනට ආණ්ඩුව යටතේ අවුරුදු 15 ක ස්ථිර සේවයක් සම්පූර්ණ කළ හා එදිනට රු. 2,820 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලැබූ පහත සඳහන් ලිපිකරු සේවාවන්ට අයත් නිලධාරින් :—

- සාමාන්‍ය ලිපිකරු සේවය
- කොළඹ විදුලි බල සැපයීමේ ලිපිකරු සේවය
- විදුලි දෙපාර්තමේන්තුවේ ලිපිකරු සේවය
- ලංකා මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ ලිපිකරු සේවය
- රබර් පාලන ලිපිකරු සේවය
- තේ පාලන ලිපිකරු සේවය
- ආණ්ඩුවේ මුද්‍රණාලිය ලිපිකරු සේවය
- ආරෝග්‍යශාලා ලිපිකරු සේවය
- අධ්‍යාපන ලිපිකරුවන්
- වරාය ඉංජිනේරු ලිපිකරු සේවය
- දුම්රිය ලිපිකරු සේවය

(ආ) 1969 අප්‍රේල් මස 1 වැනි දිනට ආණ්ඩුව යටතේ අවුරුදු 10 ක ස්ථිර සේවයක් සම්පූර්ණ කළ හා එදිනට රු. 3,300 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලැබූ පහත සඳහන් දෙපාර්තමේන්තු ශ්‍රේණිවලට අයත් නිලධාරීන් :—

| දෙපාර්තමේන්තුව | | තනතුර |
|---|---|---|
| ගොවි ජන සේවා | ... | ප්‍රාදේශීය නිලධාරීන්. |
| සමාජ සේවා | ... | මහළුන් හා දුබලුන් සඳහා වූ රජයේ නිවාසවල අධිකාරීන් ; සමාජ සේවා නිලධාරීන්. |
| සමුපකාර | ... | සමුපකාර සමිති පරීක්ෂකවරු. |
| කම්කරු | ... | කම්කරු නිලධාරීන්, රැකීරක්ෂා කාර්යාලයේ කළමනාකරු ; වේතන මණ්ඩලයේ ලේකම්. |
| පළාත් පාලන | ... | පරීක්ෂකවරුන් ; ගම්බද වැඩ අධිකාරීන් ; විමර්ශන නිලධාරීන්. |
| අලෙවි කිරීම | ... | ප්‍රාදේශීය අලෙවි කිරීමේ නිලධාරීන් ; අලෙවි කිරීමේ නිලධාරීන් ; කළමනාකරුවන්. |
| ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | ... | 1 වැනි ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ; ග්‍රාම සංවර්ධන ජ්‍යෙෂ්ඨ පරිපාලකවරුන් ; පේෂකර්ම සහකරුවන් ; ග්‍රාම සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාරවරුන් ; කර්මාන්ත සහකරුවන් ; ග්‍රාම සංවර්ධන සහකරුවන්. |
| ආහාර | ... | ආහාර හා මිල පාලන පරීක්ෂකවරුන් ; වාර්මස් ධාන්‍යාගාරයේ නිවාරණ නිලධාරීන් ; ධාන්‍ය සමීක්ෂක. |
| ඉඩම් කොමසාරිස් | ... | ජන පද නිලධාරීන් ; ඉඩම් කට්ටි පරිපාලකවරුන් ; කච්චේරි මිනින්දෝරුවන්. |
| මෝටර් රථ ගමනාගමන | ... | මෝටර් රථ පරීක්ෂකවරුන්. |
| මහා භාණ්ඩාගාරය | ... | විමර්ශන නිලධාරීන්. |
| ආගමන හා විගමන | ... | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් ; බලයලත් නිලධාරීන්. |
| තේ පාලන | ... | දිස්ත්‍රික් ක්ෂෙත්‍ර නිලධාරීන් ; උපදේශක/පරීක්ෂකවරුන්. |
| සෞඛ්‍ය | ... | රෝහල් ලේකම්වරුන් ; කොළඹ රෝහල් මණ්ඩලයේ ලේකම්. |
| පරිවාස හා ළමාරක්ෂක සේවා | ... | ප්‍රධානාචාර්යවරුන් ; ප්‍රධානාචාරිනීන් ; ශිෂ්‍ය නිවාස ආචාර්යවරුන් ; ශිෂ්‍ය නිවාස ආචාරිනීන් ; පරිවාස නිලධාරීන්; භාරකරුවන්. |
| ආයුර්වේද | ... | රෝහල් ලේකම්. |

(ඇ) කෙසේ නමුත් මෙම විභාගයේ තරඟ කිරීමට වෙන කවර නිලධාරියෙකුට හෝ අවසර දීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

6. **හැඳුනුම් පත්.**—අපේක්ෂකයින් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයක් සඳහා විභාග ශාලාවේ දී පරිපාලක ගේ තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවරක් වුව පිළිගනු ඇත:—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්.

(ආ) මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක්.

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායාරූපය අඩංගු කිසියම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අන්කිසි ලියවිල්ලක්.

7. **වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම්.**—මේ විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙක් ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර විභාගය පැවැත්වෙන අතර, ඊට පසු යන කවර අවස්ථාවක දී වුව ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් ඔහුගේ දැනුම පරිදි වැරදි බව පෙනී යන ලද නම්, හෝ ඔහු විසින් ස්වඩ්‍යාශයෙන් ම කිසියම් වැදගත් කරුණක් වසන කරන ලද නම් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

8. (අ) **විභාග පරිපාටිය.**—අපේක්ෂකයින් පහත සඳහන් විෂයයන්ට පෙනී සිටිය යුතු ය :—

| | අනිවාර්යය විෂයයන් | ලකුණු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | වාක්‍ය රචනය (පැය දෙකයි) ... ... ... ... | 150 යි |
| 2. | සාරාංශ ලිවීම (පැය එකයි) ... ... ... ... | 50 යි |
| 3. | වත්මන් තතු (පැය එකයි) ... ... ... ... | 100 යි |
| 4. | සාමාන්‍ය දැනීම (පැය දෙකයි) ... ... ... ... | 100 යි |
| 5. | විශේෂයෙන් වර්තමාන ලංකාව ආශ්‍රිතව, ලංකාවේ සමාජ, දේශපාලන හා ආර්ථික සංවර්ධනය (පැය දෙකයි) ... ... ... ... | 100 යි |
| 6. | වාචික පරීක්ෂණය ... ... ... ... <br> වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයෙන් සෑහෙන උසස් තත්ත්වයක් ලබා ගන්නා අපේක්ෂකයින් පමණකි. | 200 යි |
| 7. | වෛකල්පික විෂය ... ... ... ... | 100 යි |

**වෛකල්පික විෂයයන්.**— පහත සඳහන් වෛකල්පික විෂයයන් ගෙන් එකක් අපේක්ෂකයින් විසින් තෝරාගත යුතු ය. විශේෂයෙන් ම ලංකාව ආශ්‍රිතව සකස් කරනු ලබන මෙම වෛකල්පික ප්‍රශ්න පත්‍රයට කාලසීමාව පැය දෙකකි. මෙම ප්‍රශ්න පත්‍රයේ විෂය ප්‍රමාණයට වැටෙන ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා සංයුක්ත මණ්ඩලවල ක්‍රියා කාරිත්වය හා ගැටළු පිළිබඳ ව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කර බැලීම සඳහා මෙකී ප්‍රශ්න සකස් කර ඇත.

1. කර්මාන්ත, වෙළඳ හා වාණිජ කටයුතු.
2. මහජන මුදල්.
3. කෘෂිකර්මය හා සමුපකාරය.
4. වත්මන් ලංකාවේ ආණ්ඩු ක්‍රමය.
5. අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු.
6. සෞඛ්‍ය, කම්කරු හා සමාජ සේවා.
7. ගමනා ගමන හා මහජන සේවා.
8. ලංකාවේ නීති ක්‍රමය සහ කොන්ත්‍රාත් හා සිවිල් වැරදි පිළිබඳ නීතිය හෝ පුද්ගලයන් හා දේපල පිළිබඳ නීතිය.
9. සාමාන්‍ය විද්‍යාව.

සැලකිය යුතුය.—අපේක්ෂකයින්ට සහයක් වශයෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු පහත සඳහන් වෛකල්පික විෂයයන් අනුව, සාමාන්‍ය වශයෙන් බෙදු ඇත.

1. **කර්මාන්ත, වෙළඳ හා වාණිජ කටයුතු.**—වාණිජ, ආනයන හා අපනයන ; කර්මාන්ත, වෙළඳ නැව්, භූ විද්‍යා සමීක්ෂක, ලුනු, වෙළඳ සමාගම් ලියා පදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්, ධීවර, කුඩා කර්මාන්ත යන දෙපාර්තමේන්තු.

2. **මහජන මුදල්.**—භාණ්ඩාගාරය, ආණ්ඩුවේ ගබඩා, දේශීය ආදායම්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන, ජාතික ක්‍රම සම්පාදන, විශ්‍රාම වැටුප් මහජන ණය මුදල්, ණය මණ්ඩලය, ආණ්ඩුවේ මුද්‍රණාලය, ජාතික මුදල් ඉතිරි කිරීම, අර්ථ සාධක අරමුදල්, රේගු යන දෙපාර්තමේන්තු.

3. **කෘෂිකර්මය හා සමුපකාරය.**—ඉඩම්, මැනුම්, වන සංරක්ෂණ, වාරිමාර්ග, වන සත්ව, සත්වෝද්‍යාන, කෘෂිකර්ම, ආහාර, සමුපකාරය, ගොවිජනසේවා, අලෙවි කිරීම, පොල් වැවීම, නහා සිටුවීම, තක්සේරු යන දෙපාර්තමේන්තු.

4. **වත්මන් ලංකාවේ, ආණ්ඩුක්‍රමය.**—කැබිනට් කාර්යාලය, උත්තර මන්ත්‍රණ සභාව, මහජන මන්ත්‍රී මණ්ඩලය, ගණන් පරීක්ෂක, මැතිවරණ, ප්‍රාදේශීය පාලන, පලාත් පාලන, ග්‍රාම සංවර්ධන, උඩරට ගැමි කොමිෂන් සභාව, නගර හා ග්‍රාම නිර්මාන, රෙජිස්ට්‍රාර් ජනරාල්, පොලිසිය, සුරාබදු, විදේශ කටයුතු, ආගමන හා විගමන, සන්නද්ධ සේවා යන දෙපාර්තමේන්තු.

5. **අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු.**—අධ්‍යාපන, කාර්මික විද්‍යාල, විභාග, කාලගුණ විද්‍යාව, ශ්‍රී ලංකා ජාතික කලායතනය, සංස්කෘතික කටයුතු, රාජ්‍ය ලේඛනාරක්ෂක, ජාතික කෞතුකාගාරය, පුරා විද්‍යා, මූලික අභ්‍යාස කාර්මික ආයතනය සහ ප්‍රවෘත්ති යන දෙපාර්තමේන්තු.

6. **සෞඛ්‍ය කම්කරු හා සමාජ සේවා.**—සෞඛ්‍ය, නිවාස, ආයුර්වේද, කම්කරු, සමාජ සේවා, පරිවාස හා ළමා රක්ෂක සේවා, බන්ධනාගාර යන දෙපාර්තමේන්තු.

7. **ගමනා ගමන හා මහජන සේවා.**—රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ, මෝටර් රථ, දුම්රිය, සිවිල් ගුවන් සේවා, වරාය කොමිෂන් සභාව, වෙරළ ආලෝක, ජල සම්පාදන හා ජලාපවහන සහ විදුලි බල යන දෙපාර්තමේන්තු.

8. **ලංකාවේ නීති ක්‍රම.**— උසාවි, පිස්කල්, සහනදායක මණ්ඩල, අල්ලස් කොමසාරිස්, ආණ්ඩුවේ රස පරීක්ෂක, මහා භාරකාර යන දෙපාර්තමේන්තු සහ මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාධාර භාරකාර මණ්ඩල.

8. (ආ) **විභාග මාධ්‍යය.**—මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයින් ප්‍රශ්න වලට, තමන් සේවයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/වාචික පරීක්ෂණය සමත් වූ භාෂා මාධ්‍යයෙන් උත්තර සැපයිය යුතුය. කෙසේ වෙතත්, සඳහන් කර ඇති සුදුසුකම් ලැබීමේ විභාගය, සිංහලෙන් හැර වෙනත් මාධ්‍යයකින් සමත් වී ඇති විටක දී මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවලට රාජ්‍ය භාෂාවෙන්, එනම්, සිංහලෙන් උත්තර සැපයීමට කැමති නම්, අපේක්ෂකයින්ට පුළුවන.

අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පසු සඳහන් කර ඇති භාෂා මාධ්‍යයේ හෝ තෝරාගෙන ඇති විෂයයන්වල හෝ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ පළවැනි කොටසේ, දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලනු මැනවි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

5–72—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය.

---

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති)—1969

**පුහුණුව සඳහා පාඨමාලා.**—(i) එක් එක් පාඨමාලාව සඳහා පුහුණුවීමේ කාලය අවුරුදු දෙකකි. පුහුණුවීමේ කාලය තුළදී තමන්ගේ ගති පැවතුම් පිළිබඳ හෝ අධ්‍යායන කෞශල්‍යය පිළිබඳ හෝ ගුරු විද්‍යාලයේ ප්‍රධානියා තෘප්තිමත් නොකරන ශිෂ්‍යයෝ පුහුණු වීමෙන් අස්කරනු ලැබෙත්. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් සතුය.

(ii) ගුරු විද්‍යාලයක පුහුණුව ලබන ශිෂ්‍යයෙකුට අන්‍ය වූ බාහිර පන්තියක ඉගෙනීමට හෝ බාහිර විභාගයක් ගැනීමට සාමාන්‍යයෙන් අවසර නොලැබේ. එහෙත් එවැනි ශිෂ්‍යයන්ට පළමු අවුරුද්ද තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයකදී උපරිම වශයෙන් විෂයයන් තුනකටද, වර්ෂ දෙකම ඇතුළතදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයකදී උපරිම වශයෙන් විෂයයන් දෙකකටද පෙනී සිටීමට විද්‍යාලයාධිපතීන්ගේ අභිමතය පරිදි ඉඩ දිය හැක. පුහුණුවන ශිෂ්‍යයන්ට ඉහත සඳහන්, විභාගවලදී පෙනී සිටීමට ඉඩ දෙනු ලබන්නේ ගුරු විද්‍යාලයයේ දී හදරන විෂයයන් සඳහා පමණි. (මෙම විභාගවලදී ගත හැකි විෂයයන් ගණන විද්‍යාලයාධිපතීන් විසින් තීරණය කරනු ලැබේ. මෙම විභාගවලින් සමත්වීම විද්‍යාලයේ කෙරෙන වැඩවල හෝ ගුරු විද්‍යාලයීය අවසාන විභාගය අසමත් වීම පිළිබඳ අඩුපාඩු පිරිමැසීමක් වශයෙන් හෝ වෙනයම් අනුග්‍රහයක් ලැබීමට සුදුසුකමක් වශයෙන් හෝ සලකනු නොලබන බැව් ශිෂ්‍යයන් තරයේ සිතට ගත යුතුය). පුහුණුව ලබන කාලය තුළදී උපාධි පරීක්ෂණ විභාගයකට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

2. **ඇතුළු කර ගැනීම.**—(i) මේ පාඨමාලා පහත සඳහන් වර්ගවල අයදුම්කරුවන් සඳහා නොවේ. එවැනි අය මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්පත් නොඑවිය යුතුය. එවැනි අයකු ගුරු විද්‍යාලයකට ඇතුළු කරගනු ලැබුවහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය පුහුණුව ලැබීමට පෙර හෝ ලබන අතර හෝ ඉන් පසුව හෝ අවලංගු කරනු ලැබේ :—

(ඒ) ගුරු විද්‍යාලයක පුහුණුව ලබමින් සිටින අය.

(බී) රජයේ හෝ ආධාර ලබන ගුරු විදුහලක පුහුණුව ලබා ඇප ඔප්පුවේ සඳහන් මුළු කාලය අවුරුදු 8ක් නම්, එයින් යටත් පිරිසෙයින් අවුරුදු 5ක් හෝ ඇප ඔප්පුවේ සඳහන් මුළු කාලය අවුරුදු 5ක් නම් එයින් යටත් පිරිසෙයින් අවුරුදු 3ක් හෝ 1970.1.1 වන විට සම්පූර්ණ කර නැති අය.

(සී) පහත 4 (බී) හි සඳහන් කරන ලද විශේෂ පන්තියක මින් පෙර කවකලෙක හෝ පුහුණුවක් ලත් අය.

(ඩී) විභාගයට ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය වන විට තමන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන පාඨමාලාව සඳහා අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සියල්ලම 7 වැනි ඡේදයෙහි සඳහන් වූ අන්දමට නොමැති අය.

(ii) පුහුණුව ලබන දෙවර්ෂය තුළ ලබන සියළු දීමනා ඇතුළු සම්පූර්ණ පඩිය සහ දෙවර්ෂයක පුහුණුව සඳහා වැය වන සම්පූර්ණ මුදලට සමාන වටිනාකමක් ඇති බැඳුම්කරයකට ඇතුළත්වීම සඳහා අවශ්‍ය සියළුම ලියකියවිලි සෑම අයදුම්කරුවකු විසින් ම ගුරු විදුහලට ඇතුළුවී සති දෙකක් ඇතුළත විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතු අතර එම බැඳුම්කරයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් විය යුතු වේ.

(ඒ) පුහුණුව ලබන කාලය තුළ දේශපාලන කටයුතුවලට සහභාගී නොවීම.

(බී) කවර හේතුවක් නිසා හෝ පුහුණුවීමේ පාඨමාලාව හැදෑරීම අත් නොහැරීමට.

(සී) පුහුණුවීමේ පාඨමාලාව හැදෑරීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහු/ඇය පත් කරනු ලබන පාසැල්වල ගුරුභවතෙකු වශයෙන් නොකඩවා අවුරුදු අටක් සේවය කිරීම. (පෞද්ගලික පාසල් ගුරු භවතුන්, එම පාලනය යටතේ පවතින පාසැල්වල හෝ රජයේ පාසැල්වල නොකඩවා අවුරුදු 8ක් සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තුව සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය).

(ඩී) බැඳුම්කරයේ නියමිත සේවා කාලය අවසන් වන තුරු හා එහි සඳහන් සියළු බැඳීම්වලින් නිදහස් වනතුරු අන් තනතුරක් සඳහා හෝ අමතර අධ්‍යයන නිවාඩු සඳහා හෝ ඉල්ලුම් නොකිරීම.

3. **වැටුප්.**—පාඨමාලාව සතුටුදායක ලෙස සම්පූර්ණ කළ ශිෂ්‍යයන්ට පත්වීම් ලැබුණු පසු ගෙවනු ලබන්නේ ද්විතීය පුහුණු වූ ගුරුවරුන්ට ගෙවනු ලබන වැටුප් පරිමානය වේ. එහෙත් මෙම ගුරුවරුන් ඔවුන් පුහුණුව ලැබූ විෂයයන් සතියකට පැය 10ක් වත් ඉගැන්විය යුතුය.

4. (ඒ) මේ පරීක්ෂණ පිළිබඳ ව්‍යවස්ථා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව සකස් කරන ලදී. විභාග කොමසාරිස් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් මේ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(බී) පහත සඳහන් විශේෂ පාඨමාලා මහරගම හා පලාලි ගුරු විද්‍යාලවල පවත්වනවා ඇත :—

1. ඉංග්‍රීසි
2. ගණිතය
3. විද්‍යාව
4. හස්ත කර්මාන්තය
5. වාණිජ්‍යය
6. ගෘහ විද්‍යාව (කාන්තාවන්ට පමණයි).

ඉංග්‍රීසි පාඨමාලාව හැර ඉහත සඳහන් අනිකුත් පාඨමාලා සිංහල මාධ්‍යයෙන් මහරගම ගුරු විද්‍යාලයේදී ද, දෙමළ මාධ්‍යයෙන් පලාලි ගුරු විද්‍යාලයේදී ද, පැවැත්වේ. ඉංග්‍රීසි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන්ම මහරගම හා පලාලි ගුරු විද්‍යාලයයන්හි පවත්වනවා ඇත.

(සී) සිංහල භාෂාව/දෙමළ භාෂාව සහිත පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ සිංහල භාෂාව/දෙමළ භාෂාව විෂයයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයකදී සාමාර්ථය නොලත් කිසිම අයදුම්කරුවෙක් සිංහල/දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන කිසියම් පන්තියකට ඇතුළු වීමට සුදුසු නොවේ. ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ගුරුවරුන්ට පමණක් සිංහල භාෂාව/දෙමළ භාෂාව වෙනුවට පහළ සිංහල/පහළ දෙමළ පිළිගන්නවා ඇත.

(ඩී) අයදුම්කරුවෙකුට එක පාඨමාලාවකට හෝ ඊට වැඩි ගණනකට ඇතුළුවීමට එකවර ඉල්විය හැකිය. එහෙත්, ඉල්ලුම් කළ එක් එක් පාඨමාලාව සඳහා ඇති සුදුසුකම් සම්පූර්ණ කර සිටිය යුතුය. හස්තකර්මාන්ත පාඨමාලාව සඳහා අයදුම්කරුවන් සෑහෙන ගණනක් සුදුසුකම් ලබා නැත්නම් ගණිතය සහ විද්‍යා පන්ති සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට එම පුරප්පාඩු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් පරිනමනවා ඇත.

5. **පරීක්ෂණය පවත්වන දිනය.**—මෙම පරීක්ෂණය 1969 අගෝස්තු මස 13 වැනි බදදා ආරම්භ වේ.

6. **විභාග ස්ථාන**

(i) කොළඹ, ගම්පහ, කළුතර, මීගමුව, නුගේගොඩ, පානදුර, පිළියන්දල අනුරාධපුර, මඩකලපුව, ගොඩකවෙල, කෑගල්ල, රත්නපුර, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, බදුල්ල, කුරුණෑගල, වාවුනියාව, ඉල්ලාවලෙල, යාපනය, කෝපායි, පේදුරුතුඩුව හා පුත්තලම.

(ii) තමන්ට අභිමත මධ්‍යස්ථාන එකකට වැඩි ගණනක් අයදුම්කරුවන් විසින් තෝරාගත යුතුය. අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඇතුළු නොවන කවර මධ්‍යස්ථානයක් වුවත් අවලංගු කරනු ලැබේ.

(iii) අයදුම්කරු විසින් තෝරා ගෙන තිබෙන මධ්‍යස්ථානයක් සාමාන්‍යයෙන් වෙනස් කරනු නොලැබේ. එහෙත් ගුරුවරයෙකු දුර බැහැර ස්ථානය කට මාරු කරණු ලැබීම වැනි විශේෂ අමාරුකම් ඇති වූ විට කල් ඇතිව දැනුම් දීමක් ලද හොත් ඒ ගැන සලකා බලනු ලැබේ.

7. **සුදුසුකම්**

**(ඒ) සාමාන්‍ය සුදුසුකම්**

සෑම අයදුම්කරුවෙක්ම—

(i) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

(iii) පහත දැක්වෙන වයස් සීමා තුළ සිටිය යුතුය :—

(ඒ) ගුරුවරුන්ට (8 වන ව්‍යවස්ථාව බලන්න). ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 18 ට වැඩි එහෙත් අවුරුදු 45 ට අඩු.

(බී) අවශේෂ අයට ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 18ට වැඩි එහෙත් අවුරුදු 32 ට අඩු.

(iv) ඉහත 4 (සී) ව්‍යවස්ථාවෙහි සඳහන් සිංහල/දෙමළ භාෂා පිළිබඳ සුදුසුකම් සම්පූර්ණ කර සිටිය යුතුය.

(v) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමර්ථ ලබා සිටිය යුතුය.

ඉංග්‍රීසි පාඨමාලාව සඳහා නම් අංක ගණිතය/වාණිජ අංක ගණිතය හෝ ගණිතය විෂයයෙන් සාමර්ථ්‍යයන් ලැබීම අනිවාර්ය නොවේ.

**(බී) විශෙෂ සුදුසුකම්**

**සටහන.**—(1952 දෙසැම්බරයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ආරම්භ කිරීමට පෙර පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයක දී තනි විෂයකින් ලබා ඇති සාමර්ථ්‍ය පිළිගනු නො ලැබේ).

**(ඒ) ඉංග්‍රීසි පාඨමාලාව සඳහා**

(i) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් සහිතව ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය, හෝ

(ii) ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සාමර්ථ්‍යයන් සහිතව ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය, හෝ

(iii) ඉංග්‍රීසි භාෂාව " අ " නිර්දේශය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක්, හෝ

(iv) ඉංග්‍රීසි භාෂාව " අ " නිර්දේශය හා ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයන්, හෝ

(v) ඉංග්‍රීසි භාෂාව " අ " නිර්දේශය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් හා ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සාමාන්‍ය සමර්ථ්‍යයක්, හෝ

(vi) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සාමර්ථ්‍යයක්, හෝ

(vii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ ඊට සමාන විභාගයකදී විද්‍යා/ගණිතය හා භාෂා (ලතින් නොව) හැර අන් විෂයයන් දෙකකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබන ලද සාමර්ථ්‍යයන්.

**(බී) ගණිත පාඨමාලාව සඳහා**

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී—

(අ) ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය යන විෂයයන් අතුරෙන් දෙකක්, හෝ

(ආ) ඉහත සඳහන් විෂයයන් එකකින් සම්මාන සාමර්ථ්‍යයක් හා භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් සාමර්ථ්‍යයන්, හෝ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ශුද්ධ ගණිතයෙන් හෝ ව්‍යවහාරික ගණිතයෙන් සාමර්ථ්‍යයක්.

**(සී) විද්‍යා පාඨමාලාව සඳහා**

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී—

(අ) ගණිතය සමඟ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජීව විද්‍යාව, යන විෂයයන් අතුරෙන් විෂයයන් තුනක්. එහෙත් උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව සමඟ ජීව විද්‍යාව පිළිගනු නොලැබේ. මෙම විෂයයන්ගෙන් එකක් සඳහා සම්මාන සාමර්ථ්‍යයක් තිබිය යුතුය, හෝ

(ආ) භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ලබන ලද සාමර්ථ්‍යයන්.

**(ඩී) හස්ත කර්මාන්ත පාඨමාලාව**

**පිරිමින් සඳහා**

පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් සාමර්ථ තුනෙන් දෙකක්—

(අ) ලී වැඩ සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ආ) ලෝහ වැඩ සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ඇ) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක්.

**කාන්තාවන් සඳහා** පහත සඳහන් සාමර්ථ තුනෙන් දෙකක්—

(අ) විවීම සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ආ) මැටි ශිල්පය සඳහා සම්මාන සාමර්ථ්‍යයක්,

(ඇ) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම හෝ චිත්‍ර කර්මය සඳහා සාමර්ථ්‍යයක්.

සටහන.—(1) අධ්‍යයන පොදු සහතික පත්‍රයක හෝ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයක අදාළ කර්මාන්තය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් වෙනුවට ලංකා කාර්මික විද්‍යාලයයේ කර්මාන්ත ගුරු සහතිකය හෝ අවශ්‍ය කර්මාන්තය පිළිබඳව රජයේ ලලිත කලායතනයේ තුන් අවුරුදු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම නිසා දෙනු ලබන සහතිකය පිළගනු ලැබේ. එහෙත් මෙම සහතික ඉහත 7(v) වැනි ඡේදයේ දී ඇති සාමාන්‍ය අවශ්‍යතාවන් වන විෂයයන් හය හෝ පාඨශාලා සහතිකය සම්පූර්ණ කිරීම සඳහා හෝ පිළිගනු නොලැබේ.

සටහන.—(2) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ලංකා කාර්මික විද්‍යාලයයේ හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාලවල හෝ ජාතික සහතික දරන්නන් එම සහතිකවල ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම, ලී වැඩ හෝ ලෝහ වැඩ, විවීම හෝ මැටි ශිල්පය සඳහන්ව ඇත්නම් ඉහත දී ඇති ව්‍යවස්ථාවල සඳහන් එම විෂයයන්ගෙන් නිදහස් කරනු ලැබෙත්.

**(ඊ) වාණිජ පාඨමාලාව සඳහා**

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී—

(අ) පහත සඳහන් විෂයයන් අතුරෙන් දෙකකින් සම්මාන සාමර්ථ්‍යයන් :—

වාණිජ අංක ගණිතය, ගණකාධිකරණය, වාණිජ විද්‍යාමූල ධර්ම,

(ආ) ගණකාධිකරණය,

(ඇ) පහත සඳහන් විෂයයන් අතුරෙන් දෙකකින් සාමර්ථ්‍යය :—

වාණිජ විද්‍යා මූල ධර්ම, අර්ථ ශාස්ත්‍රය, වාණිජ අංක ගණිතය, ලඝු ලේඛනය හා ටයිප් ගැසීම (ලඝු ලේඛනය හා ටයිප් ගැසීම එක් විෂයයක් සේ සලකනු ලැබේ.), හෝ

(ii) ලංකා කාර්මික විද්‍යාලයයේ පොත් තබන්නන් සඳහා වූ වාණිජ සහතිකය හෝ ලංඩන් වාණිජමණ්ඩල සහතික (උසස් හෝ පහළ), හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයයේ ලඝු ලේඛන ටයිප් ගසන්නන් සඳහා වාණිජ සහතිකය හෝ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ ලඝු ලේඛන ටයිප් ගසන්නන්ගේ සහතිකය (උසස් හෝ පහළ) සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණකාධිකරණය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී ගණකාධිකරණය සඳහා සාමර්ථ්‍යයක් ලබා සිටිය යුතුය.

(iv) වාණිජ සහතික පත්‍ර විභාගයේ (විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන) පොත් තබන්නන්ගේ කොටසින් හෝ එම විභාගයේ ලඝු ලේඛක යතුරු ලියන්නන්ගේ කොටසින් හෝ සමත් වී තිබිය යුතු අතර අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණකාධිකරණය සඳහා සාමර්ථ්‍යයක් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී ගණකාධිකරණය සඳහා සාමර්ථ්‍යයක් ලබා සිටිය යුතුය, හෝ

(v) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ගණකාධිකරණය සහ වාණිජ්‍ය හා මුදල් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී වාණිජ අංක ගණිතය හෝ ආර්ථික විද්‍යාව හෝ ලඝු ලේඛනය හා ටයිප් ගැසීම යන විෂයයන්ගෙන් එකකින් සාමර්ථ්‍යය (ලඝු ලේඛනය හා ටයිප් ගැසීම එක් විෂයයක් සේ සලකනු ලැබේ).

එෆ්. ගෘහ විද්‍යා පාඨමාලාව සඳහා

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී :—

(අ) ගෘහ විද්‍යාව (සම්මාන) හෝ ගෘහ කර්මය (සම්මාන)

(ආ) මැහුම් වැඩ (සම්මාන) හෝ ගෘහ කර්මය (සම්මාන)

(ඇ) පහත සඳහන් එක් විෂයයකින් සාමර්ථ්‍යය ලබා තිබීම සෞඛ්‍ය හා ශාරීරික විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, හෝ

(ii) පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් වලින් එකක් :—

(අ) ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය,

(ආ) ජ්‍යෙෂ්ඨ විභාගයෙන් පසු ගෘහ විද්‍යාව පිළිබඳ දෑවුරුදු පාඨමාලාවක් හදරා පිළිගත් ආයතනයකින් ප්‍රදානය කරන ලද ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය.

(ඇ) කුණ්ඩසාලේ කාන්තා ගොවිකම් පාසලේ දෑවුරුදු පාඨමාලාවකින් පසු ප්‍රදානය කරන ලද ග්‍රාමීය ගෘහ පාලනය පිළිබඳ සහතිකය.

8. අංක 7 (ඒ) (iii) (ඒ) ව්‍යවස්ථාවේ අවශ්‍යතාවයන් සඳහා මෙම විභාගයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේදී රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක පිළිගත් ආචාර්‍ය මණ්ඩලයකට අයත් අය ගුරුවරුන් වශයෙන් සළකනු ලැබේ. පිළිගත් පාසලක ස්ථිර ගුරු මණ්ඩලයකට අයත් සාමාන්‍ය පන්තිවල පැය 20 ක් උගන්වන ගුරුවරුන් ද, ගුරුවරුන් වශයෙන් සලකනු ලැබේ. මේ සඳහා පහත සඳහන් වර්ගවලට අයත් පාසල් පිළිගත් පාසල් සේ සලකනු ලැබේ :—

(අ) 1951 දී ගාස්තු අය කරන පාසල් බවට පත්වූ ආධාර ලබන පාසල්,

(ආ) 1960.12.1 දින සිට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත්වූ i වැනි හා ii වැනි ශ්‍රේණියේ පාසල් මෙම ගණයට අයත් ගුරුවරුන් විසින් පුහුණු වන කාල සීමාව ඇතුළත දී නව පාසල් කළමනාකරුවන් විසින් වැටුපක් හෝ දීමනාවක් ගෙවන බවට ද පුහුණු වූ පසු එම කළමනාකාරත්වය යටතේ පත්වීමක් දෙන බවට ද ප්‍රතිඥාවක් සහිත ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

9. **විභාග පරිපාටිය.**—(ඒ) ලිඛිත හා සම්මුඛ පරීක්ෂණය වශයෙන් මෙම විභාගය කොටස් දෙකකින් සමන්විතය. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව තෝරාගත් අය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබෙත්.

**සටහන.**—ඉංග්‍රීසි පාඨමාලාව සඳහා තරඟ කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් යුක්තය :—

(i) **බුද්ධි පරීක්ෂණය**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ. ½ යි. ලකුණු 100යි. සැම අයදුම්කරුවන්ටම.

(ii) **ඉංග්‍රීසි භාෂාව හා රචනය**—පැ. 1½ බැගින් වූ ප්‍රශ්නපත්‍ර දෙකකි. ලකුණු 200යි. ඉංග්‍රීසි පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට.

(iii) **ගණිතය**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 2ක ප්‍රශ්න පත්‍ර දෙකකි. ලකුණු 200යි. ගණිත පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(iv) **විද්‍යාව**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3යි. ප්‍රශ්නපත්‍ර දෙකයි. ලකුණු 200යි. විද්‍යා පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(v) **වාණිජ විද්‍යාව**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ 3යි. ප්‍රශ්නපත්‍ර දෙකයි. ලකුණු 200යි. වාණිජ පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(vi) **හස්ත කර්මාන්ත**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ. 3යි. ලකුණු 200 යි. හස්ත කර්මාන්ත පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට.

(vii) **ගෘහ විද්‍යාව සහ මැහුම් වැඩ**—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ. 3යි. ලකුණු 200යි. ගෘහ විද්‍යා පාඨමාලාවට ඇතුළුවීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහාය.

(බී) ඉංගිසි භාෂාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණන් තැබීම, වාණිජ ශාස්ත්‍රීය මූලධර්ම පිළිබඳ නිර්දේශයන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ මෙනි. එහෙත් ඊට වඩා උසස් තත්ත්වයක ප්‍රශ්න දෙනු ලැබේ.

(i) **ඉංග්‍රීසි**—භාෂාව හා රචනය පිළිබඳ නියමිත පොත් නැත.

(1) වන පත්‍රය : ඉංග්‍රීසි රචනය සහ සාරාංශය—පැ 1½යි.

(2) වන පත්‍රය : ඉංග්‍රීසි භාෂාව පැය 1½යි.

(ii) **ගණිතය**—i වන පත්‍රය විජ ගණිතය හා ත්‍රිකෝණමිතිය.
ii වන පත්‍රය ජ්‍යාමිතිය.

(iii) **විද්‍යාව**—මේ පිළිබඳ ප්‍රශ්නපත්‍රවල භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් පිළිබඳ ප්‍රශ්න දෙනු ලැබේ. සුදුසුකම් ඇති සැම අයදුම්කරුවෙකුටම වුවමනා ප්‍රශ්න ගණනට උත්තර සැපයීමට හැකි වන පරිදි මේ ප්‍රශ්න පත්‍ර දෙකම එකවර දෙනු ලැබේ.

(iv) **වාණිජ විද්‍යාව** පිළිබඳ ප්‍රශ්නපත්‍රවල ගණන් තැබීම හා වාණිජ ශාස්ත්‍රීය මූලධර්ම පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ. මේ විෂයයන් දෙකෙන් එකක් පමණක් උගත් අයදුම්කරුවෙකුට වුව ද අවශ්‍ය ප්‍රශ්න ගණනට උත්තර සැපයිය හැකි වන පරිදි මේ ප්‍රශ්නපත්‍ර දෙකම එකවර දෙනු ලැබේ.

(v) **හස්ත කර්මාන්ත** ප්‍රශ්න පත්‍රයෙහි ලෝහ වැඩ සහ ලී වැඩ ගැන ප්‍රශ්න ඇතුළත් වේ. මින් එකක් ඉගෙන ගත් අයදුම්කරුවකු වුවද අවශ්‍ය ප්‍රශ්න ගණනට උත්තර සැපයීමට හැකි වනු ඇත.

(vi) **ගෘහ විද්‍යාව හා මැහුම් වැඩ** පිළිබඳ ප්‍රශ්නපත්‍රයෙහි සූප ශාස්ත්‍රය, පෝෂණය, වස්ත්‍ර හා මැහුම් වැඩ, ගෘහ පාලනය, රෙදි සේදීම හා මාතෘ කර්මය ගැන ප්‍රශ්න ඇතුළත් වේ.

(සී) මේ ප්‍රශ්නපත්‍ර දෙනු ලබන්නේ ඒ ඒ විෂය සමග සඳහන් කළ මාධ්‍යයන්ගෙනි. ඉන් කැමති මාධ්‍යයකින් උත්තර සැපයීමට අයදුම්කරුට ඉඩ ඇත. ඉංග්‍රීසි පාඨමාලාවට පෙනී සිටින අයදුම්කරුවන් බුද්ධි පරීක්ෂණය ප්‍රශ්නපත්‍රයට උත්තර සැපයිය යුත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

10. **විභාගයට ඇතුළු කර ගැනීම.**—(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියළුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවකු එසේ ඇතුළත් කිරීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන්නේය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසු හෝ සම්මුඛ පරීක්ෂණයෙහි දී හෝ අභ්‍යාස විද්‍යාලයකට ඇතුළත් වී පුහුණුව ලබමින් සිටිය දී හෝ පුහුණුව ලැබුවායින් පසු හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ හෝ අවශ්‍ය තොරතුරු නොදී සඟවන හෝ වැරදි තොරතුරු සපයන අයදුම්කරුවකුගේ හෝ විභාග අපේක්ෂකත්වය හෝ පුහුණුව හෝ අවලංගු කරනු ලැබේ. එවැනි අයදුම්කරුවකු විසින් ලබාගත් පුහුණු සහතිකය ද අවලංගු කරනු ඇත. වංචනික ලෙස ක්‍රියාකර ඇති අයදුම්කරුවන්ට ජීවිතාන්තය දක්වා ගුරු වෘත්තියට ප්‍රවිෂ්ට වීමට අවකාශ ලැබෙන කිසියම් විභාගයකට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11. **පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලීම්.**—(i) මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘතිය අනුව **අයදුම්කරු විසින් ම** පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළු වීමට ඉල්ලුම් කළ යුතුය. සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාවකට ඇතුළු වීමට අදහස් කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් සිංහලෙන් සම්පූර්ණ කළ යුතුය. දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාවනට ඇතුළු වීමට අදහස් කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් දෙමළෙන් සම්පූර්ණ කළ යුතුය. **මුද්‍රිත අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු නොලැබේ.**

(ii) අයදුම්පත සකස් කිරීමේ දී මෙහි පහත දැක්වෙන උපදෙස් අකුරමට පිළිපැදිය යුතුය. ඒවා නොසළකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂෙප කිරීමට හේතු වේ :—

(අ) පුල්ස්කැප් ඉරුවක, එනම් 8″ × 13″ ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත පිළියෙල කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදාසියක් ප්‍රයෝජනයට නොගත යුතුය.

(ආ) ටයිප්රයිටරයක් මගින් අයදුම්පත පිළියෙල කළ ද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම්පතෙහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතුය.

(ඉ) ඉරි ඇඳ අයදුම්පතේ කොටු වෙන් කරන්න. ඒවා නියමිත පිළිවෙලට තිබිය යුතුවාක් මෙන් ම අයදුම්පතෙහි නියමිත පිටුවෙහි ද විය යුතුය. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු එකටෙක ගොඩ නොගැසෙන ලෙස ද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙස ද ඉතා හොඳ අන්දමින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

**(iii)** අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම්පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පසුව නම් අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. පහත සඳහන් කරුණුවලට අයදුම්කරුවන්ගේ සැලකිල්ල යොමු විය යුතුය :—

(ඒ) ලියාපදිංචි කරන ලද ගුරුවරුන් ගුරුවරියන් විසින් අයදුම්පත්‍රවල භාවිත කළ යුත්තේ ලියාපදිංචි කිරීමේ දී යොදන ලද නමය. අවශේෂ අය ඔවුන්ගේ උප්පැන්න සහතිකයන්හි ඇති නම් භාවිත කිරීම නුවණට හුරුය.

(බී) සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත්‍රයෙහි තමා ගුරුවරයෙක් ද, ශිෂ්‍ය ගුරුවරයෙක් ද, ගුරුවරයෙක් නොවන්නෙක් ද යන වග සඳහන් කළ යුතුය. ගුරුවරුන් සහ ශිෂ්‍ය ගුරුවරුන් තමන්ගේ මුල් පත්වීමේ දිනය සඳහන් කළ යුතුය.

(සී) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 2,400 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරි යෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමක පූජ්‍යස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

(ඩී) ආණ්ඩුවේ හෝ අනුමත පාසල්වල ගුරුවරුන් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ පාසල් ප්‍රධානයන් මගිනි.

**(iv)** ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1969 ජූනි මස 10 වැනි දය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙන සේ රෙජිස්ටර තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම ද, තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සටහන් කළ යුතුය.

**(v)** අයදුම්පත්‍ර ලැබුන බව දන්වා එවනු නොලැබේ.

**(vi)** කිසියම් ලියවිල්ලක් අයදුම්පත්‍රය සමග නොඑවිය යුතුය.

12. **විභාග ගාස්තු.**—සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රයට රුපියල් **20**ක් වටිනා මුද්දර අලවා ඒ පිට තම අත්සන හා දිනය දැමීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකර මුද්දර එවීම සම්බන්ධ යෙන් කායර්‍යාලය වග කියන්නේ නැත.

13. **අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.**—(i) පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම්කරු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විගාභාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඒ) අසම්පූර්ණ හෝ දෝස සහිත හෝ අන්කිසි විධියකින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම්පත්‍ර,

(බී) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම්පත්‍ර,

(සී) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්‍ර.

(ii) අයදුම්පත් ප්‍රතික්ෂේප කළවිට මුද්දර ගාස්තු රාජසන්තක වේ.

14. **මුදල් ආපසු නොදීම.**—අසනීපවීම හෝ අන් කරුණක් නිසා විභාග යට පෙනී නොසිටීම ඇතුළු කිසිම කරුණක් සඳහා ගෙවන ලද මුදල් හෝ ඉන් කොටසක් ආපසු ගෙවනු නොලැබේ.

15. **ප්‍රවේශ පත්‍ර.**—(i) විභාගය පැවැත්වීමට දින හතකට පමණ පෙර පුවත්පත් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව **දැනුම්** දෙනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙක් ම සැලකිල්ලෙන් සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවකුට විභාගය පටන් ගන්නා දිනට යටත් පිරිසෙයින් දින 7කට කලින් ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය: විභාග) ඒ බව නොපමාව දන්වා එවිය යුතුය. එසේ දන්වා එවීමේ දී පහත සඳහන් විස්තර ද සඳහන් කළ යුතුය :—

(ඒ) විභාගයේ නම,

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම,

(සී) සම්පූර්ණ ලිපිනය,

(ඩී) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථාන,

(ඊ) අයදුම්පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල්පොල හා රෙජිස් ටර් අංකය.

16. **හැඳින්වීමේ පත්‍ර.**—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේ දී තමන් එක් එක් විෂයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) පෝස්ට්මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් **(Identity Card).**

(බී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්ද වූද වලංගුව පවත්නා වූ ද "පාස්පෝට්" **(Pass Port)** බලපත්‍රයක්.

(සී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්ද වූ ද, තම ඡායා රූපය දරන්නාවූද සහතික පත්‍රයක් හෝ බල පත්‍රයක් **(Licence)** හෝ වෙනත් ලියවිල්ලක්.

(ඩී) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්, එහි පිට පැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතුය. එසේ සහතික කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය......................................................
(අයදුම් කරුගේ සම්පූර්ණ නම)

..................................................ගේ බවත්, පහත යොද ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත්, මම සහතික කරමි.

————, ————,
අයදුම්කරුගේ අත්සන. සහතික කරන්නාගේ අත්සන.

————,
නම සහ තත්ත්වය.
දිනය :————.

ඉහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම් කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

17. **ලිපි ලේඛනාදිය.**—(i) පහත දැක්වෙන ලිපි ලේඛන සියල්ලක්ම හෝ ඉන් සමහරක් වුවමනා වන්නේය :—

(ඒ) ලංකාවේ පුරවැසියකු හැටියට ලියාපදිංචි කළ සහතිකය හෝ (අදළ නම්) පුරවැසි භාවය ලැබීමට ඇති සුදුසුකම පිළිගත් බවට නිකුත් කෙරෙන රාජකාරී ලියමනෙහි මුල් පිටපත.

(බී) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය (මෙම සහතිකය නිකුත් කර නොමැති නම් බාහිර අයදුම්කරුවකු නම් ප්‍රතිඵල සටහන හෝ පාසල් අයදුම් කරුවෙකු නම් පාසල් ප්‍රධානයන්ගේ ප්‍රකාශයක් (මේ නිකුත් කළ යුත්තේ ප්‍රධානියා විසින්මය). මෙම ප්‍රකාශයෙහි සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුය. එනම් අයදුම්කරුගේ සම්පූර්ණ නම පරික්ෂණය, එය පැවැත්වූ මාසය හා වර්ෂය, විභාග අංකය විෂයයන් හා ප්‍රවීණතා.)

(සී) ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය) (මෙය නොමැති නම් ඉහත (බී) හි අනුව ලියවිලි.)

(ඩී) උප්පැන්න සහතික පත්‍රය හෝ වයස සම්බන්ධ විශේෂ සහතිකය (පාසල්වලට ඇතුල්වීම සඳහා නිකුත් කරන විශේෂ උප්පැන්න සහතිකය හෝ බෞතිස්ම සහතිකය භාර ගනු නොලැබේ. උප් පැන්න සහතිකය වෙනුවට දිවුරුම් සහතික භාර ගනු නොලැබේ.)

(ඊ) දිව්රුම් සහතික (වුවමනා විටෙක නමෙහි ඇති වෙනස්කම් සඳහා ඉදිරිපත් කළ යුතුයි.) මෙම දිව්රුම් සහතික දිව්රා අත්සන් කළ යුත්තේ තම දෙමාපියන් විසින් හෝ ඔවුන් ජීවතුන් අතර නැත්නම්, වයස අවුරුදු 21ට වැඩි කිට්ටු ඥාතිවරයකු විසින් ය. උප්පැන්න සහතිකය පත්‍රයෙහි නම් වෙනස් කිරීමට කටයුතු කර ගෙන යනු ඇතැයි එම දිව්රුම් සහතිකයේ සඳහන් කළ යුතුය. දිව්රුම් සහතිකය පිළියෙල කිරීම සඳහා මුද්දර වුවමනා නැත.

(එෆ්) 8 වන ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් පිළිබඳ යම් අනුග්‍රහයන් අපේක්ෂා කෙරේ නම් පාසල් හෝ පිරිවෙන් ප්‍රධානයන්ගේද වතු පාසල් පිළිබඳ නම්, සුපිරින්ටැන්ඩන්ට්ගේද සහතික, පාසලේ හෝ පිරිවෙනේ නම සහ ලිපිනයද, ගුරුවරයා දරන තනතුර පිළිබඳ සම්පූර්ණ විස්තර ද ඇතුළත් විය යුතුය.

(ජී) 8 ව්‍යවස්ථාව අනුව දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරු වෙත යවන ලද ප්‍රතිඵල ලේඛනය හෝ නිවේදනය. එවැන්නක් නොමැති නම් අයදුම්කරු පෙනී සිටියා වූ විභාග විස්තර සහිතව ඉල්ලීමක් කළ විට දෙපාර්තමේන්තුව විසින් ලියවිල්ලකින් කෙලින්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත විස්තර නිකුත් කරනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අභ්‍යාස විද්‍යාලය හෝ ප්‍රාදේශිය නිලධාරී කායර්‍යාලය හෝ අයදුම්කරු විසින් සඳහන් කළ යුතුය. එවැනි ලියවිල්ලක් අයදුම්කරුට දෙනු නොලැබේ.

(එච්) සැලකිය යුතු ප්‍රභූවරුන් දෙදෙනෙකුගෙන් අයදුම්කරුගේ චරිතය පිළිබඳ සහතික. එම සහතික අවුරුදු 5 කට වඩා කාලයක් අයදුම් කරු හොඳින් දන්නා අයකුගෙන් මෑත දී ගන්නා ලද්දක් විය යුතුය. පිළිගත හැකි ඉතාම හොඳ සහතික නම් තම පාසලේ ප්‍රධානයාගේ හෝ අයදුම්කරු පදිංචි නගරයෙහි හෝ ගමෙහි සිටින නිලධාරි යකුගේ සහතික වේ.

(ii) සහතික හෝ ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අයදුම් පත්‍රය සමඟ නොඑවිය යුතුය. අවශ්‍ය සහතික පත්‍ර ලියවිලි ආදී සියල්ලක්ම ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් විසින් පමණක් එම පරීක්ෂණයේ දී ය.

සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍ය වූද, පිළිගත හැකි වූ ද, ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(iii) දෙන ලද උපදෙස් අනුගමනය නොකොට අයදුම් පත්‍රය සමඟ යම් ලියමනක් එවනු ලැබුවොත් එය පිළිබඳ මෙම කාර්යාලය වග නොකියයි.

(iv) මෙම ලිපි ලේඛනාදියෙහි සත්‍යතාව සම්බන්ධයෙන් අයදුම්කරු සම්පූර්ණයෙන් වග කිව යුතුය. තොරතුරු වෙනස් කරන ලද හෝ අත්සන් වෙනස් කරන ලද හෝ අසත්‍ය දේ අඩංගු කරන ලද ලිපි ලේඛනාදිය හෝ ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට තද බල දඬුවම් පමුණුවනු ලැබේ. ඔවුන් ගේ විභාගාපේක්ෂකත්වය ද අවලංගු කරනු ලැබේ.

ඔවුන්ට පරීක්ෂණයට පෙනී සිටින්නට ඇති සුදුසුකම් අවලංගුවීම සහ ගුරු වෘත්තීය සඳහා පැවැත්වෙන සියළුම පරීක්ෂණයන්ට මුළු ජීවිත කාලය තුළදීම පෙනී සිටීමට නොහැකි වීමටද සිදු වේ.

18. ප්‍රතිඵල.—මේ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පුහුණුවීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පෞද්ගලික වශයෙන් දැනුම් දෙනු ඇත. කායික හෝ මානසික ආබාධයන්ගෙන් පෙළෙන අයදුම්කරුවන් තෝරා ගනු ලැබීමට නුසුදුස්සන් වනවා ඇත. ප්‍රතිඵල ලේඛනයක් ප්‍රසිද්ධ කරනු නොලැබේ. විස්තර ප්‍රතිඵල ද නිකුත් කරනු නො ලැබේ. විභාග කාර්යාල යට ඒ ගැන ලියුම් එව්වහොත් එවාට පිළිතුරු නොලැබේ.

19. මෙම ව්‍යවස්ථාවන්හි අඩංගු නොවූ අන්කිසි කරුණක් වේතොත් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව විභාග කොමසාරිස්ට අභිමත ලෙස එය තීරණය කරනු ලැබේ.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1969**

විභාග අංකය :————.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.
(අ) නම (මුලකුරු සමඟ) :————.
(ආ) සියළුම නම් සම්පූර්ණයෙන් :———.

2. තෝරාගත් මධ්‍යස්ථාන :
පළමුවැනි තේරීම :———.
දෙවැනි තේරීම :————.

3. උපන් දිනය :————. උපන් ස්ථානය :————.

4. ජාතිය :————.

5. පිරිමියෙක් නම් ''පි'' ද ගැහැණියෙක් නම් '' ගැ '' ද ලොකු අකුරින් ලියන්න:————

ගුරුවරයෙක් ද, ශිෂ්‍ය ගුරු වරයෙක් ද, ගුරුවරයෙක් නොවේද යන බව සඳහන් කරන්න :————.

6. (අ) ස්ථිර ලිපිනය :————.

(ආ) දැනට ගුරුවරයකු නම් පාසලේ ලිපිනය :————.

7. තෝරා ගත් පාඨමාලා රුචි අනුක්‍රමයෙන් :

1. ————.
2. ————.
3. ————.

8. මෙම පාඨමාලාවලට ඔබේ අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ ප්‍රතිඵල :—

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————.

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |
| 7. | ———— | ———— | ———— |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල :—

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————.

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |

වර්ෂය :————. මාසය :————. විභාග අංකය :————.

| | විෂයයන් | සාමාන්‍ය | සම්මාන |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— |
| 6. | ———— | ———— | ———— |

(ඉ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල:—

| | වර්ෂය | මාසය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— | ———— |

(ඊ) ගැසට් නිවේදනයෙහි අඩංගු අනිකුත් විභාග වලින් ඔබ සුදුසුකම් ලබා ඇත්නම් එම විභාගවල ප්‍රතිඵල:—

| | විභාගයේ නම | වසර හා මාසය | සමර්ථවූ විෂයයන් | දරණ සහතිකයේ පෙළ සහ දිනය |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |

9. (අ) මෙම පරීක්ෂණය පිළිබඳව ගැසට් නිවේදනය අනුව මට පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවද,

(ආ) මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන ලද තොරතුරු මා දන්නා පමණින් හා විශ්වාසය අනුව සැබෑ බව ද,

(ඉ) මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නො කළ වලංගු මුද්දර බවද මම සහතික කරමි. තවද, මෙම පරීක්ෂණය පිළිබඳ ව්‍යවස්ථාවනට සහ අයදුම්කරුවන් සඳහා පනවා ඇති නියෝග යනට එකඟව ඒවායින් බැඳී සිටීමට ද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. මුද්දර කොටුව :—

**සැළකිය යුතුයි.**—රුපියල් 20 ක් වටිනා මුද්දර මෙහි අලවා අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කරන්න. මුද්දර එක පිට එක ඇලවීම නො කළ යුතුය.

11. අයදුම්කරුගේ අනන්‍යතාව සහතික කිරීම :—

මෙම අයදුම් පතෙහි නම සඳහන් වන අය මා හොඳාකාර අඳුනන බවද, අද දින මා ඉදිරියෙහි දී අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

සහතික කරන අයගේ නම (පැහැදිලිව) :————.

තත්ත්වය :————.

ලිපිනය :————.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එකී විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතු ය. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළ දී විභාග ශාලාවේ කාර්යමණ්ඩලයේ කෙනෙකු සමඟ හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමඟ මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම් හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමඟ කතාබස් කිරීම් ආදිය අවශ්‍ය වූවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතු ය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි). විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හෙතු විය හැකියි.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චෙතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවල දී, ඒවා හැර අන්‍ය අත්බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, ෆයිල් කවර, කාර්ඩ්බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් ළඟ එබඳු දෑ නොමැති බව සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්නපත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම් කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙකු කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්—

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්නපත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරිහැටි දැන ගත යුතුය.

(ii) යම්කිසි විෂයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(v) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලැජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියකවත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරිවන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණන චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුළින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබෙල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුයි. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

5–142—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## නිවේදනය

බී. 33/3/63.

1964 ජනවාරි මස 24 වැනි දිනැති අංක 13,931 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1964 ජනවාරි මස 20 වැනි දිනැති අංක බී. 33/3/63 දරන ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 23 වැනි ඡේදයේ සඳහන් සීමිත තරඟ පාඨ පරීක්ෂණයේ නිර්දේශ පත්‍රිකාව පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත :—

" අනිවාර්ය විෂයයන් " යන කොටසේ අග දැක්වෙන " වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, ලිඛිත පරීක්ෂණයට ලකුණු සියයට 40ක් ලබාගත් අපේක්ෂකයින් පමණි " යන කොටස කපා හරින්න.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

5–90—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## බිම් මැනීම හා තලමිතිය පිළිබඳ පරීක්ෂණය

බිම් මැනීම හා තලමිතිය සම්බන්ධයෙන් සර්වේ ජනරාල්ගේ බලපත්‍රය ප්‍රදානය කිරීමේ වාර්ෂික පරීක්ෂණය ලිඛිත හා ප්‍රායෝගික වශයෙන් කොටස් දෙකකින් යුතුව පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය 1969 ජූලි 22 වැනිදා ආරම්භ වන අතර ප්‍රායෝගික පරීක්ෂණය 1969 අගෝස්තු 21 වැනිදා ආරම්භ වේ.

2. ලිඛිත පරීක්ෂණය කොළඹදී පමණක් පවත්වනු ලැබේ. එහෙත් ප්‍රායෝගික පරීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත කුමක ස්ථානයක හෝ පැවැත්වෙනු ඇත.

3. (අ) පරීක්ෂණයට ඇතුළත් වීම සඳහා ව්‍යවස්ථානුකූලව නියමිත ආකෘති පත්‍රවල අයදුම්පත් පිළියෙල කළ යුතු වේ. මේ ආකෘති පත්‍ර කොළඹ 5; කිරුළ පාරේ සර්වේ ජනරාල්ගේ කාර්යාලයේ සීඑස්/සීඊ. ශාඛාවෙන් ලබගත හැක.

(ආ) පහත සඳහන් සහතිකවල මුල් පිටපත් අයදුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(i) ගණිතයෙන් (Mathematics) සාමාර්ථයත් සමග ලත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණ සහතිකය (ඉංග්‍රීසි)

හෝ ඒ හා සමාන සහතිකයක් නැතහොත් ඊට වඩා උසස් පරීක්ෂණයකින් සාමාර්ථය ලත් බව පෙන්නුම් කරන සහතිකයක් ;

(ii) යටත් පිරිසෙයින් පරීක්ෂණයට අවුරුද්දකට ඉහතදී, ලංකා කාර්මික විද්‍යාලයයේ හෝ යථා පරිදි බලපත්‍ර ලත් මිනින්දෝරුවෙක්, තලමිතිකරුවෙක් හෝ මිනින්දෝරුවෙක් සහ තලමිතිකරුවෙක් යටතේ අයදුම්කරු බිම් මැනීම හෝ තලමිතිය නැතහොත් බිම් මැනීම සහ තලමිතිය ඉගෙන ගත් බව පෙන්වීමට සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—ගණිතය, ඉංග්‍රීසි භාෂාව, සිංහල/දෙමළ භාෂාව සහ අවශේෂ විෂයයන් තුනක් ඇතිව ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර පරීක්ෂණය (සාමාන්‍ය පෙළ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණයට (ඉංග්‍රීසි) සමාන සේ ගැනේ. දෙවාරයකට නො වැඩි වාර ගණනකදී මෙම විෂයයන් හයෙන් සමත් වී තිබිය යුතුය.

4. අයදුම්පත් බාරගැනීම අවසාන වන දිනට, එනම් 1969 මැයි 24 වන දිනට ප්‍රථමයෙන් අයදුම්කරුවෝ පහත සඳහන් පරිදි විභාග ගාස්තු සර්වේ ජනරාල්ට ගෙවිය යුතුය :—

| | |
|---|---|
| බිම් මැනීම පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා ... | රු. 30 |
| තලමිතිය පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා ... | රු. 30 |
| බිම් මැනීම සහ තලමිතිය පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා | රු. 50 |

5. ලිඛිත පරීක්ෂණයට අයත් විෂයයෝ පහත සඳහන් පරිදි වෙත් :—

(1) **ඉංග්‍රීසි භාෂාව**—පත්‍ර එකයි.

රචනයක් පිළිබඳ අභ්‍යාසයක් හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අයදුම් කරුගේ දැනීම පරීක්ෂා කිරීමට ප්‍රශ්න.

(2) **අංක ගණිතය හා වීජ ගණිතය**—පත්‍ර එකයි.

**අංක ගණිතය.**—පූර්ණ සංඛ්‍යා, සාමාන්‍ය භාග, දශම භාග යන මේවා සඳහා අංක ගණිතයේ මූලධර්මත්, ක්‍රියාවලින් යෙදීම, මීටර් ක්‍රමය, සඳහන් කළ නිරවද්‍යතාවකට සන්නිකර්ෂණය, දශම ගුණ කිරීමේ හා බෙදීමේ කෙටි ක්‍රම, අනුපාත හා සමානුපාත, ප්‍රතිශත, සාමාන්‍ය ගණන්, අංක ගණිතයේ ප්‍රායෝගික භාවිත.

**වීජ ගණිතය.**—සාමාන්‍ය අංක ගණිතමය ප්‍රතිඵල සංකේත මගින් ප්‍රකාශ කිරීම, වීජ ගණිත නියම හා ඒවායේ භාවිත, සරල, ද්විපද හෝ වර්ග ප්‍රකාශවල සාධක, පළමු බලයේ හෝ දෙවැනි බලයේ හෝ සමීකරණ හා ඒ සම්බන්ධ ගැටලු, වර්ග මූල, සරල පරිමේය පූර්ණ සංඛ්‍යාත්මක වීජ ශ්‍රීක, සමාන්තර හා සරාත්මක ශ්‍රේෂ්ඨ, ගුණෝත්තර ශ්‍රේෂ්ඨ, දර්ශක වාදය, ලඝු ගණක හා ලඝු ගණක චක්‍ර භාවිතය, ධන පූර්ණ සංඛ්‍යාත්මක දර්ශකයක් සඳහා ද්විපද ප්‍රමේයය.

(3) **ජ්‍යාමිතිය ත්‍රිකෝණමිතිය**—පත්‍ර එකයි.

**ජ්‍යාමිතිය.**—ඉයුක්ලිඩ් කාණ්ඩ I-IV දක්වා කරුණු හා ඒවායේ සරල නිගමන, පහසු පථද, මිනිය හැකි දිගින් යුත් ආධාරක හා උසින් යුත් ත්‍රිකෝණවලත් සමාන්තරාස්‍රවලත් වර්ග ඵල ද මීට ඇතුළත්ය. (ජ්‍යාමිතික ප්‍රමේයවල ඔප්පු කිරීමේ සියල්ල ජ්‍යාමිතික විය යුතුය. ඉයුක්ලිඩ්ගේ ඔප්පුකිරීම අවශ්‍ය නොවේ.) සමරූපී රූප වෘත්තයේ මිනිතය, ඝනකය, සෘජුකෝණාස්‍රාකාර කුට්ටිය, චතුස් තලය, ගෝලය, සිලින්ඩරය, කුඤ්ඤය, පිරමීඩය කේතුව යන සරල වස්තුවල මිනිතය.

**ත්‍රිකෝණමිතිය.**—ත්‍රිකෝණ විසඳීම ඇතුළුව ඒ තාක්—ත්‍රිකෝණ විසඳීම් පිළිබඳ ප්‍රායෝගික ගැටළු හා භාවිතද ලඝු ගණක චක්‍ර හා වෙනත් චක්‍ර භාවිතය අවශ්‍යවන සංඛ්‍යාත්මක අභ්‍යාසද ඇතුළත්ය.

(4) **මැනීම.**—පත්‍ර එකයි.

දම්වැල් මැනුම, සංක්‍රම හා දෝලන තියොඩලයිටයන්, ඒවායේ පාවිච්චිය සහ සීරුමාරු කිරීම්, සමතල සෘජුකෝණාශ්‍ර ඛණ්ඩාංක භාවිතය ඇතුළු තියොඩලයිට්ර සහ මාලිමා පරික්‍රමණ, චක්‍ර පිහිටුවීම ආපාතිත ක්‍රම හා ආස්රමිතිය, තල මේස මැනුම්, සමතල ත්‍රිකෝණී කරණය.

(5) **මට්ටම් ගැනීම**—පත්‍ර එකයි.

ඩම්පි, (y) වයි සහ කුක්ගේ ප්‍රතිවර්තන ලෙවලයන්, ඒවායේ පාවිච්චිය හා සීරුමාරු කිරීම්, මට්ටම් ගැනීම පිළිබඳ අභ්‍යාසය හා සිද්ධාන්ත, පස්වැඩ ගණනය කිරීම, පාරවල් හා දුම්රිය මාර්ග පිළිබඳ මැනුම්, සමෝච්ච රේඛා සහ ඒවා අතර අඩංගු ප්‍රමාණ ගණනය කිරීම.

(1), (2) සහ (3) යන පත්‍රවලින් සාමාර්ථ්‍යය සඳහා එක පත්‍ර කින් සියේට 40 බැගින් ද, පත්‍ර තුනෙන් ම සාමාන්‍ය ලකුණු ගණන සියේට 50 ක් ද ලබාගත යුතුයි. (4) සහ (5) යන පත්‍රවලින් එකකින් සියේට 60 බැගින් ලබාගත යුතුයි.

6. බිම් මැනීමට පමණක් පෙනී සිටින අයදුම්කරුවනට (1) සහ (4) ද අඩංගුව (1) සිට (4) දක්වා ඇති ප්‍රශ්න පත්‍රවලින් සාමාර්ථයක් ලැබීම අවශ්‍යවන අතර තලමිතියට පමණක් පෙනී සිටින අයදුම්කරුවනට (1) සහ (3) ද අඩංගුව (1) සිට (3) දක්වා ඇති ප්‍රශ්න පත්‍රවලින් සහ (5) වන ප්‍රශ්න පත්‍රයෙන්ද සාමාර්ථයක් ලැබීම අවශ්‍ය වේ.

7. ලිඛිත පරීක්ෂණයෙන් සාමාර්ථයක් නො ලබන අයදුම්කරුවෝ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම අනවශ්‍යය.

8. ලිඛිත පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබන අයදුම්කරුවන්ට, ලිඛිත පරීක්ෂණයේ බිම් මැනීමේ හා තලමිතියේ නිර්දේශයන් උඩ පිළියෙල කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන වේලාව සහ ස්ථානය පිළිබඳව යථා පරිදි දැනුම් දෙනු ලැබේ.

9. පරීක්ෂකතැන විසින් නියම කරන ලද වේලාවන් අතරතුර ක්ෂෙත්‍රයේ වැඩ කළ යුතු අයදුම්කරුවෝ යහපත් තත්ත්වයක ඇති උපකරණ ඉදිරිපත් කළ යුතුය. උපකරණවල ඇති දෝස, සදොස් වැඩ සම්බන්ධයෙන් සමාවට කාරණයක් සේ නොපිළිගැනේ. පරීක්ෂණ වේලාවේදී කිසිවෙක් හා කථා බස් කරන අයදුම්කරුවෝ විභාගයට නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

10. සියළුම අයදුම්කරුවෝ, පෝල් පිටි, කුඤ්ඤ, තලමේස, ඇඳීමේ උපකරණ ලිපි ද්‍රව්‍ය යනාදී සවකීය උපකරණ සහ කම්කරුවන්ද සපයාගත යුතු අතර, ලිඛිත පරීක්ෂණයේදී හෝ ප්‍රායෝගික පරීක්ෂණයේදී අවශ්‍යතාවයන් සපයාදීම සම්බන්ධයෙන් කුමන විධියේ හෝ ආධාරයක් නොදෙනු ඇත.

11. 1969 මැයි 24 වැනි දිනට පසුව කිසිම අයදුම්පතක් බාර ගත නොහැක.

12. (1) පරීක්ෂණයක් සඳහා පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම ලිඛිත පරීක්ෂණයේදී සහ එහි ප්‍රායෝගික කොටසෙහිදී තමා විසින් ඉල්ලා ඇති එක් එක් විෂයයකට පෙනී සිටීමට මත්තෙන්, විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි සවකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. පහත සඳහන් ලිපි ලේඛනවලින් කුමක් වුවත් ඉදිරිපත් කිරීමෙන් එවැනි සාධක සැපයිය හැකිවේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කර ඇති අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක් ;

(ඇ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායාරූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

(2) පළමුවන උප ඡේදයේ පරිදි අනන්‍යතාව ඔප්පු කරන සාධක ඉදිරිපත් නොකළහොත් කිසිම අයදුම්කරුවකුට ලිඛිත පරීක්ෂණයෙහි සහ එහි ප්‍රායෝගික කොටසෙහි තමා විසින් ඉල්ලා ඇති කිසිම විෂයයකට පෙනී සිටීමට හෝ පෙනී සිටීමට හිමිකම් ලැබීමටද අවසරයක් නොමැත.

13. සියළුම ලියකියවිලි පෞද්ගලිකව මා නමට නොව සර්වේ ජනරාල් නමට එවිය යුතුය.

සී. ඊ. ගුණවර්ධන,
වැඩ බලන සර්වේ ජනරාල්.

1969 අප්‍රේල් 20 වැනි දින,
තැ. පෙ. 506,
කොළඹ 5, සර්වේ ජනරාල් කාර්යාලයේ,
සීඑස්/සීඊ ශාඛාව.

5-191—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යාලයට සිසුන් බඳවා ගැනීම

**කාර්මිකයින්ගේ පාඨමාලාව 1969/70**

මා විසින් ලංකාණ්ඩුවේ අංක 14,850 හා 69.4.18 වැනි දින පළකරන ලද ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ඉහත සඳහන් කාර්මිකයන්ගේ බඳවා ගැනීමේ සිංහල නිවේදනයට අමතර වශයෙනි.

එකී නිවේදනයේ පළවී තිබුණු 2 වැනි ඡේදයේ (II) සහ අයදුම් පත් පෝර්මයේ 9(ආ) (1) පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුය :—

(1) 2 වෙනි ඡේදයේ සුදුසුකම් (II) එක් වරකදී අධ්‍යාපන පොදු සහතිකපත් විභාගයේ විෂයයන් 6 කින් සමත් විය යුතු අතර, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා භාෂාව ඇතුව යටත් පිරිසෙයින් විද්‍යා විෂයයන් දෙකක් ඇතුළු විෂයයන් තුනකින් සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

(2) අයදුම් පත් පෝරමයේ 9 කොටසේ (ආ) 1 ශුද්ධ ගණිතය වශයෙන් කියවිය යුතුය.

පාසල් ප්‍රධානින් විසින් අයදුම්පත් හා ඔවුන්ගේ නිර්දේශයන් ඇතුලත් ලේඛන 1969 ජූනි 14 වෙනි දිනට පෙර එවිය යුතුය.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

5–33—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද ශාස්ත්‍රී (ඞී. ඒ.) උපාධිය—බාහිර පරීක්ෂණය

ආයුර්වේද ශාස්ත්‍රී බාහිර උපාධි පරීක්ෂණයට අදාල 68.11.8 දින හා අංක 14,827 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර තුබූ නිවේදනය, පහත දැක්වෙන කරුණු වෙනුවෙන් සංශෝධනය කර ඇති බව දන්වා සිටින අතර, සංශෝධිත පරිදි නැවත වරක් මෙම පරීක්ෂණයට ඇතුළත් වීම සඳහා ඉල්ලුම්පත්‍ර මැයි මස 22 වෙනි දින දක්වා බාර ගනු ලබන අතර අවශ්‍ය ඉල්ලුම්පත්‍ර මැයි මස 18 දින දක්වා තැපැලෙන් හෝ පැමිණ ලබා ගත හැකි බව දන්වනු කැමැත්තෙමි. ඉල්ලුම්පත්‍ර තැපැලෙන් ලබා ගැනීම සඳහා පහත දැක්වෙන ලිපිනයට, නම ලිපිනය සඳහන් මුද්දර රහිත දිග කවරයක් එවිය යුතුය.

කලින් පළමු ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්පත්‍ර එවා ඇති අය නැවත වරක් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම අනවශ්‍යය.

පහසු දැනගැනීම පිණිස නිර්දේශ මාලාවේ සංශෝධනය කර ඇති ඡෙදයන් සහ අත්‍යාවශ්‍ය කොටස් සම්බන්ධයෙන් සුළු විස්තරයක් මෙහි දැක්වේ.

**ආයුර්වේද ශාස්ත්‍රී (ඞී. ඒ.) උපාධිය—බාහිර පරීක්ෂණය**

**පරමාර්ථය :**

දේශීය වෛද්‍ය ක්‍රමයන් ආරක්ෂා කිරීම, ඒ වෛද්‍ය ක්‍රම විධිමත් ලෙස ඉගෙන ගැනීමට අනුබල දීම හා විද්‍යාලයනට බැදී ඉගෙනීමට පහසුකම් නැති ගුරු ශිෂ්‍ය පරම්පරා ක්‍රමයට වෙදකම ඉගෙන ගන්නා අය ලියාපදිංචි කිරීමට අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

**උපාධිය :**

පරීක්ෂණ පැවැත්වෙනුයේ කොළඹ, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය මගිනි. අවසාන පරීක්ෂණයෙන් සමත් වූවනට ආයුර්වේද ශාස්ත්‍රී ඞී. ඒ. උපාධිය පිරිනැමේ. මෙම උපාධිය ලත් අයට සම්මුඛ පරීක්ෂණයක් නොමැතිව ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි විය හැකිය.

**සුදුසුකම් 1**

වයස අවුරුදු 17 ඉක්මවූ, නිර්දේශ මාලාවේ අංක 4 ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අය, පළමුව ආයුර්වේද විද්‍යාලයේ, බාහිර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතුය. ලියාපදිංචි වී අවුරුද්දකින්, ප්‍රථම පරීක්ෂණයටද, ප්‍රථම පරීක්ෂණය සමත් වී හෝ එයින් නිදහස ලැබ අවුරුද්දකට පසු දෙවන පරීක්ෂණයටද, දෙවන පරීක්ෂණය සමත් වී හෝ එයින් නිදහස ලැබ අවුරුදු 2කට පසු අවසාන පරීක්ෂණයටද පෙනී සිටිය හැකිය.

ලියාපදිංචි වීමට අවශ්‍ය හා විභාගයට ඉදිරිපත් වීමට අවශ්‍ය පෝර්ම කොළ රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේඛකාධිකාරීට ලියුමක් ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකිය.

ලියාපදිංචිය පිණිස හා විභාගයට ඉදිරිපත්වීම පිණිස ගාස්තු අය කරනු ලැබේ. (නිර්දේශ මාලාවේ 17 ව්‍යවස්ථාව බලන්න.)

**සුදුසුකම් 2**

නිර්දේශ මාලාවේ ව්‍යවස්ථාවනට අනුකූලව සුදුසුකම් ඇති ආයතනයක උගත් ශිෂ්‍යයනට හෝ ලියාපදිංචි වූ ප්‍රසිද්ධ වෛද්‍යවරයකු යටතේ උගත් ශිෂ්‍යයනට හෝ විභාගයට පෙනී සිටීමට අවසර ලැබේ. පිළිගත් ආයතනය යනුවෙන් ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති 20 ඡේදයේ (2) වගන්තිය අවුරුදු 3 ක් යනතෙක් ක්‍රියාත්මක නො වේ. ඒ නිසා විභාගයට පෙනී සිටීම උදෙසා "පිළිගත් ආයතනයක" ඉගෙන ගත යුතුම නොවේ. නමුත් ව්‍යවස්ථා සංග්‍රහයේ අනෙකුත් නීති වලට අනුකූල විය යුතුය.

මේ වගන්තිය එනම් "පිළිගත් ආයතනය" යන්න වෙනස් කිරීමට හේතුව ව්‍යවස්ථාවන්ට අනුකූලව අධ්‍යාපනය ලබන කවර ශිෂ්‍යයකුට හෝ විභාගයට පෙනී සිටීමට ඉඩ සැලසීමය.

**පාඨමාලාව :**

**1. ප්‍රථම පරීක්ෂණය**

ආයුර්වේදයේ මූලධර්ම, පදාර්ථවිඥානය, ආයුර්වේද ඉතිහාසය හා සංස්කෘත භාෂාව.

**2. මධ්‍යම පරීක්ෂණය**

ද්‍රව්‍ය විඥානය, පරිභාෂා, ශාරීර විඥානය, ස්වස්ථවෘත්ත, සංස්කෘත භාෂාව, රෝග විඥානය.

**3. අවසාන පරීක්ෂණය**

දේශීය වෛද්‍ය ක්‍රම අංගයක් ඇතුළු—නිදාන, චිකිත්සා, ශල්‍ය, ශාලාක්‍ය ආදිය. වැඩි විස්තර නිර්දේශ මාලාව හා පාඨ මාලාවෙන් දැනගත යුතුය. ඒ ඒ විෂය ඉගෙනීමට අවශ්‍ය පොත් ද නිර්දේශ මාලාවේ විස්තර වේ.

**ලියාපදිංචි කිරීම :**

අවශ්‍ය සුදුසුකම් ඇති අපේක්ෂකයින් ලියා පදිංචි වීම උදෙසා අවශ්‍ය පෝර්මය පුරවා, නියමිත ගාස්තු සමග, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේඛකාධිකාරීට එවූ විට සැම අවුරුද්දකම ඔක්තෝබර් මස 1 වැනි ද සිට වලංගු වනසේ ලියාපදිංචි කරනු ලැබේ.

**විභාගය පැවැත්වීම**—මේ විභාගය පිළිබඳ වැඩි විස්තර මුද්‍රිත ව්‍යවස්ථා සංග්‍රහයෙන් බලා ගත හැකිසි. පිටපතක් රු. 1.00 යි. තැ. ගා. ශත 20 කි.

කොළඹ රාජගිරියේ, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබාගත හැකිය.

ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.

5–179—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය :—තැ. පෙ. 500/418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක්, වියලි ගැස් අඟුරු සැපයීම | ... | 1969.6.3 |
| 2. 1969.10.1 සිට 1970.9.30 තෙක්, කැටිකළ ගල්තාර සැපයීම | ... | 1969.6.3 |
| 3. 1969.10.1 සිට 1970.9.30 තෙක්, හුණු ආදිය සැපයීම | ... | 1969.6.3 |
| 4. 1969.10.1 සිට 1970.9.30 තෙක්, ගොඩනැගිලි සඳහා මෙරට සෑදූ ගඩොල් සැපයීම | ... | 1969.6.3 |
| 5. මෙරට සෑදූ පොළොව ඔප කරන ද්‍රව්‍ය සැපයීම | ... | 1969.6.17. |

ගඩොල් හා පොළොව ඔප කරන ද්‍රව්‍ය, සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර්පත්‍ර සමඟ ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1969.5.9 දින,
කොළඹදීය

5–200—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව (1968-69 මුදල් වර්ෂය සඳහාය)

පහත සඳහන් ද්‍රව්‍යයන් මිලට ගැනීම සඳහා ටෙන්ඩර් 1969 මැයි මස 28 වැනි දින උදේ 10.30 දක්වා මහර බන්ධනාගාර අධිකාරි තැන විසින් භාරගනු ලැබේ :—

(1) පොල් ගෙඩි 350 ක පමණ කුඩු දිනපතා.

(2) මුළුතැන්ගෙයින් ඉතුරුවන ඉඳුල්කෑම ද්‍රව්‍යයන්.

2. ටෙන්ඩර් සඳහා රු. 10 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. එයට ලබාගත් රිසිට් පත ටෙන්ඩර්පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බවට ලිපියකින් දන්වනු ලදුව නියමිත මාසික මුදල සෑම මාසයකම පළමුවැනි දින ගෙවීමෙන් පසු ඉහත සඳහන් ද්‍රව්‍යයන් දිනපතා ගෙනයාමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලද ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළහොත් හෝ ගෙනැවිත් දුන්නොත් එය ඔහුට ලැබුන බව සලකනු ලැබේ.

3. ටෙන්ඩර්කරුවන් ඉඳුල්කෑම සහ පොල්කුඩු දිනපතා ගෙනයාම සඳහා මසකට ගෙවීමට කැමති මුදල සඳහන් කළ යුතුයි. සීල් තබන ලද ටෙන්ඩරය පහත සඳහන් කරන අයට එවිය යුතුයි. "පොල් කුඩු සහ ඉඳුල් කෑම මිලට ගැනීම" යනුවෙන් කවරයේ වම් කෙළවරේ සටහන් කළ යුතුයි. සීල් තබන ලද ටෙන්ඩරය ඉහත සඳහන් දින දක්වා මා විසින් භාරගනු ලැබේ. මෙය සඳහා මුද්‍රිත ෆෝර්ම නැත.

4. මහර බන්ධනාගාර අධිකාරිතුමාගේ කාර්යාලයේදී 1969 මැයි මස 28 වැනි දින උදේ 10.35 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටීමට පුළුවන.

5. මෙය සඳහා ලබාගත යුතු තවත් විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ජේ. පී. දෙල්ගොඩ,
අධිකාරි.

මහර බන්ධනාගාරය,
රාගම.

5–99—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 මැයි මස 28 වෙනි බදාදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ එළිසබෙත් රැජින වේදිකාව දීර්ඝ කිරීමේ යෝජනා ක්‍රමයට අඟල් ½ කැලි ගල් කියුබ් 900 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1969 මැයි මස 28 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 මැයි මස 26 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1969.5.9.

5–170—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කොළඹ උප කොට්ඨාශයේ යෝජිත ද්‍රව පරීක්ෂණ හා පශයීක්ෂනාගාරයේ බිම් මාලය හා පළමුවන මාලය ඉදිකිරීම

ඉහත සඳහන් කරුණ සම්බන්ධව 1969. 4. 18 හා අංක 14,850 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටස, (II) වැනි ඡේදය යටතේ පලවී ඇති දැන්වීම කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

කොළඹ 7, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මේ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගන්නා දිනය, 1969.5.10 දින සිට 1969.5.25 දින පූ. භා. 10 දක්වා දිගුකර ඇති අතර කොළඹ 5, බටහිර කොට්ඨාශයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ දිනය, 1969.5.7 දින සිට 1969.5.21 දින දක්වා දිගු කර ඇති බවත් මෙයින් දන්වා සිටිමි.

ඩී. වී. ඒ. සේනාරත්න,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු,
බටහිර කොට්ඨාශය.

1969 අප්‍රියෙල් 27 දින,
කොළඹ 5.

5–146—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ගාලු උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් අයදුම් පත්‍ර තංගල්ලේ ප්‍රාදේශීය ඉංජිනේරු තැන විසින් 1969 මැයි මස 29 ද පූ.භා. 10 වනතෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදු කෙරේ.

| | වැඩ විස්තර | | ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| 1. | දින්කැටි ඇල ප්‍රකෘතිමත් කිරීම | ... | 50,000 | ... | 100 |
| 2. | ලංකා ඇල වැඩිදියුණු කිරීම | .. | 50,000 | ... | 100 |
| 3. | අන්දු ඇල ප්‍රකෘතිමත් කිරීම | ... | 18,000 | ... | 25 |
| 4. | හොරවල ඇල ප්‍රකෘතිමත් කිරීම | ... | 35,000 | ... | 50 |

ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1969 මැයි මස 28 වෙනි දින දවල් 12 ට හෝ ඊට පෙර ටෙන්ඩර් පෝර්ම ගාල්ල/මාතර/හම්බන්තොට/තිස්ස වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි.

මේ ගැන වැඩි විස්තර ගාල්ලේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාල-යෙන් ලබාගත හැක.

ජේ. එම්. ඩී. එල් සෙනෙවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු, ගාල්ල උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල. 69.4.28.

5–181—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මින්නේරිය උප කොටස

පහත සඳහන් වැඩය සඳහා 1969 ජූනි 2 වැනිද පෙරවරු 10 තෙක් පොළොන්නරුව ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩෙහි නම | | | කොන්ත්‍රාත්කරු ලියා පදිංචි විය යුතු මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| ඇම්ටී/12—මහඔය අසල දිගන්නා වැව ප්‍රති සංස්කරණ වැඩ | ... | ... | 70,000 | ... | 100 |

2. ඉහත සඳහන් වැඩය වෙනුවෙන් දක්වා ඇති ගණන් වලට හෝ ඊට වැඩි ගණන් වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. 1969යේ මැයි මස 28 වැනි දින පස්වරු 4 තෙක් හෝ ඊට පෙර සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී මින්නේරිය, කවුඩුල්ල, පොළොන් නරුව යන වාරිමාර්ග කාර්යාල වලින් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. මේ සඳහා ඉල්ලුම් පත් ටෙන්ඩර් පෝර්ම වල පමණක් අයදුම් කළ යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන් ගේ ලියා පදිංචි පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. තවද ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට පළමු වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති තැන්පත් මුදල ඉහත සඳහන් කාර්යාල වල හෝ ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයක තැන්පත් කර, ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙම ටෙන්ඩර් පිළිබඳ සියළුම විස්තර කාර්යාල වේලාවන් තුළදී, මින්නේරිය උප කොටස වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

කේ. කුමාරසාමි,
වාරිමාර්ග ඉංජිනේරු,
මින්නේරිය උප කොට්ඨාශය.

1969 අප්‍රේල් මස 21 වන දින,
හිඟුරක්ගොඩ,
වාරිමාර්ග කාර්යාලයේ දී ය.

5–192—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපල්වල වතුර පොම්ප සහ ට්‍රොලිය සැපයීම හා ගෙනවිත් භාරදීම

ඉහත සඳහන් දේ සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1969.5.28 වෙනි දින පෙ. ව. 10 දක්වා යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. සා. හා නි.) විසින් භාරගනු ලැබේ.

(i) කන්තලේ ගොවිපලට භූමිතෙලෙන් ක්‍රියාකරන වතුර පොම්පයක් සැපයීම හා ගෙනවිත් භාරදීම.

භූමිතෙලින් ක්‍රියාකරන අඟල් 2 වතුර පොම්පයක් කන්තලේ ගොවිපලට සැපයීම සහ ගෙනවිත් භාරදීම පහත සඳහන් විස්තර වලට අනුකූලව කළ යුතුයි. ටෙන්ඩර් භාරගත් දින සිට මසක් තුළ දී ඔහු වෙත ගබඩාකර ඇති පොම්පවලින් ගෙනවිත් භාරදිය යුතුයි :—

(අ) භූමිතෙලින් ක්‍රියාකරවන අඟල් 2 කේ අළුත් පොම්පය, ඇද ගැනීම (ෂක්ෂන්) අඟල් 2 යි. පිට කිරීම අඟල් 2 යි.

(ආ) ඇදගැනීමේ ප්‍රමාණය අඩි 25 ක් පමණි.

(ඉ) අඩි 50 ගේ හිස (හෙඩ්) මගින් පැයකට අඩුම වශයෙන් ගැලුම් 3,400 ක් පිටකිරීමට පුලුවන් විය යුතුයි.

(ඊ) අවශ්‍ය අවස්ථාවලදී ගලවා ගැනීමට හැකිවන පරිදි අඩි 33 ක් පමණ දිග ඇති අඟල් 2 ඇල්කතින් පොම්ප, පුට් වැල්ව්, ඞීරාස් කප්ලින්, ලෙදර් වොෂර්ස්, හෝස් ටයිට්නර් බ්‍රාස් නිපල් ආදි උපකරණ සවිකර සපයා දීම.

ටෙන්ඩර්කරු ඉහත සඳහන් විස්තරවලට අනුකූලව පොම්පයක් සැපයිය යුතුයි. ගෙවීම් කරනු ලබන්නේ සපයන ලද පොම්පය සවි කර ගොවිපල කළමනාකරු සෑහීමකට පත්වන පරිදි හොඳාකාර ක්‍රියාත්මක වේදැයි බැලීමෙන් පසුවය. ටෙන්ඩර් පත් සමඟ සැපයීමට බලාපොරොත්තු වන පොම්පය සම්බන්ධ විස්තර හා උපදෙස් මාලාව ද සැපයිය යුතුයි.

(ii) ඉහත සඳහන් පොම්පය නඩත්තු කිරීම සඳහා කන්තලේ ගොවිපලට ට්‍රොලියක් සැපයීම.

මෙම ටෙන්ඩරය භාරගතහොත් එම ට්‍රොලියට අවශ්‍ය උපකරණ සමඟ පොම්පය සවිකළ යුතුයි. ට්‍රොලිය පිළිබඳ විස්තර ටෙන්ඩර් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි. මිල ගණන් වෙනම දක්විය යුතුයි.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතුවේ.

3. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන්කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කාර්යාලයේ (ගො. පා. හා. නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියා පදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර්කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර්කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ

කර, අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන් වන අලාභය ගෙවීමට ද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරී (ගො. පා. හා. නි.) තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් ෆෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම්වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළ යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන් කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5% ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සළකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ තමාට සෑහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපළවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

ජී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකම්, අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේ දීය,
69. 4. 25.

5–141/1—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවලට වතුර ටැංකියක් සැපයීම හා ගෙනවිත් භාර දීම, ද්‍රව ඉසිනයන් දෙකක් සැපයීම හා ගෙනවිත් භාරදීම හා තල පුන්නක්කු සැපයීම හා ගෙනවිත් භාරදීම

පහත සඳහන් දේ සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1969.5.28 වෙනි දින පෙ. ව. 10 දක්වා යාපනයේ කෘෂිකම් නිලධාරී (ගො. පා. හා නි.) විසින් භාරගනු ලැබේ.

**(I) තල පුන්නක්කු ටොන් 3ක් ත්‍රිකුණාමලේ රජයේ ගොවිපලට සැපයීම හා ගෙනවිත් භාරදීම.**

කුඩුකර හොඳින් වේලූ සත්වාහාරයට සුදුසු අමිශ්‍ර තල පුන්නක්කු විය යුතුයි. ටෙන්ඩර්කරු ටෙන්ඩරය භාරගත් දින සිට සති දෙකක් තුලදී ටොන් 1 ක් ද මාසයක් තුලදී ටොන් 1 ක් ද ඉතිරි ටොන් 1 ක් මාස දෙකක් තුලදී සපයා නිම කළ යුතුයි. ත්‍රිකුණාමලයේ රජයේ ගොවිපලේ ගබඩාවට ගෙනවිත් භාරදිය යුතුයි. ටෙන්ඩර්කරු ටොන් 1 ක් ගොවිපලට ගෙනවිත් භාරදීම සමඟ අයකරන මිල සඳහන් කළ යුතුයි.

**(II) කිලිනොච්චි ගොවිපලට වතුර ටැංකියක් සැපයීම හා ගෙනවිත් භාරදීම.**

ජලය රැස්කර තබා ගැනීමට හැකිවන සේ විෂ්කම්භය 2′ 6″ × දිග 4′ 0″ හා ඝනකම 1/4″ ප්‍රමාණයේ සිලිංඩරාකාර බී. අයි. වතුර ටැංකියක් ටැංකියේ දෙපැත්ත වසා තිබිය යුතු අතර එක් පැත්තක 12″ විෂ්කම්භය ඇති පියනක් තිබිය යුතුයි. එයට උවමනා බෝල්ට් සහ ඇණ සවිකර දෙවරක් මළ නිවාරණ තීන්ත ආලේප කළ යුතුයි. වතුර ගතහැකිවන සේ අඟල් 1 1/4 ජල නලයක් සවිකළ යුතුයි.

ටෙන්ඩර් කරු විසින් ටැංකියට අය කරන මිල ගණන් දැක්විය යුතුයි. කිලිනොච්චි රජයේ ගොවිපලේ කළමනාකරු සෑහීමකට පත් වන පරිදි සැපයීම සහ ගෙනවිත් භාරදීම 1969.6.30 වෙනි දීනට හෝ ඊට පෙර නිමකළ යුතුයි. කාලය දීර්ඝ කරනු නොලැබේ.

**(III) සමන්තුරේ (අම්පාරේ දිස්ත්‍රික්කය) සහ පරන්තන් යන ගොවිපලවලට ද්‍රව ඉසිනයන් දෙකක් සැපයීම සහ ගෙනවිත් භාරදීම.**

වායු සමණයවූ බලයෙන් ක්‍රියා කරන ද්‍රව ඉසින හා කුඩු ඉසින රාත්තල් 20 ට වඩා බර නොමැති ගැ. 2 කට නොඅඩු ද්‍රව හා රා. 12 කට නොඅඩු කුඩු ප්‍රමාණය ධාරිතාවයක ටැංකියක් ඇති සියල්ල පූර්ණ ඉසිනයක්.

ඉසින පරිමාව චතුරාහාරයකින් පාලනය විය යුතු අතර තිරස්තරව ඉසීමේදී විනාඩියකට ඉසින වේගය ගැ. .15 සිට ගැ. .75 දක්වා විය යුතු අතර සිරස් ඉසීමේදී විනාඩියකට ඉසින වේගය ගැ. .07 සිට .60 දක්වා විය යුතුයි. දියර ඉසීමේ සඵලතාවය යාර 10 කට නොඅඩු විය යුතු අතර කුඩු ඉසීමේ සඵලතාවය යාර 30 කට නොඅඩු විය යුතුයි. ඉසිනයට අවශ්‍ය ආයුධ පෙට්ටි වැනි වෙනත් අමතර කොටස් වලින් යුක්ත විය යුතුයි.

ටෙන්ඩර් කරු ඉහත සඳහන් විස්තරවලට අනුකූලව ද්‍රව ඉසිනයන් දෙකක් සැපයිය යුතුයි. ගෙවීම් කරනු ලබන්නේ සපයන ලද ඉසින යන් ගොවිකළමනාකරුවන් සෑහීමකට පත්වන පරිදි හොඳාකාර ක්‍රියාත්මක වේදැයි බැලීමෙන් පසුව ය. ටෙන්ඩර් පත් සමඟ සැපයීමට බලාපොරොත්තුවෙන ඉසිනයන් සම්බන්ධ විස්තර හා උපදෙස් මාලාවන්ද සැපයිය යුතුයි. මිල ගණන් දැක්විය යුත්තේ ඉසිනයට හා උපකරණවලටද සමඟ ය.

ටෙන්ඩරය භාරගත් බව දන්වා සති තුනක් තුලදී ටෙන්ඩර් කරු විසින් තමන්ගේ ගබඩාවල ඇති ඉසිනයන්ගෙන් සපයා ගෙනවිත් භාරදිය යුතුයි.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) ගෙන් ලබාගත් අකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහල වම් කෙලවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කාර්යාලයේ (ගො. පා. හා නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියා පදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර් කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුලත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර් කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකියි. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුලත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර් කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැම්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම් වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදාළ දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර් කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන්වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකීවේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි) තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් ෆෝර්මයෙහි දෙපිටපතකින් යුතුව ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන් තීන්තෙන් පැහැදිළි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළ යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන් කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවා වූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5%ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර් කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුලත් කරණවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩකටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත් කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධි විධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුල භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර් කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරණු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිළධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිළධාරියා විසින් අනුමත කරණ ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු ප්‍රකාර්ථාංශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත් කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම් කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත් කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපැලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත් කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත් කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත් කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තුව පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සෑහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබා ගත හැක.

පී. ජී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

69. 4. 25,
පේරාදෙණියේ දීය.

5-141/2—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව නි. මී. යෝ. ක්‍ර. ගබඩාවේ වැඩ අවසන් කිරීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව නි. මී. යෝ. ක්‍ර. ගබඩාවේ වැඩ අවසන් කිරීම සඳහා 1969 මැයි මස 25 වෙනි ඉරිදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. රුපියල් 250ක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රු. 30,000ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 මැයි මස 24 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබා ගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 මැයි මස 9 වෙනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 දරණ ස්ථානයේ
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

5–168—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**අඩි 4×4 ප්‍රමාණයේ ලී තට්ටු සෑදීම, සැපයීම සහ ගෙනවුත් භාරදීම**

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන සැලැස්ම අනුව නි. මී. යෝ. ක්‍ර. ගබඩාවලට ලී තට්ටු සකස් කර ගෙනවුත් භාරදීම සඳහා 1969 මැයි මස 25 වෙනි ඉරුදින ප. ව. 2.30 දක්වා, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් ලියකියවිලි සමග නිකුත් කරනු ලබන උපලේඛනයේ සඳහන් පරිදි මෙම ලී තට්ටු ඒ ඒ දිස්ත්‍රික්කවල නි. මී. යෝ. ක්‍ර. ගබඩාවලට ගෙන ගොස් භාරදිය යුතුව ඇත.

2. රුපියල් 250ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැකි ආකෘති පත්වල මෙම ටෙන්ඩර්පත්‍ර දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල් කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000කට වැඩි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වූ රජයේ කොන්ත්‍රාත්කරුවන්ට "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 මැයි මස 24 වන සෙනසුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ලියාපදිංචි වවු සමුපකාර සමිතිවලටද ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස්ගෙන් ලබාගත් ලිපියක් සමග ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කළ හැක. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරන්නන් නියමිත දිනයට හා වේලාවට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, කල්වේලා ඇතිව ආකෘති පත්‍ර ලබාගෙන ඒවා ඉදිරිපත් කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 මැයි මස 9 වෙනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදී.

5–169—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

**අවිස්සාවේල්ල රජයේ රෝහලේ ශල්‍යාගාරය සහ යාබද මැදිරියන් වායු සමීකරණ කිරීම**

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්ය කර බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්වූ ජූනි මස 23 වන සඳුදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ 540, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1969 ක්වූ ජූනි මස 20 වන දින දවල් 2 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ ජූනි මස 23 වන සඳුදා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැඩ බලන ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ මැයි මස 9 වෙනි දින දීය.

5–85—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්සිරිපුරයට ඔබ්බෙන් පිහිටි පල්ලේ කැලේ හක්වටුනඔයේ ශංවතුරට යටවිය හැකි පාලමක් තැනීම**

කොළඹ 2, තැ. පෙ. 509 වන සංරක්ෂක විසින් 1969 මැයි 14 වැනි දින පෙ. ව. 10 තෙක් ඉහත සඳහන් කාර්යයන් සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

කොළඹ 2, කිච් පාරේ වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත යුතු නියමිත ආකෘති පත්‍රවල, පිටපත් දෙකකින් සමන්විත වනසේ ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුය.

මේ සඳහා සෑම ටෙන්ඩර්කරුවෙක් විසින්ම වන සංරක්ෂක නමින් රු. 100 ක මුදලක් කොටුවේ යෝක් වීදියේ (ගිණුම් අංක 34) ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය. ඒ සඳහා නිකුත් කරනු ලබන නිල කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. 1969 මැයි 13 දින ප. ව. 4 තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. අවශ්‍ය දේවල් අඩංගු උපලේඛනය ඇතුළු වැඩි විස්තර කොළඹ 2, කිච් පාරේ පිහිටි වන සංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ කුරුණෑගල දිසා වන නිලධාරි තැනගෙන් හෝ ලබාගත හැක.

ඇම්. ඇස්. රණතුංග,
වැ. බ. වන සංරක්ෂක වෙනුවට.

කොළඹ 2,
කිච් පාරේ,
වන සංරක්ෂණ කාර්යාලයේදීය.

5–155—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

**මඩකලපුවේ-විදුලි වැඩ මූලික කාර්යාලයයක්, ගබඩාවක්, ගරාජයක් සහ "2 ඒ" වර්ගයේ නිවාසයක් තනා භාරදීම**

රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්යය කර භාරදීම සඳහා 1969 ක්වූ ජූනි මස 8 ඉරිදා පූ. භා. 10 දක්වා කොළඹ පාර්සන්ස් පාරේ රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ඉටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියා පදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් එක් ලක්ෂයකට (රු. 100,000) නොඅඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝය.

4. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1969 ක්වූ ජූනි මස 5 දහවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1969 ක්වූ ජූනි මස 8 ඉරිදා පූ. භා. 10 ට රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඈම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැඩ බලන ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540.
කොළඹ,
1969 ක්වූ මැයි මස 9 වෙනි දින දීය.

5–73—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන හා පලාත් පාලන වැඩ අංශය, රත්මලාන

**කෑගල්ල දිස්ත්‍රික්කයේ—එගොඩ පොත ග. ස. ලබුපිටි ඇල හරහා පාලම**

කෑගල්ල දිස්ත්‍රික්කයේ එගොඩපොත පත්තු ග. ස. ලබුපිටි ඇල හරහා පාලමක් නිර්මාණය කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, යෝර්ක් වීදියේ, 75 1/1 හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි පලාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969 ජූනි මස 17 වන අඟහරුවාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘතිපත්‍ර මගින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ වූ සියළු විස්තර හා තොරතුරුද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර, මෙයට අදළ සැළසුම්ද ඔහුගේ කාර්යාලයේදී ලබාගත හැකි වන්නේය.

3. ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ඕනෑම පලාත් පාලන ආයතනයක ලක්ෂ 4 ට වැඩි වටිනාකමක් ඇති වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර්පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය. පහත සඳහන් ලියකියවිලි 1969 ජූනි මස 10 වෙනි අඟහරුවාදා දවල් 12 ට පෙරාතුව ඉහත කී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) ලියාපදිංචි සාක්ෂි හා

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් අකෘතිපත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩකර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා
පලාත් පාලන වැඩ අංශය,
රත්මලාන.
1969.4.25.

5–101/1—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන හා පලාත් පාලන වැඩ අංශය, රත්මලාන

**සංගිලි හා අඩි පාලම්**

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ—ඕතර ගන් දොළහ පත්තු ග. ස. මිද්දෙනිය—වලකුඹුර පාර සංගිලි පාලමක්,

(ආ) ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම ග. ස. වින්ටර් තොටුපල අඩි පාලමක්,

නිර්මාණය කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර්පත්‍ර රත්මලානේ, ජලසම්පාදන, ජලාපවහන හා පලාත් පාලන වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969 ජූනි මස 16 වන සඳුදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘතිපත්‍ර මගින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ වූ සියළුම විස්තර හා තොරතුරුද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර, මෙයට අදළ සැළසුම්ද ඔහුගේ කාර්යාලයේදී ලබාගත හැකි වන්නේය.

3. ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ඕනෑම පලාත් පාලන ආයතනයක ලක්ෂ 2 ට වැඩි වටිනාකමක් ඇති වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර්පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය. පහත සඳහන් ලිය කියවිලි 1969 ජූනි මස 10 වෙනි අඟහරුවාදා දවල් 12 ට පෙරාතුව ඉහත කී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) ලියාපදිංචි සාක්ෂි හා

(ආ) ඉහත සඳහන් සෑම වැඩක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් අකෘතිපත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩකර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා
පලාත් පාලන වැඩ අංශය,
රත්මලාන.
1969.4.25.

5–101/2—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### පොලොන්නරුවේ තනා ඇති මාළු තටාක අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම

පහත දැක්වෙන වැඩ භාර ගැනීම සඳහා කොළඹ 3, ගාළු මුවදොර, ධීවර අධ්‍යක්ෂ විසින් ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පොලොන්නරුවේ ඉදිකර ඇති මාළු තටාක අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.

ටෙන්ඩර් ලියකියවිලි හා වෙනත් විස්තර පහත අත්සන් කර ඇති අයගෙන් 69.5.25 වැනි දින දහවල් 12 දක්වා ලබා ගත හැකිය.

69. 5. 27 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 කි.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 අප්‍රේල් මස 23 වනදා,
ධීවර දෙපාර්තමේන්තුව,
ගාළු මුවදොර,
කොළඹ 3.

5–26—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1969 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30 දක්වා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල රු. |
|---|---|
| (i) මැදිකිඳ ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, හීල්ඔය මකුල්ඇල්ල පාරේ 1 වන සැතපුමේ පස් වැඩ සහ ගල් කැඩීම ... | 25,000 |
| (ii) වියළුව ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, තල්දෙන-අංගොඩ පාරේ 1 වන සැතපුමේ පළමුවන භාගයේ ගල් අල්ලා තාර දමා, අළුත්වැඩියා කිරීම ... | 25,000 |
| (iii) යටිකිඳ ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, හෙල්ලිගස් හීන්න ජලනල ව්‍යාපාරය ... | 25,000 |
| (iv) බින්තැන්න ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, කන්දෙ ගම ජලනල ව්‍යාපාරය ... | 15,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1969 මැයි මස 30 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ල කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලුමුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1969 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජ සන්තක කරනු ලැබේ. ලියා පදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවන අතර, මව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ල දිසාපති ගෙන් දැනගත හැකිය.

ඒ. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති,
වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල.
1969 අප්‍රේල් මස 20 වැනි දින.

5-22—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## ආහාර කොමසාරිස් දෙපාතීමේන්තුව

කිරන පාලම් සැපයීම සහ සවිකිරීම, එම පාලම් වල අත්තිවාරම් සහ කිරන කුටි (වේ කැබින්) තැනීම සඳහා 1969 ජූනි මස 1 වැනි දින පස්වරු 2.30 දක්වා, කොළඹ 2, යුනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයේ පිහිටි ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. 1969 මැයි මස 30 වැනි දින දවල් 12 වන තෙක්, කොළඹ 2, යුනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයෙහි පිහිටි ආහාර කොමසාරිස් තැනගේ කායනීලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර පිළියෙල කර, පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. ආහාර කොමසාරිස් කායනීලයේ රු. 250 ක මුදලක් තැන්පත් කර, කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ. 1969 ජූනි මස 1 වැනි දින පස්වරු 2.30 ට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

3. වැඩි විස්තර කොළඹ 2, යුනියන් පෙදෙස්, අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කායනීලයෙන් ලබාගත හැක.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

1969 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 2,
ආහාර කොමසාරිස් කායනීලයේ දීය.

5–199—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් මාතලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරුගේ හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මාතලේ අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 මැයි මස 24 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30 ට මාතලේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. හේරත්,
මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී.

1969 අප්‍රේල් මස 29 දින,
මාතලේ අධ්‍යාපන කාර්යාලයේදිය.

5–204—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර කොට්ඨාශය

### කිලිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—වර්ෂ 1969 ජුනි මස 15 වෙනි දින සිට **1969 සැප්තැම්බර් 30** වෙනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට, **කුවිතාන්සියක්** ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නො තබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම්වල ලියා පදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන්ද, ආයතනයන් භාර වෛද්‍ය නිලධාරින්ගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 4 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, මහනුවර '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් එය ලැබුන බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවෙනි ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත් වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනිකුත් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරී තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වච්චරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිලිටි රෙදිවිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේවියදම්.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීති වලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ජී. ඊ. ගජනායක,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
මහනුවර, 1969 අප්‍රේල් මස 27 වෙනි දින.

උපලේඛනය

| ආයතන අංශය සහ ඊට අයත් වාට්ටු ආදී විස්තර | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | මසකට සේදිය යුතු කෑලි ගණන | මසකට සේදිය යුතු වාර ගණන | ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| මහනුවර මහ රෝහල | | | | | |
| අංශය 2 ප්‍රධාන ශල්‍යාගාරය ... ... ... | 50 0 ... | 150 0 ... | 9,000 ... | 30 | වර්ෂ 1969 මැයි මස 27 වැනි දින පෙ.ව. 10 ට |
| අංශය 5 1 සහ 2 වැනි වාට්ටු (පිරිමි ශල්‍ය) පිරිමි ඇස්වාට්ටු සහ පිරිමි ක.නා.උ. වාට්ටු | 50 0 ... | 100 0 ... | 3,100 ... | 10 | |
| අංශය 10 4 වෙනි වාට්ටුව (පිරිමි ශල්‍ය) ... ... | 50 0 ... | 100 0 ... | 1,500 ... | 8 | |
| අංශය 14 ශල්‍යාගාරය (අළුත් ගොඩනැගිල්ල) ... ... | 50 0 ... | 150 0 ... | 9,000 ... | 30 | |

5–140—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/11/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ක්ලෝර්ප්‍රොපමයිඩ් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ක්ලෝර්ප්‍රොපමයිඩ් ආදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,843 දරන 1969–2–28 වැනි දිනැති '' රජයේ ගැසට් පත්‍රයේ '' පළ කොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනු රජය, බුල් ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව,

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ජූලි මස අට වෙනි දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උපඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1969 අප්‍රේල් මස 25 වන ද.

අදල උපලේඛනය

**SCHEDULE REFERRED TO**

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1. .. | Chlorpropamide B.P. 100 mgm each .. .. | 1,000,000 Tablets .. | In bottles of 500 tablets |
| 2. .. | Trifluoperazine 5 mgm each (2 Trifluoromethyl—10 (3' Methyl—4'') Propyl Phenothiasine dihydrochloride | 4,200,000 Tablets .. | do. |
| 3. .. | Imipramin (NY Dimethylaminopropyl)—Imino-diabenzyl Hydrochloride) 25 mgm | 1,000,000 Tablets (Sugar Coated) .. | In bottles of 200 tablets |
| 4. .. | Chlorpromazine Hydrochloride B.P. 50 mgm .. | 2,000,000 Tablets .. | In bottles of 500 tablets |
| 5. .. | Chlorpromazine Hydrochloride B.P. 25 mgm .. | 8,000,000 Tablets .. | do. |

5–113—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බාල්දි වැසිකිළි ජල මුද්‍රා බවට පරිවර්තනය කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 ජූනි මස 17 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ජූනි මස 5 වන බ්‍රහස්පතින්දා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදිකිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ '' ඊ '' කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 50ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

3. ටෙන්ඩර්පත් ලබාගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම්වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති

(ඇ) සමූපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමූපකාර සංගම්.

4. ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිත

යින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තර ද, ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය මෙ රටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තවදුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 අප්‍රේල් මස 28 වන දා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

5–165—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය—නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### කායශීලිය ගොඩනැගිල්ල සඳහා යෝජිත දීර්ඝ කිරීම්, නගර හා ග්‍රාම නිර්මාණ අංශය—ඞී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

කාර්යාලයීය ගොඩනැගිල්ල දීර්ඝ කිරීම සඳහා, කොළඹ 10, ඞී. ආර්. විජේවර්ධන මාවතේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1969 මැයි මස 25 වෙනි දින පෙ. ව. 10 දක්වා පිටපත් දෙකකින් යුත් මුද්‍රා තබන ලද ටෙන්ඩර් බාරගනු ලැබේ. එදිනම නගර හා ග්‍රාම නිර්මාණ අංශයේදී පෙ. ව. 10.15 ට ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, ඞී. ආර්. විජේවර්ධන මාවතේ නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වල විය යුතුය. රුපියල් 75,000 කට නො අඩු වැඩ සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී සිටින අයට එසේ ලියාපදිංචි වීම පිළිබඳව සාක්ෂි සහ ටෙන්ඩර් පත් මුදල වන රු. 100 කොළඹ 1, "හේමාස්" ගොඩනැගිල්ලේ පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ කොළඹින් පිටත තිබෙන ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කරන අයට 1969 මැයි මස 24 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනවා ඇත.

3. ඉහත සඳහන් 2 ඡේදයේ දක්වා ඇති මුදලට ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇත්නම් අනුමත සමිති සමාගම් වලටද ටෙන්ඩර් කළ හැක. එබඳු සමිති සමාගම් ටෙන්ඩර් තැන්පත් මුදලෙන් නිදහස්ය.

4. සියළුම ටෙන්ඩර් සීල් තබා කවරයෙහි වම් පැත්තේ මුදුන් කෙළවරෙහි "ගොඩනැගිල්ල දීර්ඝ කිරීම" යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. එසේත් නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ කායශීල සහකාර තැනට භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

එන්. ගුණරත්න,
නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ.

නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඞී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
1969 අප්‍රේල් මස 28 වෙනි දින,

5–182—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1969.7.1 සිට 1969.12.31 දින දක්වා එළුමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969.6.1 දින අ. භා. 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1 චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.6.1 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.4.28 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

5–183—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1969.7.1 සිට 1969.12.31 දින දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969.6.1 දින අ. භා. 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.6.1 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.4.28 දින,
කොළඹ 1.
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

5–180—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : පා/4/2/24.

## අම්පාර කච්චේරිය

පහත සඳහන් වැඩය සඳහා රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචිව සිටින සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද 1969 මැයි මස 24 වන දින පෙ. ව. 11 දක්වා අම්පාර දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(i) අක්කරපත්තුවේ සින් නමුහතුවාරම තානායමේ ඉස්තෝප්පුව වීදුරු ජනෙල් වලින් ආවරණය කිරීම.

2. දිවයිනේ පිහිටි ඕනෑම කච්චේරියක රු. 10 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් අම්පාර දිසාපති නමින් තැන්පත් කොට ලබා ගත් නිළ කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම අම්පාර දිසාපති කාර්යාලයේ පාලන අංශයෙන් ලබාගත හැක. ඉහත පළමුවන ඡේදයේ සඳහන් සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අවශ්‍ය නැත. ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දින ප. ව. 1 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. පිටපත් දෙකකින් යුක්තව පැහැදිලි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝර්ම දිසාපති ලේකම් කාර්යාලය, අම්පාර යන ලිපිනයට ලැබෙන සේ ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. නැත

හොත් අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ඒවා තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "......... (වැඩයේ නම) .........සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුය. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති හෝ නොපැහැදිලිව ලියා ඇති හෝ ටෙන්ඩර්පත්‍ර සලකා බැලීම පිණිස භාරගනු නොලැබේ.

4. 1969 මැයි මස 24 වන දින ප. ව. 3 ට අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනවා ඇත. එසේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගෙන් ලිපියකින් බලය ලත් නියෝජිතයෙකුට ඉඩදෙනු ලැබේ.

5. ජයග්‍රාහක ටෙන්ඩර්කරු ඒ බව ඔහුට දැනුම් දෙන ලිපියේ සඳහන් දින සිට දින 14ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කොට, සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම පිණිස අම්පාර දිසාපති සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ඇපය ජයග්‍රාහක ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මුදලින් සියයට 5 කට නොවැඩි මුදලක් වනු ඇත. මෙසේ මෙම ගිවිසුමට ඇතුළත් වීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ නම "වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුළත් කරනවා ඇත. තවද ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදලද ආපසු ගෙවනු නොලැබේ.

6. වැඩ පැහැර ඇති කොන්ත්‍රාත්කරුවකු ලෙස රජය පිළිගත් අයෙකු බව හෙළිවීම හෝ තමාට සැහේ යයි පෙනීයන වෙනත් හේතුවක් හෝ නිසා මෙම සේවාව පැවරීමට එම අවස්ථාවේදී නුසුදුස්සකු යයි අම්පාර දිසාපතිට ඒත්තු යන කවර හෝ පුද්ගලයෙකු නැතහොත් සමිතියක් සමග වුවද මෙකී ගිවිසුමට ඇතුළත්වීම එම දිසාපතිගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී ප්‍රතික්ෂේප කළ හැකිය.

7. ටෙන්ඩර්කාර සමිතිවල ස්ථිරත්වය සහ ක්‍රියාකාරී පැවැත්ම පිළිබඳව ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ, සමූපකාර සංවර්ධන උප කොමසාරිස් හෝ කම්කරු උප කොමසාරිස් යන නිලධාරීන් අතුරින් අදාල නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුය. එකී සමිතිය මෙම කොන්ත්‍රාත්තුව පැවරීමට සුදුසු එකක් ද යන බවට එම නිලධාරියාගේ නිර්දේශයද එම සහතිකයට ඇතුළත් විය යුතුය.

8. යම්කිසි ටෙන්ඩරයක් මුළුමනින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ නැතහොත් පිළිගැනීමේ අයිතිය අම්පාර දිසාපති සතුව පවතී.

9. ටෙන්ඩර් පෝර්ම ලබාගත් නමුත් ඒවා සම්පූර්ණ කොට අම්පාර දිසාපති වෙත ඉදිරිපත් නොකළ අයගේ සහ නියමිත කොන්දේසිවලට පටහැනිව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම නිසා නොපිළිගත් ටෙන්ඩර් පත්‍ර එවූ අයගේද ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. මේ පිළිබඳ වැඩි විස්තර සහ කොන්ත්‍රාත්කරු ඇතුළත් විය යුතු ගිවිසුමේ කොන්දේසි පිළිබඳවද අම්පාර දිසාපති කාර්යාලයේ පාලන අංශයෙන් සාමාන්‍ය කාර්යාල කටයුතු කරන වේලාවකදී විමසා දැන ගත හැක.

සී. නාරායනසාමි,
අම්පාර දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969 ක්වූ අප්‍රේල් 27 දින,
අම්පාර දිසාපති කාර්යාලයේදිය.

3–144—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව—පාලම් සංවිධානය

කොළඹ කොටුවේ "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මන්ඩලයේ සභාපති තැන විසින්, රත්මලානේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාලම් අංගනයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි පහත සඳහන් යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍යයන් මිළ දී ගැනිම හා ඉවත් කර ගැනීම සඳහා 1969 ක් වූ මැයි මස 26 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ :—

| අංකය | විස්තරය | දෙ. අංකය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | ලොරි ... ... | ... සී ඊ 3255 ... | 1 |
| 2 | ලොරි ... ... | ... සී ඊ 3191 ... | 1 |
| 3 | ලොරි ... ... | ... සී එන් 1380 | 1 |
| 4 | වායු සම්පීඩකය (චිකාගෝ නියුමැටික් වර්ගය) ... | ... ර.වැ.දෙ. 6 ... | 1 |
| 5 | ගල් කඩන යන්ත්‍රය ... | ... ර.වැ.දෙ. 16 | 1 |
| 6 | වේස් සයිඩ් දෙබකරය ... | ... ර.වැ.දෙ. 5 ... සී වී 6278 | 1 |
| 7. | කොන්ක්‍රීට් අනන යන්ත්‍රය ... (රැන්සම් රේපියර් වර්ගය) ... | ... ර.වැ.දෙ. 29 ... | 1 |
| 8. | ටයර් සහතික සම්පූර්ණ රෝද | ... — ... | 6 |
| 9. | පරණ ටයර් කළවමේ ... | ... — ... | 548 |

2. මෙම යන්ත්‍රෝපකරණ හා ද්‍රව්‍යයන් රත්මලානේ රජයේ වැඩ දෙපාර්කමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්මික අංශයේදී සතියේ දිනවල පෙරවරු 10 සිට දවල් 12 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

3. රත්මලානේ ර. වැ. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගන්නා ලද පෝර්මවල පිටපත් දෙකකින් යුක්තව ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පත් ලබා ගත හැක්කේ කොළඹ 1, රජයේ වැඩ අධ්‍යක්ෂක වෙත හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක රු. 250 ක් තැන්පත් කරන ලද මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණි. 1969 මැයි මස 19 දින පස්වරු 4 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඉන් පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ප්‍රමාද ගාස්තු වශයෙන් දිනකට රු. 10 ක් අය කිරීමෙනි. තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු අතර, සියළුම ටෙන්ඩර් පත් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ "ර.වැ.දෙ. පාලම් සංවිධානයේ ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍රෝපකරණ හා ද්‍රව්‍යයන් මිළදී ගැනිම හා ඉවත් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. 1969 මැයි මස 26 වෙනි දින පෙරවරු 11.05 ට, ර.වැ.දෙ. ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේදී, ටැන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටැන්ඩර් විවෘත කරන වේලාවේදී ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගෙන් බලය ලත් නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

ටැන්ඩරය භාරගත් දින සිට සතියක් ඇතුලත ටැන්ඩර්කරුට අයත් වන ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍රෝපකරණ හෝ ද්‍රව්‍යයන් වෙනුවෙන් ටෙන්ඩරයේ සඳහන් වටිනාකම සම්පූර්ණයෙන් ගෙවා රත්මලානේ පාලම් අංගනයෙන් ඉවත් කර ගත යුතුය.

6. ලාංකිකයන්ට ලාංකික සමාගම් හා කොම්පැනිවලට පමණක් ටැන්ඩර් පත් නිකුත් කිරිම සීමාවන අතර, අසාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්තු කොන්දේසි යටතේ සාර්ථක වූ ටැන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
ර. වැ. දෙ., රත්මලාන,
1969 අප්‍රේල් 28.

5–178—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### ටෙන්ඩර් ප්‍රතිඵල

| සැපයීම් හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර් කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| ඉටිපන්දම් 300–500 දක්වා වූ පීඩන ලාම්පු .. | 7 යි ... | බී. සී. බයර්ස් ... | හොන්කොන්හි සාදන ලද "එරොප්ලේන්" වර්ගයේ පීඩන ලාම්පු, තීරුබද්දු රහිතව එකක් රු. 28/10 බැගින් ගෙනැවිත් භාරදීමට. |

1969 මැයි මස 9 දින,
කොළඹ දී ය.

සැ. ඔ. පෙ. රූපසිංහ,
ගබඩා අධිකාරී.

5–143—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර්—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

මඩකලපු සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### 1968–69 වෛද්‍ය ආයතනයනට කිරි නොමැතිව පිසූ සහ නොපිසූ ආහාර සැපයීම

| | ආයතනයේ නම | තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ නම | ලැබුණ ටෙන්ඩර් ගණන | ආහාර වර්ගය සඳහා පිළිගත් මිළ ගණන් — සේවකයනට: මාළු | හරක් මස් | කරවල | එළවළු | රෝගීන්ට: මාළු | හරක් මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | ඉඟිනියාගල දි. රෝ. | වී. වෙට්ටිවේලු | 2 | 2 40 | — | 2 40 | 1 50 | 2 40 | — | 2 30 | 1 60 |
| 2. | අම්පාර දි. රෝහල | එස්. පොන්නම්බලම් | 2 | 1 50 | 1 40 | 1 40 | 1 0 | 2 0 | 1 95 | 1 70 | 1 35 |
| 3. | කාතන්කුඩි ග්‍රා. රෝ. | ටී. මාසිලාමනි | 1 | 1 60 | 1 55 | 1 50 | 1 30 | 1 70 | 1 65 | 1 60 | 1 35 |
| 4. | මධ්‍ය කඳවුර ප. ඒ. | එස්. පොන්නම්බලම් | 5 | 1 60 | — | 1 60 | 1 50 | 1 60 | — | 1 60 | 1 50 |
| 5. | සම්මන්තුරෙයි ග්‍රා. රෝ. | ඒ. සිවලිංගම් | 3 | 1 10 | — | 1 04 | 1 0 | 2 0 | — | 2 0 | 1 48 |
| 6. | වාලචේන ග්‍රා. රෝ. | වී. එම්. ඒ. අසීස් සහ සමාගම | 3 | 2 0 | — | 1 75 | 1 40 | 1 85 | — | 1 60 | 1 25 |

ඒ. බී. එන්. මොහමඩ්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 අප්‍රේල් මස 25 වැනි දින,
මඩකලපුවේ සෞ.සේ.අධිකාරි,
කාර්යාලයේදී ය.

5–68—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### රාජකීය ලංකා නාවික හමුදාව

ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විකිණීම

ප්‍රයෝජනයට ගත නොහැකි පහත දැක්වෙන භාණ්ඩ පිළිබඳ වෙන්දේසියක් 1969 මැයි මස 27 වැනි දින පෙ. ව. 9.00 ට ත්‍රිකුණාමළේ රාජකීය ලංකා නාවික හමුදාවේ තටාකාංගනයේදී සිදුකරනු ලැබේ.

2. එම භාණ්ඩ වෙන්දේසිය සිදුකරන දින පෙ.ව. 8.00 සිට පරීක්ෂා කර බැලිය හැක.

3. වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ මුදලම ගෙවිය යුතු අතර, මිළදී ගනු ලබන භාණ්ඩයන් 1969 මැයි මස 28 වැනි දින දහවල් 12.00 ට ප්‍රථම ඉවත් කරගත යුතුය.

ආර්. කදිර්ගාමර්,
නාවික හමුදාධිපති.

1969 අප්‍රේල් මස 29 දින,
කොළඹ,
නාවික හමුදා මූලස්ථානයේ දීය.

තොග අංක 1 ... හිස් ටින්, හිස් සිමෙන්ති මළු, සින්ක් බෙල්පාස්ට්, අර්ත්වෙයාර්, පයිප්ප, සිස්ටන් සී. අයි.

තොග අංක 2 ... සිලින්ඩර් හෙඩ්ස්, කනෙක්ටින් රොඩ්ස්, ක්‍රෑන්ක් සාෆ්ට්ස්, ස්පිරින්ග්ස් සිලින්ඩර්ස්, කාබන් බුරුසු, පිස්ටන් රින්ග්ස්, ඉන්ඩිකේටර්ස් සහ තවත් විෂයයන්.

තොග අංක 3 ... ටෙම්ප්‍රෙචර් ගේජ්, බුෂ්, බෙයාරින්ග්ස්, සාෆ්ට් වෝටර් පම්ප්, එක්ස්හෝස් වැල්ව්ස්, වොසර්ස්, සිලින්ඩර් හෙඩ්ස්, පිස්ටන්ස් සහ තවත් විෂයයන්,

තොග අංක 4 ... ඩී. සී. ජෙනරේටර්ස්, මෝටර් ජෙනරේටර්ස්, ස්ටාටර්ස් මෝටර්ස්.

තොග අංක 5 ... රෙගියුලේටර්ස්, උණුසුම් ලිප්, පැඩ්ලොක්ස්, බැටරීස්, හිස් ටින්, ජෝගු, පිඟාන්, හෙඩ් ෆෝන්ස්.

තොග අංක 6 ... නොයෙක් වර්ගයේ පුටු සහ මේස.

තොග අංක 7 ... මේස.

තොග අංක 8 ... නොයෙක් වර්ගයේ පුටු සහ සැටි.

තොග අංක 9 ... ලී පුටු, යකඩ පුටු, බා කවුන්ටර් ලී.

තොග අංක 10 ... නොයෙක් වර්ගයේ මේස.

තොග අංක 11 ... ක්‍රෑන්ක් සාෆ්ට්.

තොග අංක 12 ... ගැලුම් 46 හිස් තෙල් ටින්.

තොග අංක 13 ... ගැලුම් 46 හිස් ටින්.

තොග අංක 14 ... ගැලුම් 46 හිස් ටින්

තොග අංක 15 ... ගැලුම් 46 හිස් ටින්.

තොග අංක 16 ... ගැලුම් 46 හිස් ටින්.

තොග අංක 17 ... ගැලුම් 45 හිස් ටින්.

තොග අංක 18 ... ගැලුම් 45 හිස් ටින්.

තොග අංක 19 ... හිස් පෙට්ටි.

තොග අංක 20 ... හිස් පෙට්ටි.

තොග අංක 21 ... හිස් පෙට්ටි.

තොග අංක 22 ... හිස් පෙට්ටි.

තොග අංක 23 ... හිස් පෙට්ටි.

තොග අංක 24 ... හිස් පෙට්ටි.

තොග අංක 25 ... හිස් පෙට්ටි.

තොග අංක 26 ... හිස් පෙට්ටි.

තොග අංක 27 ... කේබල් සහ කේබල් ඩ්‍රම්ස්.

තොග අංක 28 ... කේබල්, කැපැසිටර්ස් සහ ප්ලග්.

5–166—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

### යුද හමුදා මූලස්ථානය

පරිහරණයට නුසුදුසු රථවාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත දැක්වෙන පරිහරණයට නුසුදුසු රථවාහන හෝමාගම පනාගොඩ පිහිටි යුධෝපකරණ ගබඩාවේදී 1969 මැයි මස 25 වෙනි ඉරුදින පෙ. ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | මුළු ගණන |
|---|---|---|
| (අ) | පොඩ්සන් තෝමස් ලොරි ටොන් 3 | 9 |
| (ආ) | ඔස්ටින් ටොන් 1 1/2 | 3 |
| (ඇ) | තෝමස් මාටින් හාපර් | 3 |
| (ඈ) | විලීස් ජීප් | 3 |
| (ඉ) | විලීස් ජීප්ස් | 7 |

අණතුරට භාජනය වන ලද වාහන

| | | |
|---|---|---|
| (අ) | තෝමස් ට්රේඩර් ටොන් 4 | 1 |

2. අවසාන මිටි පහර පතිත වනවාත් සමග සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, එදිනම පස්වරු 4 ට පෙර මිළදී ගත් රථවාහන ඉවත් කර ගත යුතුයි.

3. මෙම රථවාහන ඉහත සඳහන් ස්ථානයෙහිදී 1969 මැයි මස 24 වෙනි දින පෙරවරු 9.30 සිට පස්වරු 4 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

ඇම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥාපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ,
1969 අප්‍රේල් මස 26 වන දින දී ය.

5–177—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසිය

පහත දැක්වෙන භාණ්ඩ 1969 මැයි මස 21 වෙනි බදාදා පෙ. ව. 9ට රේගුවේ නව ජැටියේ පිහිටි ගමන් බඩු කායඞාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ. ස්වර්ණාභරන සහ මැණික් ගල් පමණක් 1969.5.19 දින පස්වරු 1.30 සිට 4 දක්වා ද 1969.5.20 දින පෙ. ව. 9.30 සිට 12.30 හා ප. ව. 1.30 සිට 4 දක්වා ද සෝදිසි කල හැක. අනිකුත් භාණ්ඩ 1969.5.18 දින සාමාන්‍ය කායඞාල වේලාවන් හි දි සෝදිසි කළහැක.

2. සෑම විෂයකටම වෙන්දේසියෙන් පසු 50% බැගින් තැන්පත් මුදලක් ගෙවිය යුතුය. වෙන්දේසිය අනුමත කළ දිනය සිට, පෝය දින හා නිවාඩු දින හැර, දින තුනක් ඇතුලත බඩු නොගෙන ගිය හොත් එම බඩු නැවත වෙන්දේසි කරන අතර තැන්පත්ව ඇති මුදල රජසතු වන බව සැලකිය යුතුයි.

3. ලැයිස්තුවේ මුලින් ඇති ඔරලෝසුව ගත් තැනැත්තාට දෙවන ඔරලෝසුව ගැනීමට අවසර නැත.

(1) නිල්කැට, රතුකැට, ආරුනුල් වෛරෝඩි, දියමන්ති ආදි මැණික් ගල් විෂයන් 23.

(2) ස්වර්ණාභරන (සමහරක් මැණික් බැඳි) විෂයන් 38.

(3) ඔම්ගා කොන්ස්ටලේෂන් ඔටොමැටික් (දින ඇතුව).

(4) පොමාර් පුරුෂ අත්ඔරලෝසුවක්, (දින ඇතුව).

(5) මයික්‍රපෝනයක් හා ඇඩැප්ටරයක් සහිත මොඩල් ආර්කිව් 158 එස් නැෂනල් ටේප්රෙකෝඩරයක්.

(6) මොඩල් පීඑච් 500 කැනරි පොනොග්‍රාප් 1 ක්.

(7) ලිව්මන් බ්‍රෑන්ඩ් වෙද නලාවක්.

(8) ස්වර්ණාභරන සාදන්නන්ගේ කියත් තල ග්‍රෝස 6.

(9) රෙදිවියන මැෂින් කොටස්.

(10) ස්ත්‍රීන්ගේ අත් බෑග් 37 ක්.

(11) 100% ස්ටේන්ලස් ස්ටීල් අත් ඔරලෝසු පටි 539.

(12) අමෙරිකානු ඩැක්‍රෝන් ටයි 552.

(13) සාරි බෝඩර් පැකට් 6 ක් (අඟල් 1 1/2× යාර 36 රෝල් 5 ක් එක පැකට්ටුවක).

(14) ගෙස්ටෙට්නර් තීන්ත ටියුබ් දුසිම් දෙකක් සහ ගෙස්ටෙට්නර් ස්ටෙන්සිල් දු. 20 ක්.

(15) ස්වල්පයක් කිළිටු වෙලෝනා බැනියන් දුසිම් 12 ක්.

(16) කපු ටෙට්‍රොන්, නයිලෝන් ස්පෝට්ස් ෂර්ට් 82.

(17) ලෝහ මාල 600 ක්.

(18) යාඩ්ලිස් ලිප්ස්ටික් ටියුබ් 60 ක්.

(19) ඔඩොරෝනෝ සුවඳ කූරු 7 ක්.

(20) අත්බොත්තං සහ ක්ලිප් සෑට් 12 ක්.

(21) fපැං fපැං පවුඩර් කොම්පැක්ට් 12 ක්.

(22) බඩ්ලට් පවුඩර් සහ ලිප්ස්ටික් කොම්පැක්ට් 12 ක්.

(23) 'කී' බ්‍රෑන්ඩ් ලිප්ස්ටික් දුසිම් 5.

(24) රෙව්ලෝන් සුවඳ ස්ප්‍රේයර් 6.

(25) ෂෙකෝ 100% ස්ටේන්ලස් ස්ටීල් අත් ඔරලෝසු පටි 145.

(26) යුත් පවුන්ටන් පෑන් දුසිම් 10 ක්.

(27) සැන්ඩෝස් සේද ටයි 23 ක්.

(28) ටයි පින් 72 ක් සහ වෙනත් භාණ්ඩ.

එස්. ඒ. සැන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බී. ඕ. 148—2/69
ගමන් බඩු කායඞාලය,
කොළඹ, 1969.4.29.

5–193—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, (ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාරයේ) කඳාන ලය රෝහලේ පාවිච්චි කළ නොහැකි බඩු වෙන්දේසිය**

කඳාන ලය රෝහලේ තිබෙන පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් බඩු 1969 මැයි මස 25 දින පෙ. ව. 10.30 ට එම ස්ථානයේ දී (ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (1) කොන්සි පට්ටම් | ... | ... | 3 |
| (2) ඩෝල්ටන් වර්ගයේ වතුර පෙරන | | ... | 1 |
| (3) අල්මාරි | ... | ... | 1 |
| (4) කෑම අල්ලන බන්දේසි | ... | ... | 2 |
| (5) අත්පුටු | ... | ... | 2 |
| (6) රෙදි සෝදන යන්ත්‍ර | ... | ... | 2 |

2. විකුණන දිනට පෙර දින අ. භා. 3 සිට මෙම බඩු පරීක්ෂා කර බැලීමට ඉඩ ඇත.

3. මිලදී ගන්නා බඩු වෙනුවෙන් මුදල් ගෙවීම් එම ස්ථානයේදීම කළ යුතු අතර එදිනම සවස 4.30 ට කලින් එම බඩු ඉවත්කර ගත යුතුය.

ඒ. එම්. බී. රිචඩ්ස්,
ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාර අධිකාරි.

1969.4.21 වැනි දින,
කොළඹ 12 හිදීය.

5–87—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දව වෙන්දේසිය

කුලියාපිටිය අඩවියේ මානවල පරගහරුප්ප හා දීගල්ල යන මාර්ගාසන්න ගබඩාවල ඇති මිල්ල, වැලිපැන්න, කඩුම්බේරිය, වෙලන්, බක්මී, දෙල්, මූනමල්, හැඩවක යනාදියෙන් සමන්විත කඳන් 920 කින් යුත් ඝන අඩි 1099.01ක් 1969 මැයි මස 22 දින පෙරවරු 10ට කුලියාපිටිය අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසාභාර වන නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන්ට දව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා කුලියාපිටිය අඩවි වන නිළධාරි හෝ වයඹ දිසාභාර වන නිළධාරි විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිළධාරි,
කුරුණෑගල.

1969 අප්‍රේල් 7 දින,
කුරුණෑගල දිසාකැලෑ කාර්යාලයේදී.

5–157—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දව වෙන්දේසිය

කුලියාපිටිය අඩවියේ කන්කානියමුල්ල වෙලෙඹ අක්කර 50 හේ කොටසේ, මාර්ගාසන්න ගබඩාව, දික්කැලේ වැඩ බිම, අඩවි වන නිළධාරි කාර්යාලය, කුලියාපිටිය, මානවල, පරගහරුප්ප, හා දීගල්ල යන මාර්ගාසන්න ගබඩාවල ඇති මිල්ල, වැලිපැන්න, කඩුම්බේරිය, වෙලන්, බක්මී, දෙල් මූනමල් හැඩවක, මාරා යනාදියෙන් සමන්විත කඳන් 1495 කින් යුත් ඝන අඩි 11483.0 හා දර යාර 118 ක් 1969 මැයි 22 වැනි දින පෙ. ව. 10 ට කුලියාපිටිය අඩවි කැලෑ කාර්යාලයේ දී වයඹ දිසාභාර වන නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා කුලියාපිටිය අඩවි වන නිළධාරි හෝ වයඹ දිසාභාර වන නිළධාරි, කුරුණෑගල විමසිය හැක.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිළධාරි,
කුරුණෑගල.

1969.4.27,
කුරුණෑගල දිසාකැලෑ කාර්යාලයේදීය.

5–158—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව-බටහිර දිසාව-දැව වෙන්දේසිය

1. තොග 8කින් යුත් හොර, තිනිය, මිල්ල, කරවි, කීන, කටබොඩ හම්පැලද ඇටඹ, කැකුණ, ආරිද්ද නා ඉඹුල්, හුලංඉද්ද, කලං, අළුබෝ යනාදී වර්ගයන්ට අයත් කඳන් ඝන අඩි 1868.6ක්, තොග 1 කින් යුත් මිල්ල, කරවි, කීන යනාදී වර්ගයන්ට අයත් ඉරූ ලී ඝන අඩි 27.2 ක් සහ තොග 2 කින් යුත් සිල්පර 47ක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 69.5.31 දින පෙරවරු 10ට දෙහිඕවිට අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙම දැව මිටිපොල, අංහෙට්ටිගම, පොල්ගස්වත්ත සහ පාඩිඇල යන මාර්ගාසන්න දැව ගබඩාවලද, අවිස්සාවේල්ල දුම්රියාංගනයේ සහ මැරේකැලේ ඇත.

3. වෙන්දේසියේදී ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය හට එම දැව වෙන්දේසියට ප්‍රථම පරීක්ෂාකර බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳව හෝ දැව පිළිබඳව වැඩිදුර විස්තර දෙහිඕවිට අඩවි වන නිලධාරීගෙන් හෝ බස්නාහිර දිසාවන නිලධාරීගෙන් හෝ ලබා ගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දි. ව. නි.—බ. දි.

දිසා වන නිලධාරි කාර්යාලය,
ධර්මපාල මාවත,
රත්නපුර.
69. 4. 20.

5–159—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව-බටහිර දිසාව-දැව වෙන්දේසිය

තොග 3 කින් යුත් දුන්, කීන, හොර සහ සූරියමාරා කඳන් ඝන අඩි 726.3ක් තොග 1 කින් යුත් සිල්පර 2ක්, තොග 4 කින් යුත් කුඤ්ඤ කණු 618ක් බන්ඩි කියතක්, හරස් කියතක්, උදලු එකක් රූලර් එකක් සහ ලනුවක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 1969.5.24 දින පෙරවරු 10ට බලංගොඩ අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව සහ ආයුධ බොරන්ගමුව, දෙනගම හතරබාගේ යන මාර්ගාසන්න දැව ගබඩාවල, බලංගොඩ අඩවි වන නිලධාරි කාර්යාලයේ, බෙලිහුල්ඔය වන රක්ෂක නිවාසයේ සහ ඕපනායක දුම්රිය අංගනයේ ඇත.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය හට ඒ ඒ ද්‍රව්‍ය වෙන්දේසියට ප්‍රථම පරීක්ෂා කර බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර රත්නපුර දිසා වන නිලධාරිගෙන් හෝ බලංගොඩ අඩවි වන නිලධාරිගෙන් හෝ ලබා ගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දි. ව. නි.—බ. දි.

දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුර.

5–160—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව-බටහිර දිසාව-දැව වෙන්දේසිය

ඝන අඩි 10.6 කින් යුත් මිල්ල කඳන් තොග 1ක් සහ අඩි 5.0කින් යුත් කීන ඉරාපු ලෑලි තොග 1ක් සහ තොග 13 කින් යුත් 5.0 ඉරන කියත්, හරස් කියත්, පොරෝ වැ පිහියා දැත් අඬු සහ බන්ඩි කියත් යනාදී ද්‍රව්‍ය රාශියක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 69.5.30 දින පෙරවරු 10 ට මතුගම අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම ආයුධ සහ දැව මතුගම අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇත. ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය හට ඒ ඒ ද්‍රව්‍ය වෙන්දේසියට ප්‍රථම පරීක්ෂාකර බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳව වැඩි විස්තර රත්නපුර දිසා වන නිලධාරිගෙන් හෝ මතුගම අඩවි වන නිලධාරිගෙන් හෝ ලබා ගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දි. ව. නි.—බ. දි.

දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුර.

5–161—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බටහිර දිසාව

### දැව වෙන්දේසිය

තොග 32 කින් යුත් වැලිපියන්න, දාඹු, මලබොඩ, ආරිද්ද මිල්ල, පෙලෙන්, හැඩවක, අළුබෝ, කිරිහැඹිලිය, දුන්, හොර යනාදී වර්ගයන්ට අයත් කඳන් ඝන අඩි 2708.2 සහ තොග 2කින් යුත් හොර සහ මිල්ල ඉරූ ලී ඝන අඩි 143.6ක් සහ තොග 11කින් යුත් කියත්, පොඩි කුඩා, උදලු, විත්, පොරෝ, පීරි, පිහියා, ලනු සහ කැති රත්නපුර දිසා වන නිලධාරි විසින් 69. 5. 22 දින පෙරවරු 10ට රත්නපුර අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව ගිලීමලේ, කරවිට, තෙපුලන්ගොඩ, තලගලකන්ද යන මාර්ගාසන්න දැව ගබඩාවල සහ අනෙක් ද්‍රව්‍ය රත්නපුර අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇත.

ඉල්ලුම්කිරීමට බලාපොරොත්තු වන අය ප්‍රථමයෙන් ඒ ඒ ස්ථානවල ඇති දැව පරීක්ෂාකර බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර රත්නපුර අඩවි වන නිලධාරීගෙන් හෝ බස්නාහිර දිසා වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දිසා වන නිලධාරි, බටහිර දිසාව.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර.

5–162—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

මීරිගම අඩවියේ නා නා ස්ථානවල ඇති කොස්, හොර, ඇටහෙරලිය, බැදිදෙල් හා මිල්ල යනාදී කඳන් 30කින් යුත් ඝන අඩි 514.3ක් 1969 මැයි මස 24 දින පෙ. ව. 10 ට මීරිගම අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා මීරිගම අඩවි කැලෑ නිලධාරි හෝ වයඹ දිසාභාර වන නිලධාරි විමසන්න.

ජී. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරි,
කුරුණෑගල.

1969.4.7 දින,
කුරුණෑගල දිසා කැලෑ කාර්යාලයේදීය.

5–163—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

පාවිච්චියට නුසුදුසු පහත සඳහන් බඩු 1969 මැයි මස 22 වැනි දින පෙරවරු 9.00 ට මහනුවර පොලිස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ විකුණන බඩු විස්තර පහත පළ වේ :—

| | | |
|---|---|---|
| 1. | බෙරේ තොප්පිය ... | 3 |
| 2. | ඇඳුම් බුරුසු ... | 16 |
| 3. | සපත්තු බුරුසු ... | 9 |
| 4. | කැන්වස් සපත්තු කුට්ටම් | 125 |
| 5. | සට්ඨන තොප්පි ... | 10 |
| 6. | පාපැදි දම්වැල් ... | 1 |
| 7. | මුල්ලු ... ... | 1 |
| 8. | කාකි හට කබා ... | 65 |
| 9. | කාකි කැලෑ කබා ... | 65 |
| 10. | කාකි කොට කලිසම් ... | 125 |
| 11. | මුලුතැන් ගේ පිහියා ... | 3 |
| 12. | කාකි මේස් කුට්ටම් ... | 1 |
| 13. | හම් පටි ... | 30 |
| 14. | උණ්ඩ උර ... | 30 |
| 15. | බූට් සපත්තු ... | 70 |
| 16. | මැගපෝන් ... | 5 |
| 17. | කොහු මෙට්ට ... | 50 |
| 18. | උදලු ... | 2 |
| 19. | ඉබි යතුරු ... | 86 |
| 20. | හෝස් පයිප්ප කෑලි ... | 2 |
| 21. | කැප් තොප්පි ... | 2 |
| 22. | දිග කලිසම් ... | 16 |
| 23. | ඔතන පටි ජෝඩු ... | 25 |
| 24. | පැට්රෝ මැක්ස් ලාම්පු ... | 2 |
| 25. | කාකි වැහිකබා ... | 12 |
| 26. | කළු වැහි කබා ... | 15 |
| 27. | රබර් වැහි කබා ... | 3 |
| 28. | ඇල තොප්පි ... | 125 |
| 29. | දිග මේස් කුට්ටම ... | 15 |
| 30. | වැහි කබා පටි ... | 15 |
| 31. | හම් සපත්තු කුට්ටම් ... | 700 |
| 32. | දුර මනින පටි ... | 2 |
| 33. | මේස ලාම්පු ... | 5 |
| 34. | හිස් ගැලුම් ටින් ... | 5 |
| 35. | ප්‍රථමාධාර වෙලුම් පටි | 10 |
| 36. | පාපැදි ටියුබ ... | 2 |
| 37. | ගැලුමේ මිම් ... | 1 |
| 38. | පුනීල ... | 2 |
| 39. | රෝලේ පාපැදි ... | 5 |
| 40. | බිත්ති ඔර්ලෝසු කළු ... | 1 |
| 41. | ඇඳුම් කට්ටල් පලස් ... | 30 |
| 42. | කැඩුන ලී ඇඳන් ... | 1 |
| 43. | ලන්තෑරුම් ... | 1 |
| 44. | ගුවන් විදුලි යන්ත්‍ර (දෙපා :) | 1 |
| 45. | බ්ලැන්කෝට්ටු ... | 9 |
| 46. | අත් මේස් ... | 3 |
| 47. | ස්වෙටර්ස් ... | 9 |
| 48. | ලංකා සිතියම් ... | 1 |
| 49. | පාපැදි ලාම්පු ... | 1 |
| 50. | ලී බන්දේසි ... | 2 |
| 51. | තීන්ත කූඩු ... | 4 |
| 52. | පුටු ... | 2 |
| 53. | තීන්ත කූඩු රාක්ක ... | 1 |
| 54. | විශේෂ පොලිස් යෂ්ටි කැබලි | 9 |
| 55. | ඉනිමං ... | 2 |
| 56. | කැරම් බෝඩ් (දෙපා:) ... | 1 |
| 57. | බඳින තාච්චි ... | 1 |

වෙන්දේසියට පෙර දිනක මහනුවර පොලිස්ථානයේ බඩු ගබඩාවේ දී මෙම බඩු පරීක්ෂා කර බැලිය හැකිය. වෙන්දේසිය අවසාන වූ විගසම මුදල් ගෙවීම සහ බඩු ඉවත් කර ගැනීම කළ යුතු ය.

පොලිස් අධිකාරි, මධ්‍යම පළාත (උතුර).

1969 අප්‍රේල් 22 දින,
මහනුවර පොලිස් කාර්යාල යේ දී ය.

5–32—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## නගර සහ ගම් නැවත නම්කිරීම

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරලේ බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 10 දරණ ඉඳුරුව ග්‍රාම සේවක කොට්ඨාශය තුළ පිහිටි "ඔලීගොඩ" නමින් හැඳින්වෙන ගමෙහි නම "මැදගොඩ" යනුවෙන් වෙනස්කොට නැවත නම්කරන ලෙස ඉල්ලීමක් කර ඇත. එබැවින් එකී "ඔලීගොඩ" නමැති ගම "මැදගොඩ" යනුවෙන් නැවත නම්කිරීම ගැන මහජනයාගේ අදහස් 1969 මැයි මස 30 වැනි දින දක්වා මා විසින් භාරගන්නා බව මින් දන්වමි. මේ සඳහා වෙනත් යෝජනා ඉදිරිපත් කරන්නේ නම් එම යෝජනාවලට ඉවහල්වන සම්පූර්ණ හේතු දැක්විය යුතු අතර එම යෝජනාද ඉහතකී දිනට පෙර මා වෙත එවිය යුතුය.

පී. ඒ ටී. ගුණසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969 අප්‍රේල් මස 26 වැනි දින,
ගාලු කච්චේරියේ දී ය.

5–109—69.5.9 දින අංක 14,853 දරන ගැසට් පත්‍රය

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශොධිත ගාස්තු**

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත **සම්පූර්ණ** ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11.** **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. **68.12.1** දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | පිටරට |
|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් | ... | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. |
| (අ) | i | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් | 0 50 | ... | 0 20 |
| | ii | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 0 | ... | 0 20 |
| (ආ) | i | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |
| | ii | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ළවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 30. 4.69 | බදාද | ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | ... | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | | 15. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 30. 5.69 | සිකුරාද | ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | ... | 6. 6.69 | සිකුරාද | ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 13. 6.69 | සිකුරාද | ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27. 6.69 | සිකුරාද | ... | 20. 6.69 | සිකුරාද | ප.ව | 3.30 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.